# 2012 වර්ෂය සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව


| පටුන | පිටු අංකය |
|---|---|
| ගරු ඇමතිතුමා වෙත ඉදිරිපත් කිරීමේ ලිපිය | **02** |
| වාර්ෂික වාර්තාව | **03** |
| මූල්‍ය වාර්තා | **81** |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | **109** |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා සභාපතිතුමාගේ නිරීක්ෂණ | **123** |

පරමාණුක ශක්ති අධිකාරිය
60/460, බේස්ලයින් පාර,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය
28.07.2014

තාක්ෂණ හා පර්යේෂණ ගරු ඇමතිතුමා,
තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය,
කොළඹ.

ගරු ඇමතිතුමනි,

**<u>2012 ජනවාරි 01 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය</u>**

**<u>සඳහා වූ පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව.</u>**

1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරී පනතේ 34 වගන්තිය ප්‍රකාර 2012 වර්ෂය සඳහා වූ පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව.

අ  විගණනය කරන ලද ආදායම් හා වියදම් ගිණුමේ පිටපතක්,

ආ  විගණනය කරන ලද ශේෂ පත්‍රයේ පිටපතක් හා

ඇ  විගණකාධිපතිගේ වාර්තාවද

සමඟ ඔබතුමා වෙත ගෞරවයෙන් ඉදිරිපත් කරමි.

මෙයට, විශ්වාසී,

ආචාර්ය රංජිත් විජයවර්ධන.
සභාපති,
<u>පරමාණුක ශක්ති අධිකාරිය</u>

# වාර්ෂික වාර්තාව -2012



## පරමාණුක ශක්ති අධිකාරිය

**“සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් සඳහා න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදීම්**

**ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතනය.....................”**

අංක. 60/460, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත,

වැල්ලම්පිටිය

දුරකථන: 2533427-8, 2533449  Fax :2533448

විද්‍යුත් තැපැල: officialmail@aea.gov.lk

## පරමාණුක ශක්ති අධිකාරිය පිළිබඳව.......................

1969 අංක 19 දරණ පරමාණුක ශක්ති අධිකාරි (ප.ශ.අ) පනත මගින් ශ්‍රී ලංකාවේ පරමාණුක ශක්ති අධිකාරිය ස්ථාපනය කරන ලදි.

අපගේ දැක්ම ,

ජාතික අවශ්‍යතාවයන්ට අනුකූල ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත විකිරණ ආරක්ෂාව පෙරටු කොට ගත් ප්‍රශස්ත මට්ටමේ න්‍යෂ්ටික මධ්‍යස්ථානයක් බවට පත්වීමයි.

අපගේ මෙහෙවරයන් වන්නේ ,

- ජාතික - සමාජ - ආර්ථික සංවර්ධනය උදෙසා න්‍යෂ්ටික තාක්ෂණය යෙදවීම.
- අයනීකරණ විකිරණවලින් සිදුවිය හැකි අහිතකර බලපෑම්වලින් මහජනතාව , විකිරණ සේවකයන් හා පරිසරය ආරක්ෂා කිරීම සහතික කරනු වස්, නීති රෙගුලාසි සම්පාදනය හා ක්‍රියාවේ යෙදවීම.

## අධ්‍යක්ෂ මණ්ඩලය

1969 අංක 19 දරණ පාර්ලිමේන්තු පනතේ 2(2) වගන්තිය ප්‍රකාරව පරමාණුක ශක්ති අධිකාරිය අධක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වේ. 2012 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පහතින් දැක්වේ.

1. ආචාර්ය රංජිත් එල් විජයවර්ධන මහතා (සභාපති)
   බී.එස්.සී. (ගෞරව-පළමු පන්තියේ සාමාර්ථය භෞතික විද්‍යාව) එම්.එස්.සී. (භෞතික විද්‍යාව), පී.එච්.ඩී., ප්‍රායෝගික අධිශක්ති භෞතික විද්‍යාව -(ඇමරිකා එක්සත් ජනපදය)
   ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

2. මහාචාර්ය ඩබ්.අභයවික්‍රම මහතා - සාමාජික - බී.එස්.සී. ව්‍යවහාරික විද්‍යාව, ශ්‍රී ජපුර, බී.එස්.සී. (මහිඩොල් විශ්ව විද්‍යාලය , බැංකොක් ), පී.එච්.ඩී (ලිවර්පූල් විශ්ව විද්‍යාලය, මහා බ්‍රිතාන්‍ය,)

   මහාචාර්ය, පරපෝෂී විද්‍යාව, පරපෝෂී විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය.

3. මහාචාර්ය බී.එම්.ඒ ඔස්වින් පෙරේරා මහතා - (සාමාජික) පශු වෛද්‍ය විද්‍යා උපාධිය ,පී.එච්.ඩී (ග්ලාස්ගව්)

   ( 2011 වනතුරු මහාචාර්ය, ගොවිපොළ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය පිළිබඳ දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්ව විද්‍යාලය)

4. ඉංජිනේරු එම්.ජී.ඒ. ගුණතිලක මහතා (සාමාජික), බී.එස්.සී (ඉංජිනේරු),ගුඩ්අයිඊඊයූඑස්ටී, එම්.බී.ඒ. (ශ්‍රී ජ'පුර), එම්.අයි.ඊ.(ශ්‍රී ලංකා), සී ඉංජිනේරු, ජාත්‍යන්තර කටයුතු පිළිබද ඩිප්ලෝමාව, එම්අයිඊඊඊ

   (අධ්‍යක්ෂ (තාක්ෂණික), විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශය)

5. වෛද්‍ය එන්.ජේ අභයගුණවර්ධන මහතා -(සාමාජික)

   එම්.බී.බී. එස් , එම්.ඩී (විකිරණවේදී)

   (විශේෂඥ වෛද්‍ය - විකිරණවේදී)

6. මහාචාර්ය ජනිතා අබේවික්‍රම ලියනගේ මහත්මිය (සාමාජික) - බී.එස්.සී. (විශේෂ) රසායන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය, පී.එච්.ඩී. (රසායන විද්‍යාව), රසායනික විද්‍යා දෙපාර්තමේන්තුව කැළණිය විශ්ව විද්‍යාලය

7. ආර් උඩුවාවල මහතා (සාමාජික) - බී.එස්.සී.ගෞරව-(භෞතික විද්‍යාව), ආයතනික නායකත්ව පිළිබඳ එම්.එස්.සී. (මොනෑෂ් විශ්ව විද්‍යාලය)

   අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව , මුදල් හා ක්‍රම සම්පාදක අමාත්‍යාංශය

8. පසන් ගුණසේන මහතා (සාමාජික)

   නීතිඥ

2012 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11ක් පවත්වන ලදි. ප්‍රතිපත්තිමය තීරණවලට එළඹීම සඳහා අධිකාරියේ ක්‍රියාකාරකම්, කාර්යය මණ්ඩලය පිළිබඳ කරුණු, මූල්‍ය හා පරිපාලන කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලදි. අධිකාරියේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිබඳවද අධ්‍යක්ෂක මණ්ඩලය සමාලෝචනය කලේය.

## ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මණ්ඩලය

| නම | තනතුර | සුදුසුකම් |
|---|---|---|
| ජේ.එම්.ඒ.සී. ජයසිංහ මහතා | විධායක අධ්‍යක්ෂ<br>01.01.2012 -30.06.2012 | බී.එස්.සී. (කොළඹ වි.වි.)<br>එම්.එස්.සී. (නිව්සවුත්වේල්ස් වි.වි.) |
| එච්.ජී.පී. කරුණාරත්න මහතා | අංශ ප්‍රධාන, ජාත්‍යන්තර හා මිනිස් සම්පත් අංශය | බී.ඒ.ඩී.(කොළඹ වි. වි.)<br>ඩී.බී.එම්. (එන්.අයි.බී.එම්) |
| ඩී.ජී.එල්. වික්‍රමනායක මහතා | අංශ ප්‍රධාන, කාර්මික යෙදුම් අංශය හා 15.09.2012 සිට 31.12.2012 දක්වා වැඩ බලන අධ්‍යක්ෂ | බී.එස්.සී.,එම්.එස්.සී.(කොළඹ වි.වි.)<br>එම්.එස්.සී. (මහා බ්‍රිතාන්‍ය) |
| සී. කාසිගේ මහතා | අංශ ප්‍රධාන, සාමාන්‍ය විද්‍යාත්මක අංශය | බී.එස්.සී (පේරාදෙණිය වි.වි.)<br>එම්.එස්.සී. (කොළඹ වි.වි.) |
| එච්. එල්. අනිල් රංජිත් මහතා | අංශ ප්‍රධාන, විකිරණ ආරක්ෂණ අංශය | බී.එස්.සී , එම්.එස්.සී. (කොළඹ වි.වි.) |
| එච්.එම්.පී. විජේසේකර මහතා | අංශ ප්‍රධාන, මුල්‍ය හා සැපයුම් අංශය | වරලත් ගණකාධිකරණ ආවසරික සහතිකය, ඩී.බී.එම්. (එන්.අයි.බී.එම්) |
| 1.එම්.සී.එස්. සෙනෙවිරත්න මිය<br>2. වජිර වඩුගේ මහතා | අංශ ප්‍රධාන, ජෛව විද්‍යා අංශය | බී.එස්.සී. (ශ්‍රී'ජපුර වි.වි.)<br>එම්.එස්.සී. (කොළඹ වි.වි.)<br>බී.එස්.සී (පේරාදෙණිය වි.වි.)<br>එම්.එස්.සී. (කොළඹ වි.වි.) |

## විධායක සාරාංශය

2012 වර්ෂය සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි. පසුගිය වසරවලට සාපේක්ෂව අධිකාරියේ සේවක සංඛ්‍යාව වැඩි වූ අතර 31.12.2012 වර්ෂය අවසාන වන විට මුළු සේවක සංඛ්‍යාව 112 ක් විය.

22.06.2011 වසරේ දී පරමාණුක ශක්ති අධිකාරිය සඳහා නව පනතක් කෙටුම්පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුන අතර මෙමගින් ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට අනුව අධිකාරියේ නියාමන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට හැකියාව ලැබේ. මෙම නව පනතට අනුකූලව විකිරණ ආරක්ෂණය, න්‍යෂ්ටික ආරක්ෂාව,විකිරණශීලි ද්‍රව්‍ය ප්‍රවාහනය හා විකිරණශීලි අපද්‍රව්‍ය අපහරණය හා කළමණාකරණය යන කරුණු නවතම ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුකළ හැකිවන ආකාරයට මෙම පනත කෙටුම්පත් කිරීමට අධිකාරිය විසින් තාක්ෂණික කමිටුවක් පත් කරන ලදි.

මෙම කෙටුම්පත ගැන සලකා බැලීමට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයෙන් විශේෂඥයකු ලබා දුන් අතර මේ සම්බන්ධයෙන් දින දෙකක වැඩමුළුවක් අදාල නිළධාරීන් සමග පවත්වන ලදි.මෙහිදී අදාල පාර්ශව දෙක අතර එකඟතාවයට පැමිණ සමහර කරුණු කෙටුම්පතට ඇතුලත් කෙරිණි.මෙය

නීතිපති වරයාට භාර දුන් අතර නීතිපති දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි අධිකාරියේ අදාල නිළධාරීන් එම දෙපාර්තමේන්තුවේ නීතිඥයන් සමග, මෙම පනතේ විද්‍යාත්මක පදනම සම්බන්ධව සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදි. මෙම ක්‍රියාවලිය අවසන් වූ අතර කෙටුම්පත නැවත අධිකාරියට 2012 ඔක්තෝම්බර් 19 දින ලැබුණි. පනත අනුමැතිය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2013 මාර්තු අවසන් වීමට ප්‍රථම මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

2012 වසර සඳහා අධිකාරියේ ක්‍රියාකාරකම් පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ දක්වා ඇත.

අ) විකිරණ ආරක්ෂණය

ආ) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ක්‍රියාකාරකම්

ඇ) න්‍යෂ්ටික උපකරණ නඩත්තුව හා ක්‍රමාංකනය

ඈ) නිර්විනාශක පරීක්ෂණ

ඉ) විකිරණ පිරිසැකසුම් තාක්ෂණය

ඊ) න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා

උ) සමස්ථානික ජල විද්‍යාව

ඌ) විඥාපන සේවා

එ) මිනිස් සම්පත් සංවර්ධනය

විකිරණ ප්‍රභව හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන රාජ්‍ය හා පුද්ගලික ආයතන වල නිරන්තර අධීක්ෂණ පවත්වමින් එම ස්ථාන වල විකිරණ ආරක්ෂණ කටයුතු සිදුකරන ලදි. විකිරණශීලී ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ උපකරණ (වෛද්‍ය එක්ස් කිරණ යන්ත්‍ර ඇතුළුව) භාවිත කරන්නන් ඒ සඳහා අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතු අතර 2012 වසරේ දී මෙවන් බලපත්‍ර 278 ක් නිකුත් කරන ලදි. මීට අමතරව විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය කිරීමට අධිකාරියේ අනුමැතිය ලබාගත යුතු අතර 2012 වසරේ දී මේ සඳහා දෙන ලද බලය පැවරීම් සංඛ්‍යාව 474 කි. විකිරණශීලී ද්‍රව්‍ය හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන ස්ථාන අධීක්ෂණය පරමාණුක ශක්ති අධිකාරියේ කාර්යය භාරයක් වන අතර 2012 වසරේදී මෙවන් ස්ථාන 140 ක් අධීක්ෂණ සිදු කරන ලදි. අධිකාරිය විසින් අධීක්ෂණයෙන් අනතුරුව කළ යුතු වෙනස්කම් ඉදිරිපත් කළ පසු, එම වෙනස්කම් වලට අනුකූලව ප්‍රවිකිරණ කාමර වෙනස් කිරීමෙන් අනතුරුව ඒවා නිරීක්ෂණය කර එවන් කාමර 63 ක් සඳහා අනුමැතිය දෙන ලදි.

අධිකාරියට හා බාහිර ආයතනවලට අයත් විකිරණ මනින උපකරණ 65 ක් ක්‍රමාංකනය කරන ලදි. විකිරණශීලී ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ යන්ත්‍ර භාවිතා කරමින් දෛනික රාජකාරී කටයුතු වල නියැලී සිටින විකිරණ සේවකයන් 1098 දෙනෙකු සඳහා අධිකාරිය මගින් පවත්වාගෙන යන පුද්ගල විකිරණ මිතික සේවාව සපයන ලදි. මෘදුකාංග හා දෘඩාංග නඩත්තු කිරීම/ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම, පරිගණක හා අන්තර්ජාල සම්බන්ධ කටයුතු සඳහා සේවාවන් 112ක්, අධිකාරියට සපයන ලදි. න්‍යෂ්ටික උපකරණ අළුත්වැඩියා කිරීම ඒවායේ මෘදුකාංග පිළිබඳ සේවාවන් 48 ක් ද සපයන ලදී.
කාර්මික ක්ෂේත්‍රයට නිර්විනාශක පරීක්ෂණ අධීක්ෂණ සේවා ලබා දෙමින් එම යන්ත්‍ර වලින් ලබාගන්නා සේවාවල ඵලදායිතාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය සේවා 130 ක් ලබා දෙන ලදී. මෙමගින් යන්ත්‍ර සූත්‍ර වල ක්‍රියාකාරීත්වය තහවුරු කරන අතර කාර්මික ක්ෂේත්‍රයේ බිඳ වැටීම් වැළකේ. මීට අමතරව නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණය පිළිබඳ පුද්ගලයන් 210 ක් පුහුණු කරන ලදී. නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු දිගටම සිදුකරන ලදි.

විකිරණශීලීතාව සඳහා සාම්පල 7000 ක් විශ්ලේෂණය කරන ලදි.

ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා මිනිස් බල පුහුණුව අත්‍යවශ්‍ය වේ. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ , ජපන් හා කොරියානු රාජ්‍යයන් වල ආධාරයෙන් ශ්‍රී ලංකාවේ විශේෂඥයන්ගේ තාක්ෂණික හැකියාවන් (න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳව) වැඩි දියුණු කිරීමට විශේෂඥ සේවාවන් (17) අධිශිෂ්‍යත්ව , විද්‍යාත්මක චාරිකා (03) හා එතෙර කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා විද්‍යාඥයන් 110 දෙනෙකුට සහභාගී වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී. මීට අමතරව අධිකාරියේ පරිපාලන හා අනෙකුත් විද්‍යාත්මක නොවන සේවක මණ්ඩලයේ සාමාජිකයන් සඳහා අධිකාරියේදී මෙන්ම බාහිර ආයතන වලදී පුහුණුවීම් ලබා දෙන ලදී.

## 1. විගණන හා කළමණාකරන කමිටු වාර්තාව -2012

මෙම විගණන කමිටුව මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 14.12.2010 දිනැති අංක 55 දරණ පී. ඊ. ඩී. චක්‍රලේඛය අනුව සැදී ඇත.

2012 වසර සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ විගණ හා කළමණාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයන් ගෙන් සමන්විත විය.

අ) ආර් උඩුවාවල මහතා (මහා භාණ්ඩාගාර නියෝජිත) විගණන හා කළමණාකරණ කමිටු සභාපති

ආ) මහාචාර්ය ජේ. අබේවික්‍රම ලියනගේ මහත්මිය (සාමාජික)

ඇ) වෛද්‍ය එන්.ජේ. අබේගුණවර්ධන මහතා (සාමාජික)

ඇ) මහාචාර්ය බී.එම්.ජ්. ඕ. පෙරේරා මහතා (ඉහත සාමාජිකයන් ගෙන් අයෙක් නොපැමිණි විට ඒ සඳහා නියෝජිත)

ඉහත සඳහන් සාමාජිකයන් පරමාණුක ශක්ති අධිකාරියේ විධායක නොවන අධ්‍යක්ෂ වරුන් වන අතර විද්‍යාත්මක, නීතිමය හා කළමණාකරණ ක්ෂේත්‍ර පිළිබඳ මනා පළපුරුද්දක් දරති. අභ්‍යන්තර විගණක කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා වන විගණන අධිකාරී කේ.ජී.පී. ඩබ්. ගමගේ මහතා නිරීක්ෂක ලෙස කමිටු රැස්වීම්වලට සහභාගිවිය.

### 1.2. කමිටුවේ රැස්වීම්

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුකූලව විගණන හා කළමණාකාර කමිටු රැස්වීම් පවත්වන ලදී.

2012 මූල්‍ය වසරේදී පහත සඳහන් දිනවලදී රැස්වීම් 4ක් පැවැත්විණි

2012 පෙබරවාරි මස 14

2012 මැයි මස 15

2012 ජූලි මස 30 හා 2012 දෙසැම්බර් මස 18

### 1.3. කමිටුවේ අරමුණු

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 14.12.2010 දිනැති පීඊඩීචක්‍රලේඛ 55 ට අනුකූලව හා එම දෙපාර්තමේන්තුවේ යහ පාලනය පිළිබඳ මග පෙන්වීමට අනුව විගණන කමිටුව විසින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට උපරිම උත්සාහය දරන ලදී.

අ). අභ්‍යන්තර විගණකවරුන්ගේ අඛණ්ඩ අපක්ෂපාතීත්වය හා කාර්යක්ෂමතාවය සමාලෝචනය

ආ). අභ්‍යන්තර විගණන සැලැස්ම පිළිබදව අභ්‍යන්තර විගණක විසින් මතු කරන ලද කරුණු පිළිබඳව අඛණ්ඩව සලකා බැලීම.

ඇ). මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා ගණකාධිකාරී හා විගණන ප්‍රමිති වලට අනුකූලව හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලව සිදු කරන බව ස්ථිර කර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහායවීම.

ඇ). රජය විසින් නිකුත් කරන ලද සියළු නීති, රෙගුලාසි හා චක්‍රලේඛ අදාල ආකාරයට යොදා ගන්නා බව නිරන්තරව සමාලෝචනය හා අධීක්ෂණය කරමින් ඒවාට පටහැනි වූ විට ඒ පිළිබඳව අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර මින් අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම.

ඉ). අභ්‍යන්තර විගණන වාර්තා/ බාහිර විගණන වාර්තා, කළමණාකරන ලිපි හා කෝප් නිර්දේශ සමාලෝචනය කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය පියවර ගැනීමට සහාය වීම

ඊ). අභ්‍යන්තර පාලක පද්ධති හඳුන්වා දීමට හා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම

උ). විගණන කමිටු රැස්වීම අවසන් වීමෙන් , ඊට අනතුරුව එහි නිර්දේශයන් හා වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරමින් නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට ඊට සහාය වීම.

1.4. වසරේදී විගණන කමිටුවේ ක්‍රියාකාරකම්

1.4.1. විගණන කමිටුව විසින් 2012 වසර සඳහා වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර අවසන් කරන ලදි.

1.4.2. පෙර පවත්වන ලද කමිටු රැස්වීම් වලදී ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ කමිටු සමාලෝචනය කරන ලදී. විශේෂයෙන්

- විද්‍යාත්මක උපකරණ සඳහා වට්ටෝරු භාණ්ඩ ලේඛණය සැදීම පිළිබඳ ප්‍රගතිය
- ආදායම හා ණයගැතියන් පිළිබඳ විගණනය හා පාලනය සඳහා මෘදුකාංග කට්ටලයක් ලබාගැනීම පිළිබද ප්‍රගතිය.
- වාහන නඩත්තු කිරීම පිළිබද දක්වන දුර්වලතා මඟ හරවා ගැණීමට අවශ්‍ය පාලන ක්‍රම වේදයක් ශක්තිමත්ව සැකසීම පිළිබඳව උපදෙස් දෙන ලදි.
- විගණන දුර්වලතා
- විද්‍යාත්මක පාරිභෝගික ද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝගික ද්‍රව්‍ය පිළිබඳ තොග වාර්තා පවත්වා ගෙන යාම පිළිබඳ ප්‍රගතිය.

1.4.3. ගෙවීම් වවුචර් හා මුදල් මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ගෙවීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය කළ කමිටුව අධිකාරියේ සභාපතිවරයා විසින් යෝජනා කරන ලද ආකාරයට සුදුසු අත්තිකාරම් ගෙවීමේ ක්‍රම වේදයක් ඇති කිරීමෙන් නැවත නැවතත් දුර්වලතා ඇතිවීම වැලකීමට නිර්දේශ කරන ලදී.

1.4.4. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව බොල් ණය කපා හැරීමට / ඒ සඳහා වෙන් කිරීමක් කිරීමට, නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලෙස විගණන කමිටුව නිර්දේශ කලේය.

1.4.5. අපහරණය කරන අයිතම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව සමාලෝචනය කළ කමිටුව ඒ පිළිබඳව පවතින අඩු ලුහුඬුකම් සඳහා ගන්නා ලද පියවර හා එහි ප්‍රගතිය වාර්තා කරන ලෙස දන්වා සිටියේය.

1.4.6. අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු පියවා එමගින් එම අංශය ශක්තිමත් කිරීමට කමිටුව නිර්දේශ කලේය.

1.4.7. අභ්‍යන්තර විගණන වාර්තාවේ සඳහන් අතිකාල හා සති අන්ත ගෙවීම් පිළිබඳ ඇති දුර්වලතා සළකා බැලූ කමිටුව ආයතන සංග්‍රයේ හා අදාල චක්‍රලේඛ වලට අනුකූලව එම ගෙවීම් සිදුකිරීම පිළිබඳව වාර්තාවක් සකසන ලෙස දන්වා සිටියේය.

1.4.8. අභ්‍යන්තර විගණන වාර්තාවේ සඳහන් මුදල් වල විගණන ක්‍රමවේදයේ / චෙක් ලැබීම් වල දුර්වලතා සලකා බැලු කමිටුව මෙම ක්‍රමවේදයන් මීට වඩා විනිවිද විය යුතු බවත් එම කාර්යයන් අදාළ නිළධාරියාගේ ඍජු අධීක්ෂණය යටතේ සිදුවිය යුතු බවත් දන්වන ලදී.

1.4.9. 2011 වසර සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවට ලබා දී ඇති පිළිතුරු සලකා බැලූ විගණන කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

- විගණකාධිපති වරයාගේ ප්‍රශ්ණ වලට දෙන ලද සියළුම පිළිතුරු නැවත සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් / නිවැරදි කිරීම් ඇතුලත් කරන ලදි. සංශෝධිත පිළිතුරු විගණකාධිපති වරයාට ඉදිරිපත් කරන ලෙසද නිර්දේශ කෙරිනි.

- අභ්‍යන්තර විගණකගේ රාජකාරී හා එම රාජකාරී වලට අමතරව වෙනත් රාජකාරී වල අභ්‍යන්තර විගණක යෙදවීම, පිළිබඳ සලකා බැලු විගණන කමිටුව විදුලිබල හා බල ශක්ති අමාත්‍යංශයෙන් උපාධිධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය යටතේ නිළධාරීන් දෙදෙනෙකු ලබා ගෙන බඳවා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි.

1.4.10. අර්ථ සාධක අරමුදලේ කොමසාරිස් වරයා වෙත ලිපියක් යවා ලිඛිතව දැනට පවතින අර්ථ සාධක අරමුදලේ අනුපාතය පිළිබඳ නිවැරදි කිරීමක් ලබා ගන්නා ලෙස කමිටු සාමජිකයන් හට දන්වන ලදි.2011 මැයි 26 වෙනි දින සිට අධිකාරියේ අධ්‍යාක්ෂ මණ්ඩලය නව අර්ථ සාධක අනුපාතයක් යොදා ගැනීමට තීරණය කරන ලදි. (COPE රැස්වීම දිනය හා අදාල නිර්දේශය අනුව ක්‍රියාත්මක කරන ලදි)

ආර්. උඩුවාවල මහතා
සභාපති,
විගණන හා කළමණාකරණ කමිටුව

# 2.විකිරණ ආරක්ෂණ අංශය

## 2.1 නියාමන යටිතල පහසුකම් සංවර්ධනය

### 2.1.1. පරමාණුක ශක්ති අධිකාරිය සඳහා නව පනත

- ❖ 22.06.2011 දින පරමාණුක ශක්ති අධිකාරිය සඳහා නව පනතක් කෙටුම්පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුන අතර මෙමඟින් ජාත්‍යන්තර

අවශ්‍යතාවයන්ට අනුව අධිකාරියේ නියාමන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට හැකියාව ලැබේ. විකිරණ ආරක්ෂණය, න්‍යෂ්ටික ආරක්ෂාව,විකිරණශීලි ද්‍රව්‍ය ප්‍රවාහනයේ හා විකිරණශීලි අපද්‍රව්‍ය අපහරණය හා කළමණාකරණය යන කරුණු

නවතම ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට අනුකූලව සිදුකළ හැකිවන ආකාරයට මෙම පනත කෙටුම්පත් කිරීමට අධිකාරිය විසින් තාක්ෂණික කමිටුවක් පත් කරන ලදි.

මෙම කෙටුම්පත ගැන සලකා බැලීමට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයෙන් විශේෂඥයකු ලබා දුන් අතර මේ සම්බන්ධයෙන් දින දෙකක වැඩමුළුවක් අදාළ නිළධාරීන් සමග පවත්වන ලදි.මෙහිදී අදාල පාර්ශව දෙක අතර එකගතාවයට පැමිණි සමහර කරුණු කෙටුම්පතට ඇතුලත් කෙරිණි.මෙය නීතිපති වරයාට භාර දුන් අතර නීතිපති දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි අධිකාරියේ අදාල නිළධාරීන් එම දෙපාර්තමේන්තුවේ නීතිඥයන් සමග, මෙම පනතේ විද්‍යාත්මක පදනම සම්බන්ධව සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදි. මෙම ක්‍රියාවලිය අවසන් වූ අතර කෙටුම්පත නැවත අධිකාරියට 2012 ඔක්තෝම්බර් 19 දින ලැබුණි. පනත අනුමැතිය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර 2013 මාර්තු අවසන් වීමට ප්‍රථම මෙය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

## 2.1.2. කාර්මික විකිරණරේඛය පිළිබඳ අත්පොත

- “කාර්මික විකිරණරේඛයේදී අනුගමනය කල යුතු ආරක්ෂක ක්‍රමවේදයන්” පිළිබඳ අත්පොතේ අවසාන කෙටුම්පත විකිරණ ආරක්ෂණ අංශය මගින් පිළියෙල කරන ලදුව පිටපත් 500 ක් මුද්‍රණය කොට බලපත්‍ර ලාභීන්ට නියාමන අවශ්‍යතාවයන් පිළිබඳව ඔවුන්ගේ දැනුම වැඩි කිරීමට හා විකිරණ සේවකයන්ගේ ආරක්ෂාව සඳහා ඔවුන් දැනුවත් කිරීමට, බෙදා හැරීමට නියමිතය.



### 2.1.3. හදිසි විකිරණ අනතුරක දී ප්‍රතිචාර දැක්වීම සඳහා පෙර සූදානම පිළිබඳ ජාතික සැලැස්ම

- ❖ හදිසි විකිරණ අනතුරක දී ප්‍රතිචාර දැක්වීමට හා ඊට පෙර සූදානම් වීම පිළිබඳ ජාතික සැලැස්මක් (Rad Plan) අධිකාරිය විසින් සකසා ඇත. මෙම සැලැස්ම ආපදා කළමණාකරණ කේන්ද්‍රයේ නිළධාරීන් සමග සාකච්ඡාවට භාජනය කරන ලදි. මෙම දළ කෙටුම්පත පිළිබඳව අදාළ නිළධාරීන් සමග සාකච්ඡා කිරීමට එක් දින වැඩමුළුවක් පවත්වන ලදී. සාකච්ඡාවේදී මතුවූ කරුණු අන්තර්ගත කරමින් මෙම සැලැස්ම සැකසෙමින් පවතී.

## 2.2. අපද්‍රව්‍ය සංචිත කිරීමේ මධ්‍යම පහසුකම වැඩි දියුණු කිරීම

- ❖ ඇමරිකාවේ ජීටීආර්අයි ආයතනයේ වැඩ සටහන යටතේ ලැබූ තාක්ෂණික සහාය යොදාගෙනඅධිකාරියේ අපද්‍රව්‍ය සංචිත කිරීමේ මධ්‍යම පහසුකම, නව වානේ දොරවල්, ග්‍රිල් හා ආරක්ෂක පද්ධති සවිකිරීමෙන් අළුත්වැඩියා කරන ලදි. දැන් මෙම පහසුකම විකිරණශීලි ද්‍රව්‍ය සංචිත කිරීමට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වේ.



**2.2 රූපය: අධිකාරියේ පිහිටි විකිරණශීලී අපද්‍රව්‍ය සංචිත කිරීමේ මධ්‍යම පහසුකම**

## 2.3 නියාමන ක්‍රියාකාරකම්

### 2.3.1. විකිරණශීලි හදිසි ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන

- ❖ පරමාණුක ශක්ති අධිකාරිය ආපදා කළමණාකරන මධ්‍යස්ථානය හා එකමුතුව ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයට මුහුණලා ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයේ බස්නාහිර සිට උතුර දක්වා, න්‍යෂ්ටික හදිසි අනතුරු සංඥා පද්ධති (Early warning System- EWS) 5ක් ස්ථාපනය කරන ලදි. මෙම කේන්ද්‍රස්ථාන කල්පිටිය, තලෙයි මන්නාරම, ඩෙල්ෆ් , කන්කසන්තුරේ හා කොළඹ යන ප්‍රදේශ වල නාවික හමුදා මූලස්ථාන වල ස්ථාන ගත කොට ඇත. දෙවන අදියරේදී ත්‍රිකුණාමලය හා ගාල්ල

නාවික හමුදා මූලස්ථානවල තවත් පද්ධති දෙකක් ස්ථානගත කෙරෙනු ඇත. මෙම අධීක්ෂණ මධ්‍යස්ථාන ඒවායේ දැනට පවතින විකිරණ මට්ටම් පිළිබඳව දත්ත ලබාදෙන අතර හදිසියේ එම ස්ථානවල විකිරණ මට්ටම් ඉහලගියහොත් ඒ පිළිබඳව දැනුවත් කරන අතර එමඟින් මහජනතාව ආරක්ෂා කිරීමට නොපමාව ක්‍රියා කළ හැකි වනු ඇත.

- ❖ පරමාණුක ශක්ති නියෝජිතායතනයේ කලාපීය සහයෝගිතා ව්‍යාපෘති SRL/9/009 යටතේ මෙම උපකරණ ලැබී ඇත.

- ❖ ජර්මනියේ සැෆිමො (Saphymo), ජීඑම්බීඑච් (GMBH) ආයතනය මගින් මෙම පූර්ව සංඥා පද්ධති නිෂ්පාදනය කර ඇති අතර ඔවුන් විසින් මේවා එකට ගොණු කිරීම, පරීක්ෂා කිරීම, නඩත්තු කිරීම හා මෘදුකාංග භාවිතය පිළිබඳව 2012 ජූලි 16-20 දක්වා පුහුණු පාඨමාලාවක් අධිකාරියේ දී පවත්වන ලදි. ඊට අධිකාරියේ නිළධාරීන් 7 දෙනෙක් සහභාගි වූහ.

- ❖ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංඥා පද්ධති ස්ථාපනය කර ඇති නාවික හමුදා කඳවුරු වල සේවයේ නියුතු ශ්‍රී ලංකා නාවික හමුදා නිළධාරීන් 08 දෙනෙකුට 2012 ජූලි 19 වන දින දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදි. මෙම වැඩමුළුවේදී පූර්ව සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය, සුළු නඩත්තුකිරීම් හා ක්‍රියාකිරීම පිළිබඳව ඔවුන් දැනුවත් කරන ලදී.

- ❖ පරමාණුක ශක්ති අධිකාරියත්, ශ්‍රී ලංකා නාවික හමුදාව හා ආපදා කළමණාකරන මණ්ඩලය යන ආයතන තුන 2012 ජූනි 28 දින, ඉහත කී වැඩසටහනට සම්බන්ධ වන බව සහතික කිරීමට ත්‍රෛපාර්ශවික ගිවිසුමකට අත්සන් තබන ලදී.

- ❖ 2012 අගෝස්තු 2-4 දක්වා අධිකාරියේ නිළධාරීන් දුරස්ථ පාලක පූර්ව සංඥා පද්ධති කල්පිටිය, තලෙයි මන්නාරම, ඩෙල්ෆ් හා කන්කසන්තුරේ යන ස්ථාන වල ස්ථාපනය කරන ලදි.

- ❖ ත්‍රිකුණාමලය හා ගාල්ල යන ප්‍රදේශ වල තවත් පාලක පද්ධති දෙකක් ස්ථාපනයට අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග ගන්නා ලදි. 2012/09/20 හා 2012/10/09 යන දින වලදී මෙම ප්‍රදේශ වල මෙම පද්ධති සවිකිරීමට සුදුසු ස්ථාන තෝරා ගැනීමට අධිකාරියේ නිළධාරීන් දෙදෙනෙක් එම ප්‍රදේශ වල සංචාරය කළහ.

- ❖ යාපනය, මන්නාරම, හලාවත, පුත්තලම, ගාල්ල, හම්බන්තොට, මොණරාගල, මඩකලපුව,රත්නපුරය, අම්පාර හා ගම්පහ යන දිස්ත්‍රික්කවල ස්ථාන 70 ක පාදස්ථ විකිරණශීලි මට්ටම් ස්ථාපනයට, එම ස්ථාන වල පාරිසරික විකිරණ මට්ටම් මනින ලදී. මෙසේ කාර්යක්ෂම විකිරණ ප්‍රතිචාර වැඩසටහනක් සඳහා මෙම දත්ත අවශ්‍ය වන නිසා මෙම දත්ත ලබා ගන්නා ලදි.

- ❖ විවිධ ප්‍රදේශ වලදී හදිසි ප්රතිචාර කණ්ඩායම් 07 ක් පත්කරන ලදි. මෙමගින් විකිරණ ආපදාවක දී කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්විය හැකි වන අතර පරමාණුක ශක්ති අධිකාරියේ දී මෙම කණ්ඩායම් වල සාමාජිකයන් සඳහා පුහුණුවීම් ලබා දෙන ලදි.

## 2.3.2. භෞතික ආරක්ෂක වැඩසටහන ක්‍රියාත්මක කිරීම

මෙම ක්ෂේත්‍රය සම්බන්ධව ඇමරිකාවේ ශක්තිය පිළිබඳ දෙපාර්තමේන්තුවේ (US DOE), (Globle Threat Reduction Initiative- GTRI) ව්‍යාපෘතිය යටතේ ලැබුන අරමුදල් මගින් පහත දක්වා ඇති ක්‍රියාකාරකම් සිදුකරන ලදි.

එම දෙපාර්තමේන්තුව (US DOE) සමඟ එකමුතුව, විකිරණ ප්‍රභව සඳහා ආරක්ෂක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ගිවිසුමක් අත්සන් තැබීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි.



**2.3 රූපය : විවෘත ප්‍රභව ආරක්ෂා කිරීම**

ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර දක්වන බල ඇණි වල පුහුණුවන්නන් පුහුණු කිරීම සඳහා විකිරණශීලී ආරක්ෂක ප්‍රතිචාර වැඩසටහනක් ජනවාරි 23-27 දක්වා පවත්වන ලදි. මෙම වැඩසටහනෙන් බලාපොරොත්තු වූයේ පුහුණුවන්නන් පුහුණු කරන බල ඇණි වල සාමාජිකයන් පුහුණු කිරීම තුලින් ඔවුන්ගේ මාර්ගයෙන් විකිරණ ආරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන අනෙකුත් සාමාජිකයන් නිරන්තරව පුහුණු කිරීමයි. මෙම පුහුණු වැඩසටහන සඳහා 35 දෙනෙක් සහභාගි වූහ.

පොලීසියේ, යුද්ධ හමුදාවේ හා රෝහල් වල ඉහල නිළධාරීන් “විකිරණ ආරක්ෂණය අවශ්‍ය වූ අවස්ථාවල දී ප්‍රතිචාර දැක්වීම”දැනුවත් කිරීම සඳහා 2012 මැයි 08 වන දින සම්මන්ත්‍රනයක් පවත්වන ලදි. මෙම සම්මන්ත්‍රනය පැවැත්වීමේ අරමුණ වූයේ න්‍යෂ්ටික හා විකිරණශීලී ආපදා පිළිබඳව හා විකිරණශීලී ආරක්ෂණය අවශ්‍ය වූ විට ප්‍රතිචාර දැක්වීම පිළිබඳව ඉහත කී නිළධාරීන් ගේ දැනුම වැඩි දියුණු කිරීමයි.පුද්ගලයින් 30 ක් මීට සහභාගි වූහ.



**2.4 රූපය : පොලීසියේ හා එස්.ටී.එෆ් (STF) හි නිළධාරීන් පුහුණු කිරීම**

"විකිරණශීලී ආරක්ෂණය පිළිබඳ  පුහුණුව" නැමැති පුහුණු පාඨමාලාවක් යාපනයේ තිලාපිලෙයි පිළිකා ප්‍රතිකාර ඒකකයේ හා අනුරාධපුර මහ රෝහලේ පිළිකා ඒකකයේ මෙන්ම අනුරාධපුර හා යාපනයේ පොලිස් කොට්ඨාශවල ඉහල පොලිස් නිළධාරීන් සඳහා ජූලි 10-13 දක්වා පවත්වන ලදි.මෙම පුහුණු පාඨමාලාවට 30 ක් සහභාගි වූහ.

## 2.3.3. විකිරණ පහසුකම් වල තත්වය නිර්ණය / අවසර ලබාදීම්

| | |
|---|---|
| අධීක්ෂණය කරන ලද විකිරණ පහසුකම් සංඛ්‍යාව | -140 |
| නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | -278 |
| නිකුත් කරන ලද ආනයන අපනයන අවසර දීම් සංඛ්‍යාව | -474 |
| නිදේශ සහිතව අනුමත කරන ලද කාමර සංඛ්‍යාව | - 63 |

## 2.4 පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

- රජයේ විකිරණවේදීන් සඳහා විකිරණ මගින් රෝග හඳුනාගැනීම හා විකිරණවේදය (Interventional Radiology) පිළිබඳ ජාතික පුහුණු පාඨමාලාවක් 2012 ඔක්තෝම්බර් 9 – 12 දක්වා පවත්වන ලදි. 40 දෙනෙක් මෙම පාඨමාලාවට සහභාගි වූහ.

- දුර්ලභ ගණයේ පාංශු මූලද්‍රව්‍ය සඳහා ඉල්මනයිට් පස් නිස්සාරණයේ දී, පස් කැනීමේ දී හා ඒ හා සම්බන්ධ කාර්යයන් වලදී විකිරණශීලී ඛණිජ ද්‍රව්‍ය නිර්මාණය කෙරෙන නිසා පුල්මුඩේ පිහිටි ඛණිජ වැලි දෙපාර්තමේන්තුවේ සේවකයන් සඳහා විකිරණ ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රනයක් පැවැත්වූ අතර ඊට 200 ක් සහභාගි වූහ.

- හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා න්‍යෂ්ටික විද්‍යාව හා එහි යෙදීම් පිළිබඳ එක් දින සම්මන්ත්‍රනයක් 2012 මාර්තු 08 වන දින පවත්වන ලදි.

- න්‍යෂ්ටික විද්‍යාවේ භාවිතයන් පිළිබඳව මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ අ.පො.ස උසස් පෙළ සිසුන් දැනුවත් කිරීමේ එක් දින සම්මන්ත්‍රණයක් 2012 සැප්තැම්බර් 12 දින එම පාසලේ දී පවත්වන ලදි.

- අයණීකරණ විකිරණ යොදාගෙන සේවා සපයන්නන් සඳහා විකිරණ ආරක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් පවත්වන ලදි.



**2.5 රූපය : විකිරණවේදීන් සඳහා වාර්ෂික පුහුණු පාඨමාලාව**

## 2.5 අපද්‍රව්‍ය කළමණාකරනය

- ශ්‍රී ලංකාවේ රේගු දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත වානේ උපකරණ තොගයක් විකිරණශීලීතාව සඳහා පරීක්ෂා කරන ලදුව එය විකිරණශීලී බව සොයාගත් බැවින් එම උපකරණ නැවත අපනයනයට අවශ්‍ය අනුමැතිය දෙන ලදි.

- ගෙවතු භෝග පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රයේ ස්ථාන ගත කර තිබූ පැරණි කොබෝල්ට් 60 ප්‍රභව 2 ක් අපහරණය සඳහා ඉන්දියාවට යැවීමට ජාත්‍යන්තර ප්‍රවාහන ප්‍රමිතීන්ට අනුකූලව අසුරා කොළඹට ගෙන එන ලදි. අධිකාරියේ තිබූ තවත් විකිරණශීලතාව අධික ප්‍රභවයන්ද අසුරා ඉන්දියාවට යැවීමට පිළියෙල කරන ලදි. මෙම ප්‍රභව ඉන්දියාවට අපනයනය සඳහා අවශ්‍ය අරමුදල් ඇමරිකාවේ GTRI ව්‍යාපෘතිය යටතේ ලැබුණි.

- සීමාසහිත ස්ලම්බර්ගර් සයිල්ෆිල්ඩ් ර්ස්ටර්න් වෙතින් ආනයනය කරන ලද විකිරණශීලී ප්‍රභව, තෙල් නිස්සාරණ කටයුතු සඳහා මන්නාරමට ප්‍රවාහනයට පෙර තාවකාලිකව අධිකාරියේ විකිරණශීලී ද්‍රව්‍ය සංචිත කිරීමේ ගොඩනැගිල්ලේ තැම්පත් කර තබන ලදී. මෙම සේවය සඳහා ඉහත කී සමාගමෙන් අධිකාරිය මුදලක් අය කර ගන්නා ලදි.

- සීමාසහිත කුමාගේ ගුම් සමාගම භාවිතා කළ විකිරණශීලි ප්‍රභව සහිත මාපක දෙකක් අධිකාරියට ගෙනවිත් අධිකාරියේ මධ්‍යම අපද්‍රව්‍ය සංචිත කිරීමේ ගොඩනැගිල්ලේ සංචිත කරන ලදි.

- සීමාසහිත චීන වරාය ඉංජිනේරු සමාගමට අයත් විකිරණශීලී ප්‍රභව සහිත තෙතමන මාපක දෙකක් අධිකාරියට ප්‍රවාහනය කොට අධිකාරියේ මධ්‍ය අපද්‍රව්‍ය සංචිත කිරීමේ ගොඩනැගිල්ලේ සංචිත කරන ලදි.

- තවද සීමාසහිත සිලෝන් බිස්කට්ස් සමාගමට අයත් විකිරණ ප්‍රභව සහිත අකුණු සන්නායකයක් අධිකාරියට ගෙනවිත් අධිකාරියේ අපද්‍රව්‍ය තැම්පත් කිරීමේ ගොඩනැගිල්ලේ සංචිත කරන ලදි.

- සීමාසහිත බීඑස් ඩබ්ලිව්සී ලංකා (පුද්ගලික) සමාගම භාවිතා කල දුම් මාපක 24 ක් අධිකාරියට ගෙනවිත් ඉහත කී ගොඩනැගිල්ලේ සංචිත කරන ලදි.

- සිලෝන් දුම්කොළ සමාගමේ, භාවිතා නොකෙරෙන විකිරණශීලී ප්‍රභව 11 ක් අධිකාරියට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සලසන ලදි.



**2.6 රූපය : ප්‍රවාහනය කරන රැඳවුමට ප්‍රභව ඇතුළු කිරීම**

## 2.6 ආදායම

| | |
|---|---|
| බලපත්‍ර, ප්‍රවිකිරණ කාමර අධීක්ෂණය කර ලබා දුන් | |
| අවසර දීම් වලින් ලබා ගත් ආදායම | = රු. 5,070,198.52 |
| ආනයන / අපනයන ආදායම | = රු. 305,425.52 |
| පුද්ගලයන් පුහුණු කිරීමෙන් ලත් ආදායම | = රු. 542,723.36 |
| අපහරණ හා ප්‍රභව තැම්පත් කිරීමේ ගාස්තු | = රු. 4,384,204.80 |
| මුළු ආදායම | = රු.10,302,552.20 |

# 3.ජාත්‍යන්තර සහයෝගිතා අංශය

පරමාණුක ශක්ති අධිකාරිය, ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතාතනයේ ශ්‍රී ලංකාවේ පිහිටි කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරන අතර ව්‍යාපෘති සංකල්ප කළමණාකරණ සැකිල්ල (Project Concept Management Framework – PCMF) යොදාගෙන ජාතික ව්‍යාපෘති සංකල්ප අන්තර් ජාල ගත කිරීම සම්බන්ධීකරණය කරන ලදි. PCMF යනු අන්තර්ජාල වේදිකාවත් වන අතර ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ (ජා.ප.ශ.නි.) මෙම වේදිකාව යොදාගෙන සාමාජික රටවලට එම රටවල ජාතික හා කලාපීය ව්‍යාපෘති ස්ථානගත කිරීමට එම නියෝජිතායතනය මගින් උපදෙස් දී ඇත අනිකුත් ජාතික ආයතන ආධාරයෙන් මෙම කාලපරිච්ඡේදයේ දී, අධිකාරිය විසින් ජාතික තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති සංකල්ප 9ක් ඉදිරිපත් කරන ලදි. ජාතික ව්‍යාපෘති සංකල්ප නිර්මාණය සිදු කරන ලද්දේ රටේ වැඩසටහන් රාමුවට හා මහින්ද චින්තන ඉදිරි දැක්ම වැනි ජාතික වටිනාකමක් සහිත සැලසුම් වාර්තා වලට අනුකූලවය. මෙම ව්‍යාපෘති සංකල්ප ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ව්‍යාපෘති සංකල්ප කළමණාකරණ සැකිල්ලට 2014/2015 වාර්ෂික චක්‍ර සඳහා ඇතුලත් කරන ලද අතර පහත සඳහන් ව්‍යාපෘති 5 මෙම කාල පරිච්ඡේදය සඳහා අනුමත කරන ලදි.

| අංකය | ව්‍යාපෘති මාතෘකාව | ආයතනය |
|---|---|---|
| 1 | රෝග හදුනාගැනීමේ විකිරණවේදයේ දී විකිරණ ආරක්ෂණය ශක්තිමත් කිරීම, සවිමත් කිරීම, ශ්‍රී ලංකාවේ වෛද්‍ය ක්ෂේත්‍රයේ විකිරණ ආරක්ෂණය දියුණු කිරීම සඳහා එම ක්‍රම වේදයන් විගණනය | ශ්‍රී ලංකාවේ ජාතික රෝහල, සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව |
| 2 | න්‍යෂ්ටික කෘෂිකාර්මික ජාතික මධ්‍යස්ථානයක් ඇති කිරීම | ශ්‍රී ලංකා පරමාණුක ශක්ති අධිකාරිය |
| 3 | සාගර දූෂණය පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපනය | සාගර පරිසර ආරක්ෂණ අධිකාරිය |
| 4 | අසාධ්‍ය සන්ධි රෝග හා පිළිකා රෝගීන් සඳහා න්‍යෂ්ටික විකිරණ ප්‍රතිකාර ක්‍රම යොදා ගැනීමේ දී එම | න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය, වෛද්‍ය පීඨය, පේරාදෙණිය |

| | | |
|---|---|---|
| | න්‍යෂ්ටික වෛද්‍ය ක්‍රම වේදයන් වැඩි දියුණු කිරීම තුලින් ඔවුන්ගේ රෝගී භාවය සුවකිරීමේ ප්‍රවනතාව වැඩි කිරීම | විශ්ව විද්‍යාලය |
| 5 | ශ්‍රී ලංකාවේ රජයට අයත් පළමුවන බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය අඛණ්ඩව ආරක්ෂාකාරී ලෙස දීර්ග කාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහාය | ශ්‍රී ලංකා පරමාණුක ශක්ති අධිකාරිය |

ජාතික පර්යේෂණ ආයතන, සෞඛ්‍ය ආයතන හා කාර්මික ආයතන වලට අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි වන සේ ද ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ වැඩසටහන් වලට ව්‍යාපෘති සංකල්ප හා නාම යෝජනා ඉදිරිපත් කල හැකි වන සේ, ඒ පිළිබඳ අධිකාරියේ දත්ත ඇතුලත් දත්ත පද්ධති යාවත්කාලීන කරන ලදි. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ක්‍රියාකාරකම් වලට අනුකූල වන ආකාරය අදාල ලැයිස්තු පිළියෙල කරන ලදි . සමාලෝචිත කාලපරිච්ඡේදයේ දී ශ්‍රී ලාංකික නිළධාරීන් පිටරට වලදී පුහුණු කිරීම සඳහා ජාතික ආයතන වලින් අයදුම් පත් ඉල්ලීම් 110 ක් අධිකාරියට ලැබුණි. (ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය, RCARO හා MEXTආයතන වල දී පුහුණුව ලැබීමට)
අදාල කාල පරිච්ඡේදයේදී ජාතික සම්පත් ආයතන ඇතුලත් ලැයිස්තුවක් ද පිලියෙල කෙරිණි. ශ්‍රී ලාංකික විද්‍යාඥයන් හා පර්යේෂකයන් 122 ට පුහුණුවීම් ලබා දීමට අධිකාරිය සමත්විය. මෙම තෝරාගත් නිළධාරීන් හට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ සාමාජික රටවල කාර්මික,වෛද්‍ය හා කෘෂිකාර්මික යන ක්ෂේත්‍රවල ආයතනවලදී උසස් තාක්ෂණික මට්ටමේ පුහුණුවීම් ලබාගත හැකිවිය.
තවදුරටත් රටේ වැඩසටහන් රාමුවට, ජාතික සම්පත් මධ්‍යස්ථාන එකඟතාවයට, එම ලැයිස්තුව වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.
ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා වැඩසටහන පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීමට එම ආයතනයේ අන්තර්ජාලගත වේදිකාව යොදා ගැනීමටද, එමගින් තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒවා පාලනය කිරීමටද අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි.තවදුරටත් අන්තර් ජාලගත ව්‍යාපෘති සංකල්ප කළමණාකරන රාමුව ව්‍යාපෘති සංකල්ප ඉදිරිපත් කිරීමටත් අධිකාරියේ දී ව්‍යාපෘති පාලනයට හා ඒවා පිළිබඳ දත්ත ලබාගැනීමටත් TCPRIDE නැමති වැඩසටහන යොදාගැනීමටත් අවශ්‍ය කටයුතු සලසන ලදි. තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති සඳහා අන්තර් ජාල ගත වේදිකාව පුළුල්ව භාවිතා කරන ලදි. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ අන්තර්ජාල ගත වේදිකාව යොදාගෙන එම නියෝජිතායතනයට අධිකාරිය මගින් ඉදිරිපත් කෙරෙන අධිශිෂ්‍යත්ව හා විද්‍යාත්මක චාරිකා අයදුම්පත් ඇතුලත් කරන ලදි. ජා.ප.ශ.නි. අධිශිෂ්‍යත්ව , විද්‍යාත්මක චාරිකා, පුහුණු වැඩසටහන්, වැඩමුළු හා රැස්වීම් ආදිය සඳහා පුද්ගලයන්ගේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට එම නියෝජිතායතනයේ අන්තර්ජාල ගත වේදිකාව යොදාගැනීමට එම ආයතනය විසින් දිරිගන්වනු ලැබේ.

## 3.1. තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීම

2012/2013 කාලපරිච්ඡේදයේදී ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් ව්‍යාපෘති 8ක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය දෙන ලදි. 2012 වසරේ දී සක්‍රීය ව්‍යාපෘති 15 ක් කලාපීය හා ජාත්‍යන්තර සක්‍රීය ව්‍යාපෘති 60 ක් ක්‍රියාත්මක විය.
2012 වසර අවසන් වන විට තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරිය 90% කට අධික සම්පූර්ණ ක්‍රියාකාරී ප්‍රතිශතයක් ලබාගෙන තිබුණි. අධිකාරිය පේරාදෙණිය විශ්ව විද්‍යාලය, මැලේරියා වැඩසටහන, ලංකා විදුලිබල මණ්ඩලය,භූ මිණුම් හා පතල් කාර්යාංශය හා

මහ රෝහල යාපනය යන ආයතන වලට තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන ලදි.

### 3.2. ශ්‍රී ලංකාවේ පවත්වන ලද ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ක්‍රියාකාරකම්

පහත සඳහන් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ අන්තර් ජාතික රැස්වීම් / පුහුණු පාඨමාලා ලංකාවේ පැවැත්වීමට, අවශ්‍ය පහසුකම් හා ඊට අවශ්‍ය දේශීය පරිපාලනමය ක්‍රියාකාරකම් අධිකාරිය විසින් සපුරන ලදී.

3.2.1. RAS/5/055 – IAEA/RCA - පසේ සාරවත්භාවය වැඩි දියුණු කිරීම, පසේ නිෂ්පාදන වැඩිකිරීම. හා පිළිබඳ සම්බන්ධීකරණ රැස්වීම - කොළඹ ශ්‍රී ලංකාව - 2012 අගෝස්තු 27-31

3.2.2. RAS /7/024 – IAEA/RCA - ස්ථායි සමස්ථානික යෙදීම (කාබන් -13, නයිට්‍රජන් -15,හා ඔක්සිජන් - 18) හා සාගර පරිසර පද්ධතිවල භූ ජෛව රසායනික වෙනස්කම් වලට හේතුවන ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය පිළිබඳ රැස්වීම - කොළඹ ශ්‍රී ලංකාව - 2012 නොවැම්බර් 21-30

### 3.3. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතයෙන් ශ්‍රී ලංකාවට එවන ලද අධිශිෂ්‍යත්වලාභීන් සඳහා විද්‍යාත්මක චාරිකා සම්බන්ධීකරණය

ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ, පශු විද්‍යා දෙපාර්තමේන්තුවේ දී, නේපාල ජාතිකයන් තිදෙනෙක් පුහුණු කිරීමට තෝරාගත් අතර, මෙම කාර්යය සම්බන්ධිකරණය කරන ලද්දේ අධිකාරිය විසිනි.

### 3.4. දේශීය සම්මන්ත්‍රන සංවිධානය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි විද්‍යාඥයන්,ඉංජිනේරුවන් දහතුන් දෙනෙක් සඳහා න්‍යෂ්ටික යෙදීම් පිළිබඳ සම්මන්ත්‍රනයක් 2012 ඔක්තෝම්බර් 05 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන ලද අතර අධිකාරිය විසින් මෙම සම්මන්ත්‍රනය සංවිධානය කරන ලදී.

### 3.5. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ සාමාජික රටවල් සමඟ ද්විපාර්ශවික සාකච්ඡා

ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ 55 වන සමුළුවේ දී ඇති වූ ද්විපාර්ශවික සාකච්ඡා වලට අනුකූලව ශ්‍රී ලංකාවේ නියෝජිත පිරිසක් ඉන්දියාවට සහ පකිස්තානයට ගිය අතර අධිකාරිය විසින් එම සංචාරය සම්බන්ධීකරණය කරන ලදි.

## 4 සාමාන්‍ය විද්‍යාත්මක අංශය

### 4.1.න්‍යෂ්ටික ඉලෙක්ට්‍රොනික වැඩසටහන

රටක සමාජීය ආර්ථික සංවර්ධනය සඳහා න්‍යෂ්ටික තාක්ෂණය උපරිම ආකාරයට යොදා ගැනීමට නම් එම රටේ භාවිතයට ගන්නා න්‍යෂ්ටික උපකරණ නියම ආකාරයට ක්‍රියාකාරීත්වයෙන් තබා ගැනීම අත්‍යවශ්‍ය කරුණකි. මේ නිසා සාමාන්‍ය විද්‍යාත්මක අංශය ඉහත කී කාරණය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය සේවා සපයයි.

#### 4.1.1. න්‍යෂ්ටික ඉලෙක්ට්‍රොනික උපකරණ නඩත්තු කිරීම / සේවා සැපයීම

අ) නඩත්තු කිරීමේ සේවා: න්‍යෂ්ටික උපකරණ අළුත්වැඩියාව / මෘදුකාංග පිළිබඳ සේවා / මෘදුකාංගවල යොදාගැනීම් නියමාකාරයෙන් සිදුවන්නේ දැයි බැලීම -2012 වර්ෂයේදී ඉහත කී සේවා 15ක් සපයන ලදී.

ආ) අධිකාරියට ලබා දුන් සේවා: අධිකාරියේ පරිගණක, අන්තර්ජාලගත හා තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ මෘදුකාංග හා දෘඩාංග පිළිබඳ සේවා 112කි.

**ඇ) සංවර්ධන ක්‍රියාකාරකම් හා සම්බන්ධ උපදෙස් දීම හා ඒ සම්බන්ධව උපදේශක සේවා සැපයීම.**

සාමාන්‍ය විද්‍යාත්මක අංශයේ විශේෂඥ කන්ඩායම විසින් ශ්‍රී ලංකාවේ ප්‍රදේශ කිහිපයක ස්ථාන ගත කරන ලද න්‍යෂ්ටික පූර්ව හදිසි සංඥා පද්ධති ස්ථාන ගත කිරීම, ඒවා ක්‍රමාංකනය කිරීම මෙන්ම එම පද්ධති වල නඩත්තු කිරීමේ කටයුතු වල වගකීම භාරගෙන එම ක්‍රියාකාරකම් සිදු කරන ලදි. 2012 වසරේ දී නොරොච්චෝලය, තලෙයිමන්නාරම, ඩෙල්ෆ්ට්, කන්කසන්තුරේ හා කොළඹ යන ප්‍රදේශ වල දුරස්ථ පාලක සවිකරන ලදි.මෙම දුරස්ථ පාලක මධ්‍යස්ථානවලට අයත් කේන්ද්‍රස්ථානයේ පද්ධති ත්‍රමාංකනය, නඩත්තු කිරීම, දත්ත පාලනය හා එම දත්ත විශ්ලේෂණය සිදු කරන ලදි.

### 4.1.2. පුහුණු කිරීම්

අ) "න්‍යෂ්ටික උපකරණ වල තත්ව පාලනය /තත්වය සහතික කිරීම" පිළිබඳ පුහුණු පාඨමාලාවක් පැවැත් වූ අතර එම පුහුණු පාඨමාලාවට විශ්ව විද්‍යාල , රෝහල් හා වෙනත් ආයතන වල තාක්ෂණික ශිල්පීන් කිහිපදෙනෙක් සහභාගි වූහ.

ආ) 2012 වසරේ දී, අධිකාරියේ සාමාන්‍ය විද්‍යාත්මක අංශයට අයත් න්‍යෂ්ටික උපකරණ විද්‍යාගාරයේ දී විශ්ව විද්‍යාල සිසුන් දෙදෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සම්පූර්ණ කළහ.

## 4.2. සංවර්ධන කටයුතු

උපකරණ සැපයුම් කරුවන්ගේ/නිෂ්පාදකයන්ගේ සහාය නොමැතිව නවතම ඉලෙක්ට්‍රොනික උපකරණ ක්‍රියා විරහිත වූ විට ප්‍රතිසංස්කරණ කළ නොහැක. ඊට හේතුව මෙම නවතම තාක්ෂණික උපකරණ වල තාක්ෂණික දත්ත නොමැති වීමයි. මෙසේ මෙම නවතම උපකරණ වල අංගෝපාංග ප්‍රතිසංස්කරණය හා එම විද්‍යුත් පරිපථ ප්‍රතිස්ථාපනය දියුණු වන රටවල ආර්ථිකයට දැරිය නොහැකි බැවින් සරල උපකරණ නිර්මාණය හා  අවශ්‍ය අවස්ථාවල දී ඒවා භාවිත කිරීමත් සුදුසු වේ.සාමාන්‍ය විද්‍යාත්මක අංශය අඩු මිලැති ප්‍රොටෝ ටයිප් විකිරණමාපක නිෂ්පාදනයේ නියැලී සිටි.මේ වර්ගයේ විකිරණ මාපකයක් දැනට එකලස් කොට සැලසුම් කර ඇති අතර ක්ෂේත්‍රයේ දී එහි ක්‍රියාකාරීත්වය අධ්‍යනය කල යුතුව ඇත.

## 4.3. ද්වීතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරය

විකිරණ මගින් ප්‍රතිකාර කිරීමේ දී, රෝග හදුනාගැනීමේ දී  හා විකිරණ ආරක්ෂණයේ දී විකිරණමිතික සම්මත ස්ථාපනය හා ඒවා පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

ඉහත කී ක්ෂේත්‍ර සඳහා නිවැරදි මිනුම් ලබා ගැනීමට මෙම ද්විතියික සම්මත විකිරණ මිතික විද්‍යාගාර ජාත්‍යන්තර මිනුම් පද්ධති සමග සම්බන්ධතා පවත්වීම අවශ්‍ය වේ.

විකිරණ සේවකයන් / විකිරණ භාවිතා කරන කේන්ද්‍රස්ථානවල විකිරණ ආරක්ෂණය සඳහා පුද්ගල විකිරණ මිතික සේවාව අධිකාරියෙන් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙමගින් රාජකාරියේ යෙදී සිටින විට මෙම සේවකයන්ට නිරන්තරව ආරක්ෂාව සැපයේ. මීට අමතරව විකිරණ මාපක උපකරණ ද ක්‍රමාංකනය කිරීම අත්‍යාවශ්‍ය වේ.

මෙම ද්විතික සම්මත විද්‍යාගාර පවත්වාගෙන යාම තුලින් පිළිකා රෝගීන්ට ලබා දෙන විකිරණ මිතික මාත්‍රා නිවැරදි දැයි තහවුරු කිරීමටත් විකිරණ සේවකයන්, මහජනතාව හා පරිසරය අනවශ්‍ය ආකාරයට ගැමා විකිරණ වලට නිරාවරණය වීමත් වැලකිය හැක.

මෙම ද්විතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරයේ ඇති මූලික උපකරණ ප්‍රංශයේ පිහිටි ජාත්‍යන්තර බර හා මිනුම් කාර්යංශයේ ප්‍රාථමික සම්මත වලට අනුකූලව ක්‍රමාංකනය කොට ඇත.තවදමෙම ද්විතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරය අයි එස් ඕ 17025 (ISO 17025) ට අනුව ප්‍රතීතනය කොට ඇත.





**4.1 රූපය: ද්විතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරයේ දී විකිරණ මාපක ක්‍රමාංකනය**

සේවා හා ක්‍රියාකාරකම්

I. 2012 වසරේ දී පුද්ගලික හා රාජ්‍ය ආයතන කිහිපයකට විකිරණ මිතික ක්‍රමාංකන සේවා සපයන ලදි. ක්‍රමාංකනය කරන ලද විකිරණ මාපක සංඛ්‍යාව 65 කි.

II. රාජකාරි කරන අතරතුර විකිරණ වලට නිරාවරණය වේ දැයි දැනගැනීමට තාප සංදීප්තතා විකිරණ මාපක 900 ක් ප්‍රවිකිරණය කරන ලදි.

III. ශික්ෂණ රෝහල අනුරාධපුරය, පිළිකා ඒකකය, මහරගම යන රෝහල් වල ප්‍රතිකර්ම සඳහා භාවිතා කරන උපකරණ සඳහා ක්‍රමාංකන සේවා සපයන ලදි.

IV. අනුරාධපුරය ශික්ෂණ රෝහලේ පිළිකා ප්‍රතිකාර සඳහා යොදා ගන්නා කොබොල්ට් -60 කදම්භයේ නිරවද්‍යතාව මැනීමට එම රෝහලට සේවා සපයන ලදි.

V. ලංකාවේ ඇති පිළිකා රෝහලවල ප්‍රතිකාර කිරීමේ දී භාවිතාවන විකිරණ කදම්භ වල නිරවද්‍යතාවය ඇති කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය සමග වැඩපිළිවෙලක් යොදන ලදි.

VI. ද්විතියික සම්මත විද්‍යාගාරයේ ඇති උපකරණ නිරන්තරයෙන් නඩත්තු කරන ලදි.

VII. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් යටතේ වියදම බෙදාගැනීමේ පදනම යටතේ එක්ස් කිරණ පද්ධතියක් ලබා ගැනීමට කටයුතු කරන ලදි. මෙම පද්ධතිය යොදාගෙන ක්‍රමාංකන සේවා සිදු කිරීමට හැකිවනු ඇත.

VIII. ද්විතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරයේ පවතින සම්මත වල ස්ථායිතාව (නිවැරදි භාවය) නිර්ණයට නිරන්තරයෙන් පරීක්ෂණ පවත්වන ලදී.

IX. ද්විතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරයේ තත්ව පාලන පද්ධතිය නිරන්තරයෙන් දියුණු කරන ලදි.

X. ද්විතියික සම්මත විකිරණමිතික විද්‍යාගාරයෙන් ලැබෙන ප්‍රතිපල වල සත්‍යතාව නිර්ණයට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ සහාය ලබා ගැනීමට කටයුතු යොදන ලදි.

## 4.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික නියොජිතායතනය (ICTA) සමග සිදුකල කටයුතු

I. අන්තර්ජාල සම්බන්ධය දියුණු කිරීමට නව මෙගා බයිට් 4 ක බ්‍රෝඞ් බෑන්ඞ් දත්ත රේඛ පද්ධතියක් ස්ථාපනය කෙරිණ.

II. අනෙකුත් වැඩකටයුතු වල නිරත වන අතර සාමාන්‍ය විද්‍යාත්මක අංශයේ අංශ ප්‍රධාන හා එහි අනෙකුත් සාමාජිකයන් විසින් අධිකාරියේ අන්තර්ජාලය හා වෙබ් අඩවිය නඩත්තු කරන ලදි

III. ICTA ආයතනය සමග එකතුව එහි E ශ්‍රී ලංකා වැඩසටහන යටතේ අධිකාරිය සඳහා www.aea.gov.lk නම් නව වෙබ් අඩවිය ස්ථාපනය කරන ලදි.

IV. අධිකාරියට තොරතුරු තාක්ෂණ සේවා සපයන ලදී.

අධිකාරියේ සේවකයන් ගේ ඊ මේල් ලිපින aea.gov.lk ලෙස වෙනස් කිරීම සඳහා නව සම්බන්ධතාවක් මත පදනම් වූ ඊ මේල් සේවා සපයන්නක් අධිකාරියේ ස්ථාන ගත කෙරිණි. මෙම නව "සර්වර්" පද්ධතිය අසාර්ථක විය. මෙම කරුණ සම්බන්ධයෙන් ICTA ආයතනයට ගෙවිය යුතු මුදල අඩු කිරීමට යත්න දරණ ලදි.දැනට පුද්ගලික ආයතනයක් සමග අඩු මුදලකට gov.lk ලෙස ඊ මේල් සේවාව අධිකාරියේ සේවකයන්ට ලබා දී ඇත. මේ යටතේ අධිකාරියේ පරිගණකයන්ට මෙම සම්බන්ධතාව ලබා දී ඇත.

## 4.5. වෘත්තීමය කටයුතු වලදී විකිරණ හා සම්බන්ධව කටයුතු කරන්නන් අධීක්ෂණය සඳහා යොදා ගැනෙන පුද්ගලික විකිරණමිතික (TLD Service) සේවාව:



4.2. රූපය: සේවාව

මෙම වැඩසටහනේ මූලික අරමුණ විකිරණශීලි ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ යන්ත්‍ර භාවිතා කරන්නන් ගේ විකිරණ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා එම පුද්ගලයන් නිරාවරණය වන විකිරණ මාත්‍රාව අධීක්ෂණය කිරීමයි. විකිරණශීලි හා ප්‍රවිකිරණ උපකරණ භාවිතා කරන සියළුමසේවකයන් අධීක්ෂණය අනිවාර්ය කර ඇත.දීප ව්‍යාප්තව විසිරී සිටින විකිරණ සේවකයන්ඔවුන්ගේ දෛනික රැකියා කටයුතු වලදී කොපමණ ප්‍රමාණයකඅයණීකරණ විකිරණ වලට නිරාවරණය වී දැයි අධීක්ෂණය සඳහා සාමාන්‍ය විද්‍යාත්මක අංශය තාප සංදීප්තතා මාපක යොදාගෙන පුද්ගල විකිරණ මාත්‍රක සේවාවක් පවත්වා ගෙන යයි.මාසිකව / ද්වී මාසිකව මෙසේ අධීක්ෂණය කරන ලද සේවකයන් සංඛ්‍යාව 1098 කි.

මෙම විද්‍යාගාරයට ප්‍රතීතනය ලබා ගැනීමට අවශ්‍ය තත්ව කළමණාකරන පද්ධතිය, දියුණු කෙරෙමින් පවතී.

## 4.6. ශ්‍රී ලංකාවේ පාරිසරික විකිරණශීලී අධීක්ෂණ වැඩසටහන

2012 වසරේ සාමාන්‍ය විද්‍යාත්මක අංශය මගින් සිදුකරන ලද කාර්යයන්

### 4.6.1. පාදස්ථ පාරිසරික විකිරණශීලතාව මැනීම

පාදස්ථ පාරිසරික විකිරණශීලීතාව අධ්‍යනය සඳහා පාරිසරික විකිරණශීලතාව අධීක්ෂණය කරන ලදි. මෙම ව්‍යාපෘතිය සාමාන්‍ය විද්‍යාත්මක අංශය, විකිරණ ආරක්ෂණ අංශය හා ජීව විද්‍යා අංශය සමග එකමුතුව සිදු කරයි. 2012 වසරේ දී ස්ථාන 64 ක පාංශු / තෘණ සාම්පල එකතු කර අවසන් කරන ලදි. මුළු දිවයිනම ඇතුළත් වන ආකාරයට ස්ථාන 400 ක් තෝරා ගෙන ඇති අතර දැනට ස්ථාන 189 ක මිනුම් සම්පූර්ණ කර ඇත. මෙම දත්ත ශ්‍රී ලංකා සිතියමේ දැක්වීමට මෘදුකාංග වැඩසටහනක් නිර්මාණය කරන ලදි.



**4.3 රූපය : මෙම රූපයේ පෙන්නුම් කර ඇති ස්ථාන වල විකිරණශීලතාව / විකිරණ මට්ටම් මැන ඇත.**

## 4.6.2. ක්ෂේත්‍රයේදී සිදුකරන ලද ගැමා මිණුම්

සාමාන්‍ය විද්‍යාත්මක අංශයේ විශේෂඥයන් IAEA, TEC DOC – 1092 ට අනුකූලව ක්ෂේත්‍රයේදී ගැමා වර්ණාවලීක්ෂමිතික දත්ත ලබා ගැනීමට භාවිතා කරන උපකරණ ක්‍රමාංකනය, මගින් දත්ත ලබා ගැනීමට අවශ්‍ය සහාය ලබාදෙන ලදි.තෝරාගත් ස්ථාන 61 න් 2012 වසරේදී බලංගොඩ, රත්නපුර, අඹිලිපිටිය, හම්බන්තොට, කතරගම, වැල්ලවාය, පොතුවිල්, අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය සහ කන්තලේ යන ප්‍රදේශ වල ස්ථාන 31 ක මිණුම් සම්පූර්ණ කරන ලදි.

වර්ණාවලි විශ්ලේෂණයට හා දත්ත වර්ග කිරීමට ද සාමාන්‍ය විද්‍යාත්මක අංශය විශේෂඥ සහාය ලබා දේ.



**4.4 රූපය :2011 හා 2012 වසර වලදී පිළිවෙලින් ස්ථාන 30 ක හා 31 ක්ෂේත්‍රයේ දී ගැමා විකිරණ මිණුම් සිදුකරන ලදී.**

## 4.6.3. ශ්‍රී ලංකාවේ රේඩොන් අධීක්ෂණය

ශ්‍රී ලංකාවේ රේඩොන් මනින ව්‍යාපෘතිය සඳහා ජපානයේ විකිරණ විද්‍යා න්‍යෂ්ටික ආයතනයේ (NIRS) හා ජපානයේ ටෝකියෝ විශ්ව විද්‍යාලයේ සහාය ලබා ගන්නා ලදි. මෙම ව්‍යාපෘතිය මූලික අධ්‍යන ආයතනය සමග සුසංයෝගයෙන් සිදුකෙරේ. Cr 39 නම් දර්ශකය යොදාගෙන බාහිර රේඩොන් / තොරෝන් මට්ටම් ස්ථාන 49 ක මනින ලදි. උණු දිය උල්පත් ආසන්නව හා ඒ වටේ භූ තල මායිම් යැයි සැක හිතෙන ස්ථාන වලද මෙම මිනුම් සිදුකරන ලද අතර ක්ෂේත්‍රීය ගැමා මිණුම් මහඔය, මහව හා කපුරුල්ල යන ස්ථාන වල සිදු කෙරිණි.




**4.5 රූපය : මනින ලද ස්ථාන 49 හි බාහිර රේඩොන් / තොරෝන් මට්ටම් වල ව්‍යාප්තිය**

පර්යේෂකයන් හුවමාරු කරගන්නා ජපානයේ MEXT ව්‍යාපෘතිය යටතේ මෙම වැඩසටහන සවිමත් කිරීමට විශේෂඥ චාරිකාවක් ලබා ගන්නා ලදි. (ටෝකියෝ විශ්ව

විද්‍යාලයේ මහාචාර්ය තකිෂි ඊමොටෝ 2012 සැප්තැම්බර් 02 – 07 දක්වා පරමාණුක ශක්ති අධිකාරියේ විද්‍යාඥයන්ට මෙම ව්‍යාපෘතිය සඳහා සහාය විය. පුල්මුඩේ දිය උල්පත් වල රේඩොන් අධීක්ෂණය සක්‍රිය ක්‍රමයට අනුකූලව (RAD7 හා WLx උපකරණ යොදාගෙන) සිදුකොට ශ්‍රී ලංකාවට සුදුසු මෙම ක්‍රමය සඳහා අවශ්‍ය උපකරණ ලබාගැනීමට අවශ්‍ය දත්ත එකතු කර ගන්නා ලදී.

## 4.6.4 තෝරියම් සම්පත් සොයාගැනීමේ ව්‍යාපෘතිය

2012 වසරේදීත් තෝරා ගත් ස්ථාන වල ස්වභාවිකව පවතින විකිරණශීලී ද්‍රව්‍ය වල(NORM) පැතිරීම සිතියම්ගත කිරීම සිදුකරන ලදි. ස්වභාවික විකිරණශීලී ද්‍රව්‍ය සහිත කළුතර කැලිඩෝ වැල්ලේ ක්ෂේත්‍රීය ගැමා මිණුම් 12 ක් සිදු කරන ලද අතර පානදුර සිට බේරුවල දක්වා පිහිටි මුහුදු තීරයේ ගැමා විකිරණමිතික ව්‍යාප්තිය මනින ලදි

.




**4.6 රූපය : පාරිසරික විකිරණශීලීතාව අධික ප්‍රදේශ**

# 5. නිර්විනාශක පරීක්ෂණ (එන් ඩී ටී) අංශය

නිර්විනාශක පරීක්ෂණ අංශයේ ක්‍රියාකාරකම් තෙආකාර වේ.

1. නිර්විනාශක තාක්ෂණය පිළිබඳ මිනිස් බලය පුහුණු කිරීම
2. නිර්විනාශක සේවා සැපයීම
3. සංවර්ධන ක්‍රියාකාරකම්

### ❖ නිර්විනාශක පරීක්ෂණ ක්ෂේත්‍රයේ මිනිස්බල පුහුණුව

නිර්විනාශක පරීක්ෂණ අංශය වාර්ෂිකව පුහුණු පාඨමාලා පවත්වන අතර එමගින් පුද්ගලික හා රජයේ ආයතන වල නිර්විනාශක පරීක්ෂණ විද්‍යාගාර අළුතින් ස්ථාපනය හෝ දැනට පවතින විද්‍යාගාර වැඩි දියුණු කිරීමට හැකියාව ලැබී ඇත. ඊට අමතරව මෙම ක්ෂේත්‍රයේ පුහුණු වූ අයට අධිකාරිය මගින් ලබා දෙන සහතික ජාත්‍යන්තරව පිළිගැනෙන නිසා පුහුණු වූ අයට ලංකාවේ මෙන්ම පිටරට ද රැකියා ලබා ගැනීමට හැකියාව ලැබී ඇත. මෙම පුහුණු පාඨමාලා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය හා ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය (ISO) මගින් අනුමත කරන ලද විෂය මාලාවකට අනුකූලව පැවැත්වේ.

2012 වසරේ දී නිර්විනාශක පරීක්ෂණ පුහුණු පාඨමාලා සඳහා පුද්ගලයන් 210 දෙනෙක් සහභාගි වූ අතර එමගින් රු.3,608,528.00 ක (බදු ඇතුළුව) ආදායමක් උපයන ලදි.

| වර්ෂය | සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|
| 2006 | 101 |
| 2007 | 95 |
| 2008 | 107 |
| 2009 | 168 |
| 2010 | 186 |
| 2011 | 249 |
| 2012 | 210 |




**5.1 රූපය : පුහුණු පාඨමාලාවලට සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව**

### ❖ නිර්විනාශක පරීක්ෂණ සේවා සැපයීම

කාර්මික ක්ෂේත්‍රයේ සිදුවන හදිසි බිඳ වැටීම් නතර කිරීමටත් ඒවායේ ආරක්ෂාව හා එහි නිෂ්පාදනයන් හි ගුණාත්මක බව වැඩි දියුණු කිරීමටත් එම කර්මාන්තයන් හි යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපාංග වල ඇති වන දෝෂ නිර්ණය කිරීමටත් පරමාණුක ශක්ති අධිකාරිය සේවා සපයයි.

2012 වසරේ දී අධිකාරිය නිර්විනාශක පරීක්ෂණ සේවා 130 ක් සැපයූ අතර රු. 8,507,067.16 (බදු ඇතුළුව) උපයන ලදි.

| වර්ෂය | නිර්විනාශක |
|---|---|

| | පරීක්ෂණසේවා සංඛ්‍යාව |
|---|---|
| 2006 | 70 |
| 2007 | 84 |
| 2008 | 89 |
| 2009 | 100 |
| 2010 | 124 |
| 2011 | 114 |
| 2012 | 130 |
| | 130 |




5.2 රූපය : සපයන ලද නිර්විනාශක පරීක්ෂණ සේවා

| වර්ෂය | ආදායම (බදු ඇතුළුව)රු. |
|---|---|
| 2006 | 1,280,846.60 |
| 2007 | 1,613,998.70 |
| 2008 | 3,291,833.61 |
| 2009 | 2,563,970.58 |
| 2010 | 4,985,180.23 |
| 2011 | 4,131,592.25 |
| 2012 | 8,507,067.16 |




5.3 රූපය: නිර්විනාශක පරීක්ෂණ සේවා වලින් උපයන ලද මුළු ආදායම




2012 වසරේ දී නිර්විනාශක පරීක්ෂණ
12,115,595.16 (බදු ඇතුළුව)

| වර්ෂය | මුළු ආදායම බදු මුදල ඇතුළුව |
|---|---|
| 2006 | 1,934,477.85 |
| 2007 | 2,265,617.45 |
| 2008 | 4,916,228.61 |
| 2009 | 4,663,219.94 |
| 2010 | 7,270,198.63 |
| 2011 | 6,586,538.65 |
| 2012 | 12,115,595.16 |




රූපය : 5.4.2 මුළු ආදායම (බදු ඇතුළුව)

රූපය :5.4.1 මුළු ආදායම (බදු ඇතුළුව)

## ❖ සංවර්ධන ක්‍රියාකාරකම්

අ) නිර්විනාශක පරීක්ෂණ ශිල්පීන් සහතික කිරීමේ ආයතනයක් බිහිකිරීම (සී.බී. එන්.ඩී.ටී.)

මෙහිදී අධිකාරිය ජාත්‍යන්තර ප්‍රමිති ආයතනයේ (ISO 9712) ප්‍රමිතියට අනුකූලව පුහුණුව ලත් නිර්විනාශක පරීක්ෂණ ශිල්පීන්ගේ අවශ්‍ය සුදුසුකම් හා අත්දැකීම් සලකා බලා ඔවුන් සහතික ලත් පුද්ගලයන් බවට පත් කිරීමේ ක්‍රම වේදයක් ස්ථාපනයකරන ලදි. ඒ අනුව නිර්විනාශක පරීක්ෂණ සඳහා පුද්ගලයන්ගේ සුදුසුකම් හා සහතික කිරීම ISO/IEC 17024 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව පුද්ගලයන් සහතික කිරීම පිළිබඳ ක්‍රියාත්මක වන ආයතන වල සාමාන්‍ය අවශ්‍යතාවයන් නිර්විනාශක පරීක්ෂණ අංශය මගින් සම්පූර්ණ කරන ලදි.

මෙම නිර්විනාශක පරීක්ෂණ ශිල්පීන් සහතික කිරීමේ ඒකකයේ අරමුණ වන්නේ, නිර්විනාශක ශිල්පීන් සඳහා සහතික කිරීමට අවශ්‍ය පද්ධති හා සුදුසුකම් ඇතුලත්ව, එම පාඨමාලාවල සංයුතිය හා ක්‍රියාකාරීත්වය සඳහා සැලසුම් හා මූලාමය සංවර්ධනයයි. මෙම නිර්විනාශක සහතික නිකුත් කිරීමේ ඒකකය ප්‍රතීතනය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු දැනටමත් සම්පූර්ණ කෙරෙමින් පවතී.

ආ) නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපනය (NCNDT)




**රූපය :5.5 යෝජිත නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානය**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ පරමාණුක ශක්ති අධිකාරියේ නිර්විනාශක පරීක්ෂණ අංශය, අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන “ජාතික නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානයක්” ලෙස 2014 වර්ෂය වන විට වෙනම ස්ථානයක ස්ථාපනය කිරීමයි.

මෙම යෝජිත මධ්‍යස්ථානය අවශ්‍ය උපකරණ සහිත ප්‍රතීතනය ලත් විද්‍යාගාර සහිතව ජාත්‍යන්තර මට්ටමට දියුණු කිරීමට බලාපොරොත්තු වේ. නිර්විනාශක අර්ධ නිර්විනාශක හා විනාශකාරී පරීක්ෂණ සේවා ලබා දෙන්නාවූත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ යාන්ත්‍රික හා රසායනික පරීක්ෂණ සේවා ලබා දෙන කලාපීය සියළු නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථාන හා තරග කළ හැකි සේවා දායකයකු බවට පත්කිරීමට අධිකාරිය බලාපොරොත්තු වේ. මෙහිදී මෙම මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රයේ තත්වය හා ඵලදායිතාවය වැඩි කිරීම සඳහා කොන්ක්‍රීට් පරීක්ෂණ තාක්ෂණය ඇතුළු සියළු නිර්විනාශක පරීක්ෂණ ක්‍රමවේදයන් නිෂ්පාදන

ක්‍රියාවලියට එක් කිරීම මෙන්ම ඒ සඳහා අවශ්‍ය හැකියාවන් ගෙන් යුක්ත ජාත්‍යන්තර මට්ටමේ ශිල්පීන් නිර්මාණයටත් බලාපොරොත්තු වේ.

මෙම නව මධ්‍යස්ථානය හරහා ගොඩනැගිලි ක්ෂේත්‍රයේ,කාර්මික ක්ෂේත්‍රයේ රක්ෂණ ක්ෂේත්‍රයේ එතෙර රැකියා නියෝජිතයන්, වෙල්ඩින් විශේෂඥයන්, ශ්‍රී ලංකාවේ නිර්විනාශක සංගමය, ජාත්‍යන්තර නිර්විනාශක පරීක්ෂණ කමිටුව යනාදී විවිධ ක්ෂේත්‍රවල පුද්ගලයන් සම්බන්ධීකරණය කිරීමට හැකියාව ලැබෙනු ඇත. මෙම ව්‍යාපෘතියේ අවසාන පරමාර්ථය වන්නේ වසර කිහිපයකින් පසු පාඩු නොලබන සාඩම්බරයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බවට පත්වීමයි.

මෙහි ස්ථාපනයට, සේවා සැපයීමට, බලාපොරොත්තුවන තාක්ෂණික ක්‍රම වේදයන් වශයෙන් සාමාන්‍ය නිර්විනාශක පරීක්ෂණ ක්‍රම (RT,UT, MT,PT, හා ET) හා කොන්ක්‍රීට් පරීක්ෂාව, නිර්විනාශක පරීක්ෂාවට අදාල යාන්ත්‍රික හා රසායනික පරීක්ෂාව, වෙල්ඩින් යනාදී තාක්ෂණික ක්ෂේත්‍ර හඳුන්වා දිය හැක.

ප්‍රධාන විද්‍යාගාරයේ ගොඩනැගිල්ල ( කොටස) දැනට ඉදිවෙමින් පවතී. 2013 ඔක්තෝම්බර් මාසය වන විට ඉදිකිරීම සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන අතර 2014 පළමු කාර්තුවේ දී වාණිජ ක්‍රියාකාරීත්වයන් ඇරඹීමට බලාපොරොත්තු වේ.



**රූපය :5.6 නිර්විනාශක පරීක්ෂණ විද්‍යාගාරය ඉදිවන අයුරු**

මෙයට අමතරව උපකරණ, විශේෂඥ සේවා හා පුහුණු වීම් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ SRL 1007 ව්‍යාපෘතිය (නිර්විනාශක පරීක්ෂණ කේන්ද්‍රස්ථානයක් ස්ථාපනය මගින් නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණය සවිමත් කිරීමේ ව්‍යාපෘතිය) යටතේ ලැබේ.

1.ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ විශේෂඥ ආචාර්ය ඒ.එන්.බී. ඊබ්‍රාහීම් (මැලේසියානු ජාතික) චුම්භක අංශු පරීක්ෂාව 3 වන අදියර පිළිබඳව පාඨමාලාවක් කිරීමට ලංකාවට පැමිණියේය.



2. අධිකාරියේ නිර්විනාශක කාර්යය මණ්ඩලයට ඔවුන්ගේ තත්ව සහතික කිරීමේ (NDT Inspection Body as per ISO 17020)කාර්යාවලියට උපකාර කිරීම සඳහා ආචාර්ය ඒ.ඒ. ඛාන් මහතා (පකිස්තානයේ හිටපු ජොෂ්ඨ විද්‍යාඥ හා දැනට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ විශේෂඥ) අධිකාරියට පැමිණියේය.



**රූපය : 5.8 අධිකාරියේ නිර්විනාශක පරීක්ෂණ කාර්යමණ්ඩලය හා ආචාර්ය ඒ. ඒ. ඛාන් මහතා**

# 6. විකිරණ පිරිසැකසුම් අංශය

ව්‍යාපෘතියේ නම “කාර්මික හා කෘෂිකාර්මික යෙදීම් සඳහා ස්වභාවික බහු අවයවීක ප්‍රවිකිරණය”
ව්‍යාපෘති අංකය :RAS/8/109
ව්‍යාපෘතියේ ඉලක්ක: කෘෂිකාර්මික පාරසරික හා කාර්මික යෙදීම් සඳහා ප්‍රවිකිරණය කල හරිත නිෂ්පාදන

## 6.1. විකිරණ පිරිසැකසුම් අංශයේ දායකත්වය

මෙම අංශය ගැමා විකිරණ යොදාගෙන ආම්ලික මාධ්‍යයේ දී ඔලිගොකයිටොසාන් මගින් ස්වභාවික ශාඛ වර්ධකයක් හා දිලීර නාශකයක් නිෂ්පාදනය කලේය. මෙසේ නිෂ්පාදිත විශාල පරිමාණයේ සාම්පලයෙන් විවිධ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් ගෙන තක්කාලි, බණ්ඩක්කා, මාළුමිරිස් විවිධ

භෝග මත පරීක්ෂා කරමින් ඉලක්කයට අනුව අදාල ලක්ෂණ සඳහා වඩා සුදුසුම සාන්ද්‍රණය නිර්ණය කරන ලදී.පරීක්ෂා කරන ලද යෙදීම් පහත දැක්වේ.

T1 : ඇට සඳහා 300 ppm මිශ්‍රණය (ඔලිගොකයිටොසාන්) දිලීර නාශක මිශ්‍රණය +600ppm මිශ්‍රණය ඉසීම හා (ඔලිගොකයිටොසාන් හා කයිටොසාන් දිලීර නාශකය)

T2 : ඇට වලට 300 ppm ඔලිගොකයිටොසාන් T3 + විකල්පයක් ලෙස 300ppm ඔලිගොකයිටොසාන් Type 03 හා 600 ppm කයිටොසාන් දිලීර නාශක යෙදීම

T3 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශය (පාලකය)

T4 : ඇටවලට ඔලිගොකයිටොසාන් 300ppm මිශ්‍රණය හා කයිටොසාන් දිලීර නාශකය + විකල්ප වශයෙන් 600ppm කයිටොසාන් දිලීර නාශකය යෙදීම.

මෙම යෙදීම් වල කාර්යක්ෂම භාවය නිර්ණය සඳහා 2012 වසරේ දී ගොවිපළ වලදී ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදුකරන ලදි. (IAEA/RCA Project – RAS /8/109 යටතේ) මෙහිදී පහත සඳහන් ආයතන වල සහභාගීත්වය ද ලබා ගන්නා ලදි.

1. ගෙවතු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI), ගන්නොරුව, පේරාදෙණිය
2. සහල් පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රය (RRRDI) බතලගොඩ හා ඉබ්බාගමුව
3. කලාපීය සහල් පර්යේෂණ හා සංවර්ධන කේන්ද්‍රය (RRRDC) බෝඹුවල

## මෙම පර්යේෂණ වලින් ලබා ගන්නා ලද ජයග්‍රහණ

HORDI (ගෙවතු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය):

තක්කාලි, බණ්ඩක්කා, මාළු මිරිස් වගා සඳහා වඩා සුදුසුම හා වඩා කාර්යක්ෂමව ඔලිගොකයිටොසාන් යෙදීම පිළිබඳ පර්යේෂණ කිරීමට එම ශාඛාවල ඇට වලට විවිධ ඔලිගොකයිටොසාන් හා කයිටොසාන් දිලීර නාශක යොදන ලදී. කරන ලද පරීක්ෂණ වලින් යෙදීම 1 (T1), යෙදීම 2 (T2) හා යෙදීම 4 (T4) , යෙදීම 3 (T3) ට වඩා සුදුසු බව තෝරා ගන්නා ලදී.

තක්කාලි (පත්මා, තිළිණ ප්‍රභේද)

මෙම ආයතනයේ අරමුණ වූයේ තක්කාලි ශාඛයේ ව්‍යාධි පාලනය, අස්වැන්න, ගෙඩි මත කයිටොසාන් වල බලපෑම නිර්ණයයි.

ඔලිගොකයිටොසාන් හා කයිටොසාන් දිලීර නාශකය විවිධ මිශ්‍රණ ( T1,T2) පත්මා තිළිණ ප්‍රභේද වල තක්කාලි ඇට වලට ඉසින ලදුව එමගින් ඇතිවන ශාඛ වල ව්‍යාධි පාලනය, අස්වැන්න එම තක්කාලි ඵල වල තත්වය මත ඇතිවන බලපෑම නිර්ණය කෙරිණි. මෙම ඉහත කී මිශ්‍රණය විවිධ කාල පරාශ ඇතුලත දී ගොවිපොලවල් දෙකක දී (බන්ඩාරවෙල ගොවිපොල හා HORDI පර්යේෂණ ක්ෂේත්‍රයේ දී) ඉසින ලදි. අනතුරුව රෝග ඇතිවීමේ දර්ශකය, ප්‍රවණතාව හා අස්වැන්න මත බලපෑම ආදිය පිළිබඳ දත්ත එකතු කරන ලදී. එහිදී පහත සඳහන් නිගමණ ස්ථිර විය.

- පාලකය හා සසඳන විට ඉහත යෙදීම් සියල්ලම බැක්ටීරියා මගින් ඇතිවන ව්‍යාධිය පාලනය (Bacteria wilt) හා තක්කාලි කොළ කොඩ වීමේ ව්‍යාධිය යන දෙකටම එක හා සමානව යහපත් ප්‍රතිචාර ඇතිකරන බව දක්නට ලැබිණි.
- T1 යෙදීම (නව මිශ්‍රණය) මගින් TOA නිර්දේශිත T3 මිශ්‍රණයට වඩා තක්කාලි ශාඛයේ ඵලදාව ඉහල නංවන බව
- T1 හා T2 මිශ්‍රණ වර්ග දෙක මගින් ව්‍යාධි පාලනය එකසේ කාර්යක්ෂමව සිදු කරන බව
- T1 හා T2 යෙදීම් දෙකම මගින් තක්කාලි අස්වැන්න එකම ආකාරයට කාර්යක්ෂමව වැඩි

  කරන බව







**6.1** රූපය : කයිටොසාන් නොයොදන ලද තක්කාලි ශාඛය

**6.2** රූපය : කයිටොසාන් යොදන ලද තක්කාලි ශාඛය

මෙම අධ්‍යානයේ අරමුණ වූයේ ව්‍යාධි පාලනය, අස්වැන්න හා මාළු මිරිස් කරලේ ගුණාත්මක භාවය මත කයිටොසාන් වල බලපෑම් නිර්ණයයි.

ඔලිගොකයිටොසාන් හා කයිටොසාන් දිලිර නාශක මිශ්‍රණ (T1, T2)විවිධ ආකාරයට මාළු මිරිස් කරලේ ඇති ඇට වලට ඉස එම මිශ්‍රණ ඉසීම මගින් එම ඇට වලින් ලබා දෙන ශාඛ වල ව්‍යාධි පාලනය, අස්වැන්න වැඩි කිරීම හා ශාඛ වල (මාළු මිරිස් කරල්වල) ගුණාත්මක තත්වය වැඩි කිරීමට කාර්යක්ෂමතාව සොයන ලදී. දින හතක කාලපරිච්ඡේද වලින් කිහිප වතාවක් ගොවිපලවල් දෙකකදී (බණ්ඩාරවෙල ගොවිපල හා HORDI පර්යේෂණ ක්ෂේත්‍රයේ) මෙම මිශ්‍රණ ඉසින ලදී. ව්‍යාධි දර්ශකය □□□□ (Anthracnose ව්‍යාධි නාශකය) හා අස්වැන්න මත ඇතිවන බලපෑම පිළිබඳ දත්ත එක් රැස් කරන ලදී

එහිදී ස්ථිර වූයේ

- සියළු යෙදීම් (ඔලිගොකයිටොසාන් හා කයිටොසාන් යෙදීම් T1, T2) මගින් ශාඛයේ අස්වැන්න වැඩි කිරීම කාර්යක්ෂමව සිදු කරන ලද බව
- සියළු යෙදීම් (T1, T2) මගින් ඇට පැළවීම හා ව්‍යාධි පාලනය කාර්යක්ෂමව (Anthracnose ව්‍යාධි) සිදුකෙරෙණි.
- DOA නිර්දේශයට වඩා කයිටොසාන් යෙදීම් අස්වැන්න වැඩි කිරීමට හේතු වේ.





**6.3** රූපය: ඔලිගොකයිටොසාන් ඉසින ලද මාළු මිරිස් වගාව

**6.4** රූපය : කයිටොසාන් ඉසින ලද ශාකය

මෙම අධ්‍යනයේ මූලික අරමුණ වූයේ කයිටොසාන් මගින් බණ්ඩක්කා ශාකයේ පලිබෝධය පාලනය, ශාකයේ වර්ධනය වැඩි දියුණු කිරීම හා අස්වැන්න වැඩි කිරීම පිළිබඳ කාර්යක්ෂමතාව නිර්ණයයි.

මේ සඳහා මෙම ශාකයේ "හරිත" ප්‍රභේදයේ ඇට වලට ඔලිගොකයිටොසාන් හා කයිටොසාන් දිලීර නාශකය විවිධ ප්‍රමාණ වලින් (T1,T2,T4) ඉස ඇට වලින් පැළ වන ශාක වල පලිබෝධ පාලනය, ශාකයේ වර්ධනය හා අස්වැන්න දියුණු කිරීමේ කාර්යක්ෂමතාව බලන ලදී. මෙසේ ඉසීම දින 7 ක කාලපරිච්ඡේද කිහිපයක් තුලදී (බන්ඩාරපොල වගා පොල හා HORDI ආයතනයේ පර්යේෂණ ක්ෂේත්‍රයේ) සිදුකොට එම ශාකවල රෝග දර්ශකය ( පවුඩරි මිල්ඩිව් ආසාදන සඳහා) හා අස්වැන්න පිළිබඳ දත්ත කර ගන්නා ලදී.

- T1,T2,T4 යන යෙදීම් සියල්ල බන්ඩක්කා ශාකයේ අස්වැන්න වැඩි කිරීම සිදුකරයි.
- T1 (වාණිජ නිෂ්පාදන) පවුඩරි මිල්ඩිව් රෝගය පාලනය අතින් විශිෂ්ඨය.



**6.5** රූපය: බන්ඩක්කා ශාකයේ පවුඩරි මිල්ඩිව් රෝගය



**6.6** රූපය: නිරෝගී බන්ඩක්කා ශාකය

## 6.2. කයිටොසාන් ආදේශිතය වාණිජකරණය

ගොවිපොල වල් වල සිදුකරන ලද පර්යේෂණ වලින් ඔලිගොකයිටොසාන් වල මෙම නව මිශ්‍රණය ශාක වර්ධකයක් හා පලිබෝධ /දිලීර නාශකයක් සේ ගෙවතු භෝග (විශේෂයෙන් තක්කාලි, මාළු මිරිස් හා බන්ඩක්කා) සඳහා යොදාගතහැකි බව තීරණය විය.



6.7 රූපය: ශාඛ වර්ධක සාම්පල

## 6.3. **සහල්** ( Bg 352, Ld 356, Bg 300)

මෙම අධ්‍යනයේ අරමුණ වූයේ ප්‍රවිකිරණය කළ කයිටීන් යම් ප්‍රමාණයක් යෙදූ විට විවිධ ප්‍රදේශ වල වැවෙන ගොයම් ශාඛ වල වර්ධනය, පළිබෝධකයන් අස්වැන්න මත බලපාන ආකාරය නිර්ණයයි.

කලාපීය සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය (RRRDC), බොඹුවල මගින් ක්ෂේත්‍රයේ දී පහත සදහන් රෝග සඳහා අත්හදා බැලීම් සිදුකරන ලදි.

- කොළ කොඩ වීමේ රෝගය (**Pricularia grisea**)
- Rice sheath blight disease (Rhizoctonia solani)
- ශාඛ ඇට දුර්වල වීම (Fusarium, Cuvularia, Helminthosporium)

විවිධ මිශ්‍රණ යොදා ගනිමින් (පාලක සහිතව) RRRDC බොඹුවල, ගොවිපොල වලදී කුඹුරට වී ඉසු පසු සති 3,6,9 කාල පරාස වල කයිටොසාන් ඔලිගොමර් (600 ppm) යොදා ගොවින් පර්යේෂණ සිදු කරන ලදි. ශාඛයේ උස, මුල් වල දිග ශාඛයේ වියලි බර, ඇට දුර්වර්ණ වීම හා අස්වැන්න (වී ඇට වල) ආදිය පරීක්ෂා කරන ලදි.

## 6.4. වී පර්යේෂණ සංවර්ධන ආයතනය (RRDI) බතලගොඩ

RRDI, බතලගොඩ දී ඔලිගොකයිටොසාන් යොදා ගනිමින් වී වගාව පිළිබදව පහත සදහන් අත්හදා බැලීම් සිදුකරන ලදි. ඔලිගොකයිටොසාන් 3% ක් මෙහිදී යොදාගන්නා ලදි.

- වී පැල තවාන වලදී එවායේ වර්ධනය හා සම්බන්ධ සාධක (උස, වියලි බර ආදිය) අස්වැන්න හා අස්වැන්නට බලපාන සාධක හා පලිබෝධකයන් හා රෝග පිළිබද දත්ත එකතු කර ගන්නා ලදි.
- ආයතන දෙකේම ප්‍රථිඵලවලින් ඔලිගොකයිටොසාන් යෙදීම් කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් යෝජිත යෙදීම් මෙන්ම, සුදුසු බව නිර්ණය විය.

  මේ නිසා මෙම නව නිෂ්පාදනය රටේ විශාල වශයෙන් භාවිතා වන රසායනික යෙදීම් වෙනුවට ආදේශිකයක් ලෙස යොදා ගත හැකිවන අතර විශේෂයෙන් රටේ බොහෝ කෘෂිකාර්මික ප්‍රදේශවලින් වාර්තා වන නොයෙකුත් සෞඛ්‍ය ගැටළු නිරාකරණයට මෙමගින් හැකි වනු ඇතැයි සිතිය හැක.

## 6.5. **ඩ්‍රැගන් ෆෘට්**

ඩ්‍රැගන් ෆෘට් සම්බන්ධයෙන් කරන ලද අත්හදා බැලීම් වලින් ඔලිගොකයිටොසාන් ආදේශිතය (ශාඛ ආරක්ෂකය) මගින් ඩ්‍රැගන් ෆෘට් වල රෝගයක් වන “ස්ටෙම් ස්පොට්” රෝගය මැඩීමට (මෙම රෝගයට හේතු වන්නේ ව්‍යාධිජනකයකි) සමත් බව නිර්ණය විය. මෙම අධ්‍යන පාදක





කොට ගෙන සිදුකරන ලද අත්හදා බැලීම් වලින් මෙම නව ශාබ ආරක්ෂකයේ හැකියාව නිර්ණය කරන ලදි. අධිකාරිය මේ නිසා ඩ්‍රැග්න් ෆෲට් වගා කරුවන්ගේ සංගමය හා එකතුව මෙම නිෂ්පාදන පරීක්ෂා කිරීමට අවබෝධතා ගිවිසුමකට අත්සන් කරන ලදී.

**රූපය 6.8 : සභාපති, පරමාණුක ශක්ති අධිකාරිය හා ඩ්‍රැගන් ෆෲට් වගාකරුවන් ගේ සංගමයේ අධ්‍යක්ෂ (වෙළඳ හා ක්‍රියාකාරී) ජයන්ත ගමගේ මහතා අවබෝධතා ගිවිසුමට අත්සන් තබමින් .**

ගපුර

[illegible] දීමට අවශ්‍ය කටයුතු සිදු කොට රටේ සියළුම ඩ්‍රැගන් ෆෲට් වගා කරුවන්ට නිර්දේෂ කිරීමට පෙර ක්ෂේත්‍ර අත්හදා බැලීම් දැනට සිදු කෙරේ.



**රූපය. 6.9 : අධිකාරියේ විකිරණ පිරිසැකසුම් පරීක්ෂණාගාරයේ දී කයිටීන් ආදේශිතය විශාල වශයෙන් නිෂ්පාදනය.**

## 6.6. [illegible]


1. Mithrasena Y.J.P.K., Silva J.N. , Adikari A.A.W.P., Gunawardena U.K.D.N., Kulatunga S.S. , De Silva K.R.C. and Dissanayaka. C.K. (2010) Management of Sheath blight disease causal organism Rhizoctonia solani in rice by using irradiated Chitosan., *Fifth Asian Biotechnology and Development Conference*15-17 December 2010, Sri Lanka. 41p

2. Mithrasena Y.J.P.K., Silva J.N. , Kulatunga S.S. , De Silva K.R.C. , Dissanayaka C.K. and Wijesundera R.L.C.(2011) Use of irradiated chitosan to manage the important rice diseases in Sri

Lanka, *International conference on Biotechnology for Better tomorrow*. 6-9 February, 2011, India. 26p

3. Mithrasena, Y.J.P.K., Silva J.N, Gunawardana U.K.D.N., Kulathunga S.S., De silva K.R.C & Dissanayaka C.K.(2012) use of irradiated Chitosan to manage rice grain discolouration disease in Sri Lanka. Sri Lanka- India conference on agro biotechnology for sustainable development 42p.

## 6.7. බහු කාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය ස්ථාපනය (MGIF)

ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරයේ ජල තටාංගණයේ තැම්පත් කරන උපාංග ආචාර්ය මැන්ප්‍රෙඩ් ෆරෙන්සල් මහතාගෙන් ලැබුණි. මොරටුව විශ්ව විද්‍යාලයේ හා අධිකාරියේ නිළධාරීන් (දේශීය උපදේශකයන්) එකමුතුව මෙම කොටස් පරීක්ෂා කරන ලදි. මෙම කොටස් කාර්මික තාක්ෂණික ආයතනයේ දී, තවදුරටත් පරීක්ෂා කිරීම සිදුකරන ලදී. එමෙන්ම විශේෂඥයන් ගේ නිර්දේශය මත අධිකාරිය විසින් තවදුරටත් පරීක්ෂා කරන ලදි. අධිකාරිය මධ්‍යම ඉංජිනේරු කාර්යංශය (CECB), කාර්මික තාක්ෂණ ආයතනය (ITI) , SYMEC, IAEA හා මොරටුව විශ්ව විද්‍යාලය යන ආයතන වල නියෝජිතයන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂ සමග තවදුරටත් සාකච්ඡා කරන ලදි. ඉංජිනේරු ආයතනයේ අධීක්ෂණය යටතේ ඉහත සඳහන් කොටස් අත්තිවාරම උඩ තැම්පත් කරන ලදි. (මේ නිසා සිවිල් කොන්ත්‍රාත්කරුවාට ගොඩනැගිල්ල තැනීමට හැකියාව ලැබේ)

MGIF ව්‍යාපෘතියට අවශ්‍ය පහත සඳහන් කාර්ය මණ්ඩල (විද්‍යාත්මක නිළධාරීන්) සාමාජිකයන් බඳවා ගන්නා ලදි.

තත්ව පාලක, ක්ෂුද්‍ර ජීවී විද්‍යාඥ හා ආහාර තාක්ෂණ ශිල්පියෙක් මෙසේ බඳවා ගන්නා ලද අතර නව සාමාජිකයන් සඳහා අවශ්‍ය පුහුණුව අධිකාරියේ ද ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා කාර්මික තාක්ෂණික ආයතනය යන ආයතන වල දී ලබා දෙන ලදි.

තතවයෙන් උසස් ලෙස ගොඩනැගිල්ල සෑදීම පිණිස PMU, AEA, CECB හා සියරා ආයතන වල නියෝජිතයන් ගොඩනැගිල්ල පරිශ්‍රයේ දී එම අදාල කටයුතු වල නිරත නිළධාරීන් හා අනෙකුත් අය සඳහා දේශන පවත්වන ලදී. අධිකාරියේ නිළධාරීන් තාක්ෂණික පර්යේෂණ ආයතනයේ පවත්වන ලද රැස්වීම් වලට සහභාගි විය. මෙම රැස්වීම් වලදී MGIF ව්‍යාපෘතිය හා සම්බන්ධ ප්‍රශ්න සාකච්ඡා කරන ලදි. ව්‍යාපෘති කළමණාකරු සමග ව්‍යාපෘතියේ ප්‍රගතිය සාකච්ඡා කරනකරන ලදි.

කළමණාකරන සේවා මණ්ඩලය, භාණ්ඩාගාරය, අමාත්‍යාංශයේ ජොෂ්ඨ නිළධාරීන් , අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් හා අධිකාරියේ (සභාපතිතුමා, විධායක අධ්‍යක්ෂ, අංශ ප්‍රධාන කාර්මික අංශය හා අංශ ප්‍රධාන විකිරණ පිරිසැකසුම් අංශය) නිළධාරීන් සමග ව්‍යාපෘතියේ ප්‍රගතිය හා එයින් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ සාකච්ඡා කිරීමට 2012 ජූනි 08 වැනි දින විශේෂ රැස්වීමක් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ දී පවත්වන ලදි.

MGIF හා සම්බන්ධ අදාල ද්‍රව්‍ය වල මිල ගණන් ඉහල යෑම පිළිබඳ සාකච්ඡාවක් තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශයේ දී අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. Symec Engineers (India) Pvt Ltd.ආයතනයේ අයද මීට සහභාගි විය. මේ හා සම්බන්ධ විශේෂ කමිටුවක් පත් කොට සාකච්ඡා කරන ලදි.

ඉහත කරුණ පිළිබඳව සාකච්ඡා කිරීමට ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් අමාත්‍යාංශයේ දී Symec Engineers (India) Pvt Ltd. හි නියෝජිත චම්පක්වාස් මහතා සමග පැවැත්විණි.

අධිකාරිය CECB , Sierra හා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය, Symec, India යන ආයතන වල නියෝජිතයන්ගෙන් සමන්විත විශේෂ නියෝජිත පිරිසක් MGIF හි ස්ථාපනය කිරීමට නියමිත යන්ත්‍ර අධීක්ෂණය කිරීමට 2012.10.22 -2012.10.29 දක්වා ඉන්දියාවේ චාරිකාවක නිරත විය.

MGIF යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකරවන්නන් දෙදෙනෙක් බඳවා ගන්නා ලදි. MGIF නිළධාරීන් විකිරණමිතිය සම්බන්ධව දැනුවත් කිරීමට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ආචාර්ය ටකුජි කොජිමා ලංකාවට පැමිණ එම චාරිකාව සාර්ථකව නිම කලේය.

ජා.ප.ශ.නියොජිතායතනයේ තවත් විශේඥයකු වන ආචාර්ය එස් සබ්හාර්වාල් ද ලංකාවට පැමිණි අතර එම විශේෂඥ චාරිකාවෙන් පහත අරමුණු ඉටුවිය.

❖ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය නිර්ණය

❖ MGIF හා සම්බන්ධ ජා.ප.ශ නියෝජිතායතනයේ ව්‍යාපෘතිය තවදුරටත් දීර්ග කිරීම හා සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳව සැලකිල්ලට ගැනීම.

2014-2015 වන ඊලඟ ව්‍යාපෘති චක්‍රයට අවශ්‍ය වන ආකාරයට ව්‍යාපෘති ක්‍රියාකාරකම් සැලසුම් කිරීම වෛද්‍ය උපකරන නිෂ්පාදනය හා අපනයනය කරන දේශීය නිෂ්පාදනයන්, ආහාර නිෂ්පාදනය හා අපනයනය කරන දේශීය නිෂ්පාදකයන් ආදී කර්මාන්තකරුවන් දැනුවත් කිරීම සඳහා ජා.ප.ශ.නියෝජිතායතනයේ විශේෂඥ ආචාර්ය ඉවොන් කලුස්කා ගේ සහාය ඇතිව වැඩසටහනක් පවත්වන ලදී. මෙම දැනුවත් කිරීමේ වැඩසටහනේ අරමුණ වූයේ MGIF ව්‍යාපෘතිය සඳහා පාරිභෝගිකයන් වැඩිකර ගැනීම, දේශීය නිෂ්පාදකයන් ප්‍රවිකිරණ තාක්ෂණය පිළිබඳව හා එහි පුළුල් යෙදීම් පිළිබඳව දැනුවත් කිරීමයි.

## 7. ජෛව විද්‍යාත්මක අංශය

ජෛව විද්‍යාත්මක අංශය අධිකාරියේ න්‍යෂ්ටික විශ්ලේෂණ කටයුතු ස්ථාපනය කරමින් මූලික වශයෙන් එම තාක්ෂණය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා යොදා ගනී. මෙම අංශය න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා ඒකකය, සෞඛ්‍ය හා පාරිසරික අධ්‍යයන ඒකකය හා න්‍යෂ්ටික කෘෂිකාර්මික ඒකකය යන ඒකක වලින් සමන්විත වේ. තවද ජෛව විද්‍යාත්මක අංශය න්‍යෂ්ටික හා අනෙකුත් අදාල විශ්ලේෂණ ක්‍රම යොදා ගනිමින් ආනයන හා අපනයන ක්ෂේත්‍රයට, කාර්මික ක්ෂේත්‍රයට, පර්යේෂණ හා අධ්‍යාන ආයතන වලට සේවා සපයයි. 2012 වර්ෂයේ දී ඉහත කී ක්ෂේත්‍ර වලට සේවා සපයමින් සාම්පල 7000 ක් විශ්ලේෂණය කර රු. මිලියන 32 ක ආදායමක් උපයන ලදි. අධිකාරියේ මුළු ආදායමින් 70 % ක් මෙම අංශය මගින් ජනනය කෙරේ. වර්තමානයේ ජෛව විද්‍යාත්මක අංශය එහි සේවාවන් ප්‍රධාන විද්‍යාගාර 3ක් හරහා ලබා දේ. ගැමා වර්ණාවලික්ෂ මිතික විද්‍යාගාරය, ඇල්ෆා වර්ණාවලික්ෂමිතික විද්‍යාගාරය හා එක්ස් කිරණ ප්‍රතිදීප්තිමිතික විද්‍යාගාරය යනු එම විද්‍යාගාර වේ. 2012 වසරේදී ජෛව විද්‍යාත්මක අංශය එහි සේවක සංඛ්‍යාව 09 සිට 12 දක්වා වැඩි කර ගනිමින් න්‍යෂ්ටික යෙදීම් වැඩිකර ගැනීම පිණිස පියවර ගන්නා ලදි.





රූපය 7.1: ජෛව විද්‍යාත්මක අංශය හි ආදායම

## 2.න්‍යෂ්ටික විශ්ලේෂක සේවා

### 2.1 ගැමා වර්ණාවලීක්ෂමිතිය යොදාගෙන සිදුකරන සේවා

2012 වසරේදී ආනයන අපනයන ක්ෂේත්‍රයට, දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයට හා පර්යේෂණ හා සංවර්ධන ආයතනවලට සේවා සපයමින් සාම්පල 7000 කට වඩා පරීක්ෂා කරන ලදි.

මෙම සාම්පල අතර කිරි ආහාර ආනයනික සහ අපනයන කෙරෙන තේ කොප්පරා ආදිය විය.මෙම සාම්පල ආනයනයට හා අපනයනයට ප්‍රථම අධිකාරියේ අනුමැතිය අවශ්‍ය වේ.මීට අමතරව කර්මාන්ත ක්ෂේත්‍රයේ සමහර විශේෂිත අයිතම හා පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයට අයත් සාම්පල ද විශ්ලේෂණය කරන ලදි. මෙම පරීක්ෂණ වල ප්‍රධාන අරමුණ මේවා විකිරණශීලීතාවයෙන් දූෂණය වී ඇත්දැයි පරීක්ෂා කිරීමයි. මෙම විශ්ලේෂණ සේවා මගින් 2012 වසරේ දී උපයන ලද මුළු ආදායම රු. මිලියන 32 කි.



රූපය 7.2 : අඩු විකිරණශීලී ගණක විද්‍යාගාරය මගින් උපයන ලද ආදායම




රූපය 7.3 : ගැමා වර්ණාවලීක්ෂමිතිය මගින් විශ්ලේෂණය කරන ලද සාම්පල සංඛ්‍යාව (2002-2012

2.2. ගැමා වර්ණාවලීක්ෂමිතිය යොදාගෙන සිදු කරන ලද පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්

අ) අධිකාරියේ අනිකුත් අංශ සමග එකමුතුව පාරිසරික විකිරණශීලී මට්ටම් අධීක්ෂණය කරන ලදි. මෙම ක්‍රියාකාරීත්වයේ අරමුණ නම් ලංකාවේ විකිරණශීලී මට්ටම් (පරිසරයේ ) මැන සිතියමක් ලෙස පිළියෙල කිරීමයි.

ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් එකතු කර ගන්නා ලද පස් හා ශාඛ සාම්පල 58 ක් ඒවායේ අඩංගු විකිරණශීලී ද්‍රව්‍ය සඳහා පරීක්ෂා කරන ලදී.

ආ) ෆුකුෂිමා අනතුරට පසු සාගර පරිසරය විකිරණශීලී ද්‍රව්‍ය වලින් දූෂණය වූවාදැයි දැන ගැනීමට සාගර පද්ධතිය අධීක්ෂණය

2011මාර්තු 11 වන දින ජපානයේ ෆුකුෂිමා න්‍යෂ්ටික බලාගාරයේ සිදුවූ අනතුරෙන් පසු විශේෂ වැඩ සටහනක් දියත් කරන ලදි. මෙම ක්‍රියාකාරකම අධිකාරිය, සාගර පාරිසරික ආරක්ෂණ අධිකාරිය ( MEPA), ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය (NARA) වැනි ආයතන සමග එකමුතුව සිදු කරන ලදි. ලංකාවේ සාගර හා වෙරළාසන්න පරිසරයේ අවසාදිත හා මුහුදු ජලය එක්රැස් කොට විකිරණශීලිතා සඳහා පරීක්ෂා කරන ලදී.ජාත්‍යාන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ RAS/7/021 කලාපීය ව්‍යාපෘතියේ සැලැස්මට අනුකූලව මෙම පරීක්ෂණ සිදු කරන ලදී. මෙම පර්යේෂණවල ඉලක්කය වූයේ ෆුකුෂිමා න්‍යෂ්ටික බලාගාර අනතුරෙන් ලංකාව අවට සාගර පද්ධතියට යම් බලපෑමක් ඇති

වූයේ දැයි නිර්ණයයි. බේරුවල, ත්‍රිකුණාමලය, මන්නාරම , කල්පිටිය හා ගල්කිස්ස යන ප්‍රදේශ වලින් මුහුදු ආසාදිත හා සාගර වල ජල සාම්පල රැස්කරන ලද අතර මෙම සාම්පල වල විකිරණශීලීතා මට්ටම් පිළිබඳ දත්ත දැනට ලබා ගෙන ඇත.



රූපය 7.4 : සාම්පල එක්රැස් කිරීම



රූපය 7.5:  LSD විද්‍යාගාරයේ දී සාම්පල පරීක්ෂා කිරීම

[illegible] සාම්පල කිහිපයක් ( පුල්මුඩේ හා නොරොච්චෝලයෙන් පරීක්ෂා කිරීමට ලබාදුන්) රතු වැස්සේ සාම්පල කිහිපයක් ජෛව විද්‍යාත්මක අංශය මගින් පාරිසරික සාධක හා සෞඛ්‍යමය සාධක සඳහා පරීක්ෂා කරන ලදී.

## 3. XRF/ TXRF තාක්ෂණය මගින් ලබා දෙන ලද විශ්ලේෂණ සේවා හා පර්යේෂණ හා සංවර්ධන ක්‍රියා කාරකම්

### 3.1 XRF / TXRF තාක්ෂණය මගින් ලබා දෙන ලද විශ්ලේෂණ සේවා

XRF තාක්ෂණය යොදාගෙන විශ්ලේෂණය කොට රාජ්‍ය හා වාණිජ ආයතන කිහිපයකට සේවා සපයන ලදි. මෙමඟින් උපයන ලද මුළු ආදායම රු. 120,990.00 (වැට් ඇතුළුව) වේ. කෙසේ වෙතත් XRF / TXRF  පහසුකම 2012 මැද භාගයේ දී ක්‍රියා විරහිත වූ අතර ඉන් සේවා සැපයීමට බාධා ඇති විය.මෙම පද්ධතිය ක්‍රියා විරහිත වූ පසු පාරිභෝගිකයන් සඳහා සේවා සැපයීමට වෙනත් පද්ධතියක් නොවූ නිසා අඛන්ඩව සේවා සැපයීමට නොහැකි විය. කෙසේ වෙතත් XRF විශ්ලේෂක පද්ධතිය දැන් යථා තත්වයට පත් කර ඇත.

### 3.2 XRF / TXRF තාක්ෂණය යොදා ගෙන සිදු කරන ලද පර්යේෂණ හා සංවර්ධන ක්‍රියා කාරකම්

2012 වසරේ දී ඉහත කී ක්‍රියාකාරකම් බොහෝ දුරට අඩපණ විය. කෙසේ වෙතත් පද්ධතිය ප්‍රතිසංස් කරණය කර දැනට භාවිත කෙරේ.

වායු දූෂණ අධික්ෂණ වැඩ සටහන මධ්‍යම පරිසර අධිකාරියත් කාලගුණ දෙපාර්තමේන්තුවත් සමග එකතුව අඛණ්ඩව සිදුකරන ලදි. නුවර ප්‍රදේශයේ වායු දූෂණ මට්ටම් අධීක්ෂණය සඳහා කාලගුණ දෙපාරතමේන්තුවේ කටුගස්තොට ශාඛාවේ සාම්පල රැස් කිරීමේ ස්ථානයක් ස්ථාපනය කෙරිණි. සතියකට දෙවරක් සාම්පල රැස්කල අතර මෙම සාම්පල XRF තාක්ෂණය මගින් විශ්ලේෂණයට අධිකාරියට ලබා ගන්නා ලදී.මෙම වැඩ සටහනට ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ IAEA/ RAS /7/023 නම් කලාපීය ව්‍යාපෘතියේ (න්‍යෂ්ටික විශ්ලේෂණ තාක්ෂණය යොදා ගෙන වායු ගෝලීය දූෂණය අධීක්ෂණය) සහාය ලැබේ.

TXRF උපකරණය ප්‍රතිසංස්කරණය කල පසු ශ්‍රී ලාංකිකයන් විසින් ආහාරයට ගන්නා සහල් හා අනෙකුත් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය වල අඩංගු අහිතකර විය හැකි මූලද්‍රව්‍ය වල සාන්ද්‍රණයන් අධ්‍යනය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන ලදි.

**4. තත්ව සහතික කිරීම හා තත්ව පාලන වැඩ සටහන (QA/QC වැඩසටහන)**

ISO 17025 ප්‍රතීතනය ලැබීම පරීක්ෂණ සිදුකරන ඕනෑම විද්‍යාගාරයකට ලබාගත හැකි උපරිම තත්වයයි. LLC (Low Level Counting Laboratory) විද්‍යාගාරය ISO / IEC - 17025 : 2005 ජාත්‍යන්තර තත්වයට අනුකූලව ක්‍රියාත්මක වන ප්‍රතීතනය ලත් විද්‍යාගාරයකි.පරීක්ෂණ සිදුකරන මෙවන් විද්‍යාගාරයක් ජාත්‍යන්තරව උපරිම තත්වය යටතේ ක්‍රියාත්මක වන විද්‍යාගාරයක් ලෙස පිළිගැනේ.

ජාත්‍යන්තර හා ජාතික QA /QC වැඩ සටහන අඛණ්ඩව ක්‍රියාත්මකකරමින් ජෛව විද්‍යාත්මක අංශයේ විද්‍යාගාර ප්‍රතීතනය ලබනු ඇත. මෙම විද්‍යාගාර නිරන්තරව ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ (SLAB) හා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ තක්සේරු කිරීම් හා අභ්‍යන්තර බාහිර විගණන වලට භාජනය වෙමින් එම ප්‍රතීතන තත්වය රකගනී. මෙමගින් මෙම පර්යේෂණාගාර වලින් ලබා දෙන ප්‍රථිපල වල තාක්ෂණික වටිනාකම හා පරීක්ෂණ ප්‍රතිපල වල නිරවද්‍යතාවය අඛණ්ඩව තහවුරු කෙරේ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය මගින් මෙම LLC (low Level Counting Lab) පර්යේෂණාගාරයේ ප්‍රතීතනය 27.02.2011 සිට 27.12.2012 දක්වා දීර්ග කර ඇත. (එම විද්‍යාගාරයේ සතුටුදායකත්වය මගින් මෙම ප්‍රතීතනය ලබා දී ඇත.)පස් අවසාදිත, ජලය, කිරි ආහාර, ශාඛමය ද්‍රව්‍ය, (තේ, පොල් හා ශාඛමය ඇට) හා වෙනත් ද්‍රව්‍ය (මාළු, බෙහෙත් ද්‍රව්‍ය, ඛණිජ වැලි ආදිය) වල මිනුම් කටයුතු සඳහා මෙසේ මෙම විද්‍යාගාරයේ ප්‍රතීතන තත්වය දීර්ග කර ඇත.

LLC විද්‍යාගාරයේ තත්ව පද්ධතිය නැවත තක්සේරු කිරීම 2012 දෙසැම්බර් 05-06 දිනවලදී SLAB මගින් සිදු කරනු ලදුව පෙන්වා දෙන ලද තක්සේරු කිරීම් වලට අනුකූලව ක්‍රියාකාරකම් සම්පූර්ණ කල පසු විද්‍යාගාරයට ප්‍රතීතනය ලබා දීම සම්පූර්ණ කෙරෙනු ඇත.

**5.ඇල්ෆා වර්ණාවලීක්ෂමිතිය ස්ථාපනය**

පවතින්නා වූ සීමිත සම්පත් යොදාගෙන ඇල්ෆා වර්ණාවලීක්ෂමිතිය ස්ථාපනය, සම්පූර්ණ කරන ලදි. U-238, Th-232 හා Po-210 සඳහා විකිරණ රසායනික වෙන්කිරීමේ ක්‍රම වේද ස්ථාපනය කෙරිණි. පස් / අවසාදිත වල අඩංගු පොලෝනියම් සඳහා රසායනික වෙන් කිරීම් ක්‍රම ස්ථාපනය ද සිදු කෙරිණි. අළුතින් බඳවා ගන්නා ලද විද්‍යාත්මක නිළධාරීන් විකිරණශීලී රසායනික වෙන් කිරීමේ තාක්ෂණය හා ඇල්ෆා වර්ණාවලීක්ෂ මිතිය පිළිබඳව පුහුණු කෙරිණි. මෙම ක්ෂේත්‍රය දියුණු කිරීමට ඇති ප්‍රධාන බාධාව වන්නේ ඇල්ෆා

වර්ණාවලීක්ෂමිතිය සඳහා අවශ්‍ය උපකරණ සීමිත වීමයි.තවදුරටත් මෙම ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා අවශ්‍ය උපකරණ ඉල්ලුම්කර ඇත. ඇල්ෆා වර්ණාවලීක්ෂමිතික විද්‍යාගාරය PT පරීක්ෂා දෙකට සහභාගි විය.

**න්‍යෂ්ටික කෘෂිකර්මය**

අධිකාරිය කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව හරහා ශ්‍රී ලංකාවට න්‍යෂ්ටික කෘෂිකර්මය හඳුන්වා දීමේ නිරතවී සිටි. ජෛව විද්‍යාත්මක අංශය තෝරාගත් ස්ථාන වල විකිරණශීලී සීසියම් තාක්ෂණය යොදාගෙන පාංශු ඛාදනය අධ්‍යනයේ යෙදී සිටි. ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික තාක්ෂණික කේන්ද්‍රස්ථානයක් (NCNA) ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටද අධිකාරිය කටයුතු පියවරගනිමින් පවතී. මේ සඳහා ආධාර ලබා ගැනීමට ව්‍යාපෘතියක් අධිකාරිය විසින් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට ඉදිරිපත් කර ඇත.

**දැනුවත් කිරීමේ වැඩසටහන් -2012**

2012 වසරේ දී ජෛව විද්‍යාත්මක අංශය මගින් පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

1. න්‍යෂ්ටික හා සමස්ථානික තාක්ෂණය භාවිතා කොට සාගර දූෂණය කළමණාකරණය නම් සම්මන්ත්‍රණය අධිකාරිය සාගර පාරිසරික ආරක්ෂණ අධිකාරිය (MEPA) සමග එකමුතුව පරමාණුක ශක්ති අධිකාරියේ දී 2012 ජනවාරි 10 වැනිදා පවත්වන ලදි.
2. "ෆුකුෂිමා මගින් ඇති වූ විකිරණශීලී ද්‍රව්‍ය ආසියානු ශාන්තිකර කලාපයට මුක්ත වීමෙන් බලපෑමක් ඇති වුවාදැයි නිර්ණය" පිළිබඳ කලාපීය ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලදුව ජපානයේ ඇතිවූ න්‍යෂ්ටික බලාගාර අනතුරෙන් අපගේ සාගර පරිසරයට බලපෑමක් ඇති වුවා ද යන තේමාව යටතේ ජාතික සම්මණ්ත්‍රනයක් 2012 පෙබරවාරි 27 වෙනිදා පවත්වන ලදී.
3. ෆුකුෂිමා අනතුරෙන් පසු ශීත කල ආයනයනික මාළු / ටින් කල මාළු පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2012 මැයි 30 වෙනිදා පවත්වන ලදී.
4. "කෘෂිකර්මය සඳහා න්‍යෂ්ටික තාක්ෂණය ඉදිරිය" යන මාතෘකාව යටතේ වැඩ මුළුවක් 2012 අප්‍රියෙල් 26-27 දක්වා ගන්නොරුව කෘෂිකර්ම දෙපාරතමේන්තුවේ දී පවත්වන ලදි.
5. "සංස්කෘතික වටිනාකමක් සහිත කෞතුක භාණ්ඩ අධ්‍යනය සඳහා එක්ස් කිරණ ප්‍රතිදීප්තමිතික තාක්ෂණය (XRF) යොදාගැනීම" නමින් ජාතික සම්මණ්ත්‍රනයක් පරමාණුක ශක්ති අධිකාරියේ දී 2012 ජූලි 16 වෙනිදා පවත්වන ලදි.
6. ශ්‍රී ලංකාවට කිරි ආශ්‍රිත ආහාර ආනයන කරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පරමාණුක ශක්ති අධිකාරියේ දී 2012 ජුලි 30 වෙනිදා පවත්වන ලදී.

**උපාධි අපේක්ෂක හා උපාධිධාරී සිසුන් පුහුණු කිරීමේ වැඩසටහන්**

විවිධ විශ්ව විද්‍යාල වල උපාධි අපේක්ෂක සිසුන් සඳහා ඔවුන්ගේ නිවාඩු කාලයේ දී අධිකාරියේ දී පුහුණු වීමට ඉඩ ප්‍රස්ථාව ජෛව විද්‍යාක්මක අංශය මගින් සපයන ලදි. එමෙන්ම මෙම අංශයෙහි ඇති පර්යේෂණ පහසුකම් යොදාගෙන පශ්චාත් උපාධි අපේක්ෂකයන්ටද පුහුණු වීමට අවස්ථාව සලසන ලදී.මෙම පශ්චාත් උපාධි අපේක්ෂකයන් ජෛව විද්‍යාත්මක අංශයෙහි කාර්ය මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ පර්යේෂණ ක්‍රියාකාරකම් සිදුකරනු ලැබේ.

**ර්යේෂණ ව්‍යාපෘති:**

1. මුහුදු ජලයේ  අඩංගු Cs -137 විකිරණශීලි සමස්ථානිකය සන්සන්දනාත්මක ක්‍රමවේද දෙකකින් විශ්ලේෂණය (අධිකාරියත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයත් එකමුතුව)

අරමුණු:

වර්තමානයේ දී  ශ්‍රී ලංකාව අවට මුහුදු ජලයේ Cs -137 පිළිබඳ පාදස්ථ අගයන් නොමැත. එයට හේතුව ඒ සඳහා සුදුසු විශ්ලේෂණ ක්‍රියා දාමයන් දැනට ස්ථාපනය කර නොමැති වීමයි. දැනට පවතින ක්‍රම අපහසු වන්නේ එහි දී විශාල පරිමානයේ සාම්පල යොදා ගැනීමට සිදු වීමයි. (මේ සඳහා ලීටර් 100-400 දක්වා වන ප්‍රමාණයක මුහුදු ජලය විද්‍යාගාරයට ගෙනවිත් විශාල ප්‍රමාණයක් රසායනික ද්‍රව්‍ය දමා පිළියෙල කල යුතුය)

වර්තමානයේ දී අධිකාරියේ ජෛව විද්‍යාත්මක අංශය මගින් වෙනස් ක්‍රම දෙකක් යොදාගෙන මේ සඳහා පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කරන අතර මෙමගින් අවශ්‍ය පාදස්ත මිණුම් ලබා ගැනීමට සුදුසු ක්‍රම තෝරා ගනු ඇත.මෙසේ මෙම දත්ත පද්ධතිය සැකසූ විට ශ්‍රී ලංකාවේ සාගර හා වෙරළබඩ පරිසරයේ Cs -137 විකිරණශිලි ද්‍රව්‍ය සාන්ද්‍රණය පිළිබඳ පාදස්ථ දත්ත සැම පුද්ගලයෙකුටම ලබා ගත හැකි වනු ඇත.

2. විවිධ රැකියා වල නිරත පුදුගලයන් බැර ලෝහ වලට නිරාවරණය පිළිබඳ අධ්‍යනය (අධිකාරියත් කොළඹ විශ්ව විද්‍යාලයත් අතර එකමුතු ව්‍යාපෘතිය)

අරමුණු:

විවිධ රැකියාවල නිරත පුද්ගලයන්ගේ හිසේ කෙස් වල අඩංගු බැර ලෝහ නිර්ණය (වෙල්ඩින් කරුවන්, මිකැනික්වරුන්, පෙදරේරුවන්, රථ වාහන හසුරුවන පොලිස් නිළධාරීන් හා ත්‍රී විලර් රිය දුරන්) මෙහිදී විවිධ රැකියාවල නිරත පුද්ගලයන් බැර ලෝහ වලට නිරාවරණය පිළිබඳ නිර්ණය කෙරේ.

3. ජපානයේ ෆුකුෂිමා න්‍යෂ්ටික බලාගාර අනතුරෙන් පසු ශ්‍රී ලාංකිකයන් ආහාරයට ගන්නා මාළු වල (Cs -137 හා Cs -134) විකිරණශීලීතා නිර්ණය

අරමුණු:

ශ්‍රී ලංකාවේ වෙළඳ පොලේ දැකිය හැකි දේශීය හා ආනයනික මාළු වල විකිරණශීලීතා මට්ටම් නිර්ණය හා එමගින් 2011 ජපානයේ ෆුකුෂිමා න්‍යෂ්ටික බලාගාර අනතුරෙන් එම විකිරණශීලීතා මට්ටම් ඉහල ගොස් ඇද්දැයි නිර්ණය.

## 6. 2012 වසරේ දී රචිත විද්‍යාත්මක පර්යේෂණ පත්‍රිකා

- The Experience of accreditation and proficiency testing schemes in Isotopic RMs at Atomic Energy Authority, Sri Lanka. – IAEA BERM 13 International Symposium, Vienna, June 2012

- Elevated levels of whole blood nickel in a group of Sri Lankan women with endometriosis: A case control study, Prented in  India

- Establishment of a 137Cs Reference Inventory for The Assessment of Soil Erosion in Uma Oya Catchment in Sri Lanka - for poster presentation and full paper  submitted

for symposium proceedings to the International Conference on Managing Soils for Food Security and Climate Change Adaptation and Mitigation 23-27 July 2012, Vienna, Austria

- PT testing results for 4 radioactive samples were submitted to AQCS/IAEA on March 2012 and the report will be received to LLC within December 2012.
- Baseline Radioactivity of soil in Sri Lanka (SLAAS -2012)
  By M.C.S. Seneviratne, P.D. Mahakumara, T.N. Attanayake, Viraj Edirisinghe, K.S.S. Kumara, K.K.P.I.K. Kadadunna, Janitha Edirininghe, Gayan Perera, H.M.N.L. Handagiripathira, V.A. Waduge
- The Experience of accreditation and proficiency testing schemed in isotopic RMs at Atomic Energy Authority, Sri Lanka. – IAEA BERM 13 International Symposium, June 2012.
  By M.C. Shirani Seneviratne, Thilaka Attanayake, V.A.Waduge, Lakmali Hadagiripathira, Sissara Sanjeewa

- Determination of Cesium – 137 and Cesium – 134 radioactivity levels in fish consumed by Sri alnkans after recent Nuclear Power Plant accident occurred in Fukushima, Japan (SLASS- 2012).
  V.A.Waduge, E.C.J.Perera, T.N. Attanayake, P.R.T. Cumaranatunga, M.C.S. Seneviratne, D.P.Dissanayake

# 8.සමස්ථානික ජල විද්‍යා අංශයේ ක්‍රියාකාරකම්

## 8.1. සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති

**ව්‍යාපෘති**

පුත්තලම ප්‍රදේශයේ හුණුගල් ආශ්‍රිතව ඇති භූගත ජලයේ ගුණාත්මක බව හීන වීම පිළිබඳව සමස්ථානික තාක්ෂණික භාවිතයෙන් අධ්‍යනය කිරීම.

මෙහි දී භූගත ජලයේ ගුණාත්මක බව අඩුවීමට හේතු සහ භූ ගත ජල මූලාශ්‍ර ප්‍රාර්ජනය වන යාන්ත්‍රණය පිළිබද වැදගත් තොරතුරු සොයා ගැනීමට හැකි වී ඇත.ජල සම්පත් මණ්ඩලයේ සහාය ඇතිව සිදු කරන ලද මෙම අධ්‍යන කටයුතු සදහා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ කලාපීය සහයෝගිතා ව්‍යාපෘතිය මගින් අනුග්‍රහය දක්වන ලද අතර විදේශිය විශේෂඥ සහාය ද ලැබිණි.





රූපය 8.1: විශේෂඥ සහාය ඇතිව දත්ත විශ්ලේෂණය කිරීම

රූපය 8.2 :ව්‍යාපෘති අධ්‍යාන කණ්ඩායම (ප.ශ.අ. සහ ජල සම්පත් මණ්ඩලය

### 8.2.1. යෝජිත බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතිය ප්‍රදේශය ආශ්‍රිත ජලයේ සමස්ථානික අධ්‍යාන කටයුතු සිදු කිරීම

මෙහිදී මෙම ව්‍යාපෘතියට අදාල පොල්පිටිය - කිතුල්ගල ප්‍රදේශ ආශ්‍රිත ජලයේ හැසිරීම, ජල මූලාශ්‍ර හා භූ ජලය ප්‍රයෝජනය වන යාන්ත්‍රණය සෙවීම ආදී කරුණු වෙනුවෙන් සමස්ථානික විශ්ලේෂණ ක්‍රම යොදා ගනී. මෙමගින් මෙම ව්‍යාපෘතියේ වැඩ නිම කල පසු එම අළුතින් ඇතිවන ජලාශ මඟින් එම පරිසර පද්ධතියේ භූ ගත ජලය ආශ්‍රිතව යම් වෙනස් කම් සිදුවුවහොත් ඒවා හදුනාගත හැකිවනු ඇත.මෙහිදී ජලයේ දියවී ඇති අයන පිළිබද විශ්ලේෂණ කටයුතු සිදුකරයි. ලංකා විදුලි බල මණ්ඩලයේ බ්‍රෝඩ්ලන්ඩ් ව්‍යාපෘතියේ ඉල්ලීම පරිදි ඔවුන්ගේ සහාය ඇතිව මෙම අධ්‍යාන කටයුතු සිදු කරයි.



රූපය 8.3 : විවිධ ජල මූලාශ්‍ර වලින් නියැදි ලබා ගැනීම.

### 8.2.2 යාපන අර්ධද්වීපය අවට භූගත ජලය පිළිබඳ අධ්‍යානය

ජාත්‍යාන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ සහයෝගය සහ ජල සම්පත් මණ්ඩලයේ සහභාගීත්වය ඇතිව මෙම ව්‍යාපෘතිය සිදුකරනු ලැබේ.වසර 2012 සිට 2015 දක්වා මෙම අධ්‍යයන කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ.



රූපය 8.4 : ජල නියැදි රැස්කරන අවස්ථා

8.2.3 උතුරු මැද සහ මධ්‍යම පළාත් ආශ්‍රිතව ඇති භූගත ජලයට වර්ෂා ජලයෙන් සිදුවන බලපෑම අධ්‍යනය කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘතිය

මෙවැනි භූගත ජලය පිළිබඳ අධ්‍යන කටයුතු ඉදිරියේ දී ශ්‍රී ලංකාවේ සියළු ප්‍රදේශ ආශ්‍රිතව සිදුකිරීමට අදහස් කරන අතර ආරම්භයක් ලෙස කලාඔය සහ අඹන් ගඟ ද්‍රෝණි ආශ්‍රිතව අධ්‍යන කටයුතු ආරම්භ කර ඇත. මෙම අධ්‍යන වලින් සොයා ගන්නා තොරතුරු අනාගතයේ දී ජල සම්පත් සුරැකීම පිළිබඳ වගකීම් දරන ආයතන වල පරිහරණය සඳහා ලබා දීම මගින් වඩා ක්‍රමවත්ව සහ කළමනාකරණය කර භූගත ජලය ලබා ගැනීමට ඔවුන්ට උපකාර කරනු ඇත.



රූපය 8.5: පර්යේෂණ කටයුතු සිදුකෙරෙමින් පවතින ආකාරය



රූපය 8.6: සාම්පල එක්රැස් කිරීම

8.2.4. ඊසාන දිග මෝසම් වර්ෂාවේ අඩංගු ජල සමස්ථානික පිළිබඳ අධ්‍යනය

ලංකාව තුළ භූගත ජලය පිළිබඳ අධ්‍යයනය මෙම විද්‍යාත්මක අධ්‍යයන කිරීමේ දී ඊට අවශ්‍ය පාදක දත්ත වනුයේ අදාල ප්‍රදේශ වල වර්ෂා ජලයෙහි ඇති සමස්ථානික ප්‍රමාණයන්ය.මේ වෙනුවෙන් දීර්ග කාලීනව වර්ෂා ජලයෙහි සමස්ථානික දත්තයන් විශ්ලේෂණය කළ යුතු වේ. මෙයට ආරම්භයක් ලෙස ඊසාන දිග මෝසම් වැස්සේ ජල නියැදි රැස් කිරීම සඳහා නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම හා වයඹ පලාත් ආශ්‍රිතව ස්ථාන 20 ක වර්ෂා ජලය රැස්කරන උපාංග සවිකර ඇත. ඉදිරි අවුරුදු දෙකක කාලයක් සඳහා මෙම ප්‍රදේශ වල දත්ත රැස් කිරීමට බලාපොරොත්තු වේ.



රූපය 8.7 : වර්ෂා ජලය සවිකරන ඇටයුම් සවි කිරීම

### 8.2.5. බෝගල මිනිරන් පතල තුල ඇති ජල කාන්දුවේ මූලාරම්භය සෙවීමට සිදුකරන පර්යේෂණ කටයුතු

මොරටුව විශ්ව විද්‍යාලයේ භූ විද්‍යාත්මක අංශයේ ඉල්ලීම පරිදි මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. උපාධි අපේක්ෂකයන් 4 දෙනෙක් දැනට මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධව කටයුතු කරන අතර සීමාසහිත බෝගල මිනිරන් පතල මගින් ඉදිරි වැඩ කටයුතු සඳහා සාම්පල එක් රැස් කිරීම සිදු කෙරේ.



රූපය 8.8 :බෝගල මිනිරන් පතලේ
පර්යේෂණ වල නිරත වෙමින්

## 8.3. සමස්ථානික ජල විද්‍යාව සඳහා ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපනය

ගරු විදුලිබල හා බලශක්ති ඇමතිතුමා විසින් සමනල වැව වේල්ලට ආසන්නව ඉහත ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය යෝජනා කරන ලදි. ලංකා විදුලි බල මණ්ඩලයට අයත් පැරණි ව්‍යාපෘති ගොඩනැගිල්ලෙන් කොටසක් මේ සඳහා ලබා දීමට ඔහු එකග විය. පරමාණුක ශක්ති අධිකාරියේ නිළධාරින් විසින් ඉහත කාර්ය සඳහා එම ගොඩනැගිල්ල සුදුසු දැයි සොයා බැලීමට එම ස්ථානය නිරීක්ෂණය කරන ලදි. දැනටමත් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවට මේ පිළිබඳව ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර ඇත.



රූපය 8.9 : සමස්ථානික ජල විද්‍යාගාරය සඳහා යෝජිත භූමි භාගය හා ගොඩනැගිලි

7. 2012 දී සිදු කරන ලද වෙනත් ක්‍රියාකාරකම්

(අ) සමස්ථානික සඳහා ජල සාම්පල විශ්ලේෂණය

(ආ) පුද්ගලයන් පුහුණු කිරීම ( එක උපාධි අපේක්ෂක හා NITA ආයතනයේ අයෙකුට පුහුණුව ලබා දෙන ලදී.)

2012 වසරේදී සමස්ථානික සඳහා ජල සාම්පල විශ්ලේෂණය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්

| ව්‍යාපෘතිය | ව්‍යාපෘතියට සම්බන්ධ වූ ආයතනය | ලැබුන සාම්පල සංඛ්‍යාව | | විශ්ලේෂණය කල සාම්පල සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | ස්ථායි සමස්ථානික | ට්‍රිටියම් | ස්ථායි සමස්ථානික | ට්‍රිටියම් |
| පුත්තලම -ජලය ඇතුලට පැමිණීම පිළිබඳ අධ්‍යානය | ජල සම්පත් මණ්ඩලය හා පරමාණුක ශක්ති අධිකාරිය (ප.ශ.අ.) | 32 | 30 | 31 | 11 |
| GNIP(අන්තර් ජාතික වර්ෂා පතන සමස්ථානික දත්ත ජාලය) | ප.ශ.අ. හා ජා.ප.ශ නියෝජිතායතනය | 12 | 12 | 09 | 01 |
| බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාර ව්‍යපෘතිය | ලංකා විදුලි බල මණ්ඩලය | 76 | 75 | 64 | 03 |

| ව්‍යාපෘතිය | එකතුව වැඩ කල ආයතනය | ලැබුන සාම්පල සංඛ්‍යාව | | විශ්ලේෂණය කල සාම්පල සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | ස්ථායි සමස්ථානික | ට්‍රිටියම් | ස්ථායි සමස්ථානික | ට්‍රිටියම් |
| බෝගල මිනිරන් පතලේ ජලය කාන්දුවීමේ පරීක්ෂණය | මොරටුව විශ්ව විද්‍යාලය හා සීමාසහිත බෝගල මිනිරන් පතල | 140 | 55 | 138 | 31 |
| පානම භූ ජල අධ්‍යානය ප්‍රදේශය අවට | පේරාදෙණියවි.වි. භූ විද්‍යා අධ්‍යනාංශය | 29 | 16 | 29 | 15 |
| අම්පාර අවට උණුදිය උල්පත් ආශ්‍රිත සමස්ථානික අධ්‍යානය | ප.ශ.අ. | 20 | 14 | 20 | - |
| බොල්ගොඩ වැව ආශ්‍රිත අධ්‍යානය | අධිකාරියේ ජෛව විද්‍යා අංශය | 06 | | 06 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| අන්තර් ජාතික විද්‍යාගාර දත්ත සංසන්දන ව්‍යාපෘතිය | ජ.ප.ශ.නි. | | 03 | | 03 |
| යාපනයේ භූ ජල අධ්‍යනය | ජල සම්පත් මණ්ඩලය හා ප.ශ.අ. | 47 | 34 | 47 | |
| මාතලේඅවට උල්පත් අධ්‍යනය | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය | | | | |
| කලා ඔය හා අඹන්ගඟ ද්‍රෝණි ආශ්‍රිත අධ්‍යනය | ප.ශ.අ.හා භූ විද්‍යාත්මක හා පේරාදෙණියවි.වි. භූ විද්‍යා අධ්‍යනාංශය | 155 | 155 | 80 | 25 |
| **එකතුව** | | **517** | **394** | **424** | **89** |

# 9.විඥාපන සේවා

## 9.1. ජාත්‍යන්තර න්‍යෂ්ටික තොරතුරු පද්ධතිය

ජාත්‍යන්තර න්‍යෂ්ටික තොරතුරු පද්ධතියේ ශ්‍රී ලංකාවේ නියෝජිතායතනය පරමාණුක ශක්ති අධිකාරියයි. මෙම පද්ධතියේ ලෝකයේ විවිධ න්‍යෂ්ටික විද්‍යා ආයතන වල කෙරෙන පර්යේෂණ වල තොරතුරු දැක්වෙන අතර අන්තර් ජාලය හරහා එම තොරතුරු ලබා ගත හැක.

## 9.2. න්‍යෂ්ටික විද්‍යාව පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන්

### 9.2.1. ප්‍රදර්ශන දේශණ හා පුහුණු පාඨමාලා

අනුරාධපුරයේ, ඔයාමඩුවේ පැවැත්වූ දැයට කිරුළ -2012 ප්‍රදර්ශනයට අධිකාරිය ආකර්ෂණීය කුටියක් ඉදිරිපත් කරමින් සහභාගි විය. පාසැල් සිසු සිසුවියන් හා මහජනතාව මෙම කුටිය නරඹා න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදීම් පිළිබදව දැනුවත් වූහ. 2012 වසරේ පෙබරවාරි 4 – 12 දක්වා ප්‍රදර්ශනය පැවැත්විණි.ප්‍රදර්ශන කුටියේ අනිකුත් ප්‍රදර්ශන භාණ්ඩ න්‍යෂ්ටික බලාගාරයක හා එක්ස් කිරණ මධ්‍යස්ථානයක ආකෘති ද ප්‍රදර්ශනය කෙරිණි. අ.පො.ස. (උසස් පෙළ) භෞතික විද්‍යා විෂය නිර්දේශයට ඇතුලත් න්‍යෂ්ටික තාක්ෂණය පිළිබද දේශන අන්තර්ගත සීඩී තැටි සිසු සිසුවියන්ගේ ඉල්ලීම පරිදි මෙහිදී ඉතා සහනදායි මිලට ලබා දෙන ලදි.ඡන්ද පෙට්ටියක් තබා ප්‍රදර්ශන කුටියට පැමිණෙන අයගෙන් ශ්‍රී ලංකාවේ විදුලිය නිපදවීමට න්‍යෂ්ටික බලය යොදාගැනීමට කැමති හා අකමැති අයගේ සංඛ්‍යාව නිර්ණය කරන ලදි.

මීට අමතරව අධිකාරිය පාසැල් වල පැවැත්වූ ප්‍රදර්ශණ ගණනාවකට සහභාගි විය.

### 9.2.2. අධිකාරිය සහභාගි වූ සම්මන්ත්‍රන, දේශන. පුහුණු පාඨමාලා හා වැඩමුළු

2012 ඔක්තෝම්බර් 9 – 12 දක්වා රජයේ විකිරණවේදීන් සඳහා විකිරණ ආරක්ෂණය පිළිබඳ ජාතික පුහුණු පාඨමාලාවක් පැවැත්වුණි. 40 දෙනෙක් මෙම පාඨමාලාවට සහභාගි වූහ.
දුර්ලභ ගණයේ පාංශු මූලද්‍රව්‍ය සඳහා ඉල්මනයිට් පස් නිස්සාරණයේ දී, පස් කැනීමේ දී හා ඒ හා සම්බන්ධ කාර්යයන් වලදී විකිරණශීලි ඛණිජ ද්‍රව්‍ය නිර්මාණය කෙරෙන නිසා පුල්මුඩේ පිහිටි ඛණිජ වැලි දෙපාර්තමේන්තුවේ සේවකයන් සඳහා විකිරණ ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරිමේ සම්මන්ත්‍රණයක් පැවැත්වූ අතර ඊට 200 ක් සහභාගි වූහ.

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ අ.පො.ස. උසස් පෙළ සිසුන් සඳහා න්‍යෂ්ටික විද්‍යාව හා එහි යෙදීම් පිළිබඳ එක් දින සම්මන්ත්‍රනයක් 2012 මාර්තු 08 වන දින පවත්වන ලදි.

න්‍යෂ්ටික විද්‍යාවේ භාවිතයන් පිළිබදව මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ අ.පො.ස උසස් පෙළ සිසුන් දැන්වත් කිරීමේ එක් දින සම්මන්ත්‍රණයක් 2012 සැප්තැම්බර් 12 දින එම පාසලේ දී පවත්වන ලදි.

අයණීකරණ විකිරණ යොදාගෙන සේවා සපයන්නන් සඳහා විකිරණ ආරක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.



**රූපය 9.1 : විකිරණවේදීන් සඳහා වාර්ෂික පුහුණු පාඨමාලාව**

ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර දක්වන බල ඇණි වල පුහුණුවන්නන් පුහුණු කිරීම සඳහා විකිරණශීලි ආරක්ෂක ප්‍රතිචාර වැඩසටහනක් ජනවාරි 23-27 දක්වා පවත්වන ලදි. මෙම වැඩසටහනෙන් බලාපොරොත්තු වුයේ පුහුණුවන්නන් පුහුණු කරන බල ඇණි වල සාමාජිකයන් පුහුණු කිරීම තුලින් ඔවුන්ගේ මාර්ගයෙන් විකිරණ ආරක්ෂණය සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන අනෙකුත් සාමාජිකයන් නිරන්තරව පුහුණු කිරීමයි. මෙම පුහුණු වැඩසටහන සඳහා 35 දෙනෙක් සහභාගි වුහ.

පොලීසියේ, යුද්ධ හමුදාවේ හා රෝහල් වල ඉහල නිළධාරීන් සඳහා “විකිරණ ආරක්ෂණය අවශ්‍ය වූ අවස්ථාවල දී ප්‍රතිචාර” දැක්වීමට 2012 මැයි 08 වන දින සම්මන්ත්‍රනයක් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රනය පැවැත්වීමේ අරමුණ වූයේ න්‍යෂ්ටික හා විකිරණශීලී ආපදා පිළිබදව හා විකිරණශීලී ආරක්ෂණය අවශ්‍ය වු විට ප්‍රතිචාර දැක්වීම පිළිබදව ඉහත කී නිළධාරීන් ගේ දැනුම වැඩි දියුණු කිරීමයි.පුද්ගලයින් 30 ක් මීට සහභාගි වුහ.



**9.2 රූපය : පොලීසියේ හා එස්.ටී.එෆ් (STF) නිළධාරීන් පුහුණු කිරීම**

න්‍යෂ්ටික උපකරණ වල තත්ව පාලනය /තත්වය සහතික තිරීම පිළිබඳ පුහුණු පාඨමාලාවක් පැවැත් වූ අතර එම පුහුණු පාඨමාලාවට විශ්ව විද්‍යාල , රෝහල් හා වෙනත් ආයතන වල තාක්ෂණික ශිල්පීන් කිහිපදෙනෙක් සහභාගි වූහ.

විදුලි බල හා බලශක්ති අමාත්‍යංශයේ ඉල්ලීම පරිදි අධිකාරිය විද්‍යාඥයන්, ඉංජිනේරුවන් හා අධ්‍යාපනඥයන් සඳහා න්‍යෂ්ටික යෙදීම් පිළිබඳ සම්මන්ත්‍රනයක් ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී 2012 ඔක්තෝම්බර් 05 දින පවත්වන ලදී.

න්‍යෂ්ටික හා සමස්ථානික තාක්ෂණය භාවිතා කොට සාගර දූෂණය කළමණාකරණය නම් සම්මන්ත්‍රනය අධිකාරිය සාගර පාරිසරික ආරක්ෂණ අධිකාරිය (MEPA) සමග එකමුතුව පරමාණුක ශක්ති අධිකාරියේ දී 2012 ජනවාරි 10 වැනිදා පවත්වන ලදී.

"භූකම්පා මගින් ඇති වූ විකිරණශීලී ද්‍රව්‍ය ආසියානු ශාන්තිකර කලාපයට මුක්ත වීමෙන් බලපෑමක් ඇති වුවාදැයි නිර්ණය පිළිබඳ කලාපීය ව්‍යාපෘතිය" යටතේ සංවිධානය කරන ලදුව, ජපානයේ ඇතිවූ න්‍යෂ්ටික බලාගාර අනතුරෙන් අපගේ සාගර පරිසරයට බලපෑමක් ඇති වුවා ද යන තේමාව යටතේ ජාතික සම්මන්ත්‍රනයක් 2012 පෙබරවාරි 27 වෙනිදා පවත්වන ලදී.

භූකම්පා අනතුරෙන් පසු ශීත කල ආයනයනික මාළු / ටින් කල මාළු පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් 2012 මැයි 30 වෙනිදා පවත්වන ලදී.

"කෘෂිකර්මය සඳහා න්‍යෂ්ටික තාක්ෂණය ඉදිරියට " යන මාතෘකාව යටතේ වැඩ මුළුවක් 2012 අප්‍රියෙල් 26-27 දක්වා ගන්නොරුව කෘෂිකර්ම දෙපාරතමේන්තුවේ දී පවත්වන ලදී.

"සංස්කෘතික වටිනාකමක් සහිත කෞතුක භාණ්ඩ අධ්‍යනය සඳහා එක්ස් කිරණ ප්‍රතිදීප්තිමිතික තාක්ෂණය (XRF) යොදාගැනීම" නමින් ජාතික සම්මන්ත්‍රනයක් පරමාණුක ශක්ති අධිකාරියේ දී 2012 ජූලි 16 වෙනිදා පවත්වන ලදී.

ශ්‍රී ලංකාවට කිරි ආශ්‍රිත ආහාර ආනයනකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පරමාණුක ශක්ති අධිකාරියේ දී 2012 ජූලි 30 වෙනිදා පවත්වන ලදී.

මොරටුව වේල්ස් කුමාර විද්‍යාලයේ අ.පො.ස උසස් පෙළ සිසුන් සඳහා න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රනයක් පවත්වන ලදී.

අනුරාධපුරයේ දැයට කිරුල -2012 ට සමගාමීව සම්මණ්ත්‍රන ගණනාවක් පවත්වන ලදි.

## 9.3 ශ්‍රී ලාංකික තරුණ න්‍යෂ්ටිකවේදීන් ගේ සංගමය (YNSSL)

මෙම සංගමයේ අරමුණ වැඩමුළු සම්මණ්ත්‍රණ හා ජන මාධ්‍ය යොදා ගෙන න්‍යෂ්ටික තාක්ෂණයේ වාසි පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමයි. පහත දක්වා ඇති වගුව මගින් 2012 වසරේ මෙම සංගමය දියත් කරන ලද වැඩසටහන් දැක්වේ.

| දිනය | මාතෘකාව | ස්ථානය | විස්තරය |
|---|---|---|---|
| 2012.02.04.-2012.02.10 | 2012 දැයට කිරුළ | ඔයාමඩුව, අනුරාධපුරය | අ.පො.ස උසස් පෙළ සිසුන් සඳහා දැනුම මිනුම තරගයක් හා කථික තරගයක් පවත්වන ලදි.(මාතෘකාව න්යෂ්ටික විද්‍යාව හා තාක්ෂණයේ වාසි)මෙම වැඩසටහන සංගමයේ ආධාර සහිතව රජරට විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවන ලදි |
| 2012.06.22-2012.06.24 | "2012 Future mind" වැඩසටහන | BMICH කොළඹ | |
| 2012.08.05-2012.08.11 | IYNC (ජාත්‍යන්තර තරුණ න්‍යෂ්ටික වේදීන්ගේ සමුළුව) | ඇමරිකා එක්සත් ජනපදය | මලින්ද රණවීර මහතා YNSSL (ශ්‍රී ලංකාව නියෝජනය කලේය) |
| 2012.10.10 | න්‍යෂ්ටික විද්‍යාවේ සාමකාමී යෙදීම්/ න්‍යෂ්ටික බලය යොදාගෙන විදුලිය ජනනය | රාජකීය විද්‍යාලය කොළඹ 07 | අ.පො.ස. උසස් පෙළ ගණිතය හා ජීව විද්‍යාත්මක සිසුන් සඳහා |
| 2012.10.23 | උතුරු ඇමරිකානු න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ තරුණ සංවිධානය සමග ඩිජිටල් සම්මණ්ත්‍රනය | දුරස්ථ ඉගෙනීමේ කේන්ද්‍රය, ස්ලීඩා ආයතනය, මලලසේකර මාවත, කොළඹ 07. | ඩන්කන් බොඩින්සන් මහතා , ආයතනයේ සභාපති හා ක්‍රිස්ටීනි සෙමාඩියා මිය(විධායක සාමාජික) වැඩසටහනට සහභාගි විය. |
| 2012.10.30 | න්‍යෂ්ටික බලය යොදා ගෙන විදුලිය නිෂ්පාදනය | නාවික හමුදා මූලස්ථානය, කොළඹ 01. | |
| 2012.11.01 | න්‍යෂ්ටික විද්‍යාවේ සාමකාමී යෙදීම් / න්‍යෂ්ටික බලය යොදාගෙන | සංඝමිත්තා විද්‍යාලය,කොළඹ | අ.පො.ස (උ/පෙළ) ගණිතය හා ජීව විද්‍යා සිසුන් සඳහා |

| | | | |
|---|---|---|---|
| | විදුලිය නිපදවීමට | | |

**විදේශ රටවල පවත්වන ලද සම්මන්ත්‍රණ පුහුණු වැඩ සටහන් / වැඩමුළු /රැස්වීම් වලට අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය -ජනවාරි - දෙසැම්බර් 2012**

| අනුක්‍රමික අංකය | අංකය | නිළධාරියාගේ නම | තනතුර | වැඩසටහනේ නම | කාල පරිච්ඡේදය | රට | ආධාර දුන් ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 12/03 | ඒ. ජයලත් මහතා | ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ.) | තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියRAS/9/057- යටතේ 2 වන කලාපීය සම්බන්ධීකරණ රැස්වීම | 13.02.2012-17.02.2012 | කුවේට් | ජාත්‍යන්තර පරමාණුකශක්ති නියෝජිතායතනය(ජා.ප.ශ.නි) |
| 02 | 12/04 | ඩී.සී.කේ.කේ. දිසානායක මිය | ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, ජෛව විද්‍යාත්මක අංශය (ප.ශ.අ.) | ආහාර ආරක්ෂණය හා දේශගුණික වෙනස් වීම් වලට අනුවර්තනය හා අනුකරණය සඳහා පාංශු කළමණාකරණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රනය | 23.07.2012-26.07.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 03 | 12/05 | ටී.එම්.ආර්. තෙන්නකෝන් මහතා | අංශ ප්‍රධාන, නිර්විනාශක අංශය | ජා.ප.ශ.නියෝජිතායතනයේකලාපීය සහයෝගිතා ගිවිසුමේ RAS/8/110 ප්‍රගති සමාලෝචන රැස්වීම හා RAS/1/013 ව්‍යාපෘති සැලසුම් කිරීමේ රැස්වීම | 27.02.2012-02.03.2012 | සැනිගයි-චීනය | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 04 | 12/06 | ටී.එච්.එස්. ශාන්ත මහතා | ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ.) | විකිරණශීලි ප්‍රභව ආරක්ෂණය සඳහා කලාපීය විකිරණශිලි ආරක්ෂණය සඳහා හා සම්බන්ධ අදාල පාර්ශව අතර සමාලෝචන රැස්වීම | 18.01.2012-20.01.2012 | බෝහෝල් - පිලිපීනය | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 05 | 12/06 | කේ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා | ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ.) | විකිරණශීලි ප්‍රභව ආරක්ෂණය සඳහා කලාපීය විකිරණශිලි ආරක්ෂණය සඳහා හා සම්බන්ධ අදාල පාර්ශව අතර සමාලෝචන | 18.01.2012-20.01.2012 | බෝහෝල් - පිලිපීනය | ජා.ප.ශ.නියෝජිතායතනය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | රැස්වීම | | | |

විදේශ රටවල පවත්වන ලද සම්මන්ත්‍රණ පුහුණු වැඩ සටහන් / වැඩමුළු /රැස්වීම් වලට අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය -ජනවාරි - දෙසැම්බර් 2012

| අනුක්‍රමික අංකය | අංකය | නිළධාරියාගේ නම | තනතුර | වැඩසටහනේ නම | කාල පරිච්ඡේදය | රට | ආධාර දුන් ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| 06 | 12/10 | එච්.එල්.අනිල් රංජිත් මහතා | අංශ ප්‍රධාන, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ.) | නියාමන ක්‍රියාවලිය සඳහා අදාල පාර්ශව වල විනිවිදභාවය සහභාගීත්වය පිළිබද කලාපීය රැස්වීම RAS/9/059 | 05.03.2012-09.03.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 07 | 12/12 | ජේ.එම්.ඒ.සී. ජයසිංහ මහතා | විධායක අධ්‍යක්ෂ /ප්‍රධාන විධායක නිළධාරි (ප.ශ.අ) | ආසියා ශාන්තිකර කලාපීය ජාතික සම්බන්ධීකාරක නිළධාරීන්ගේ රැස්වීම RAS/0/062 | 21.02.2012-24.02.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 08 | 12/12 | එච්.ජී.පී.කරුණාරත්න මහතා | අංශ ප්‍රධාන, (මිනිස් සම්පත් සංවර්ධනය හා ජාත්‍යන්තර අංශය) | ආසියා ශාන්තිකර කලාපීය ජාතික සම්බන්ධීකාරක නිළධාරීන්ගේ රැස්වීම RAS/0/062 | 21.02.2012-24.02.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 09 | 12/16 | ඒ.එස්.එම්.ටී.එන්. අත්තනායක මිය | තාක්ෂණික සහායක, ජෛව විද්‍යාත්මක අංශය | IAEA/RCA නවකයන් සඳහා තත්ව කළමණාකරණ පද්ධතියේ ප්‍රයෝජන පිළිබද කලාපීය පුහුණු පාඨමාලාව RAS/7/021 | 16.04.2012-20.04.2012 | කොරියා සමූහාණ්ඩුව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 10 | 12/19 | ටී.එච්.එස්. ශාන්ත මහතා | ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ.) | න්‍යෂ්ටික බලයේ ආරක්ෂිත මට්ටම් පිළිබද කලාපීය රැස්වීම | 07.05.2012-09.05.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 11 | 12/21 | ඒ.එස්.එම්.ටී.එන්. අත්තනායක මිය | තාක්ෂණික සහායක, ජෛව විද්‍යාත්මක අංශය | ජීව විද්‍යාත්මක හා පාරිසරික සංසංදනාත්මක ද්‍රව්‍ය පිළිබද 13 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | 25.06.2012-29.06.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |

**විදේශ රටවල පවත්වන ලද සම්මන්ත්‍රණ පුහුණු වැඩ සටහන් / වැඩමුළු /රැස්වීම් වලට අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය -ජනවාරි - දෙසැම්බර් 2012**

| අනුක්‍රමික අංකය | අංකය | නිළධාරියාගේ නම | තනතුර | වැඩසටහනේ නම | කාල පරිච්ඡේදය | රට | ආධාර දුන් ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| 12 | 12/22 | වී.ඒ. වඩුගේ මහතා | අංශ ප්‍රධාන, ජෛව විද්‍යාත්මක අංශය | විද්‍යාඥයන්ගේ ජාත්‍යන්තර වසන්තය පිළිබඳ සම්මන්ත්‍රනය | 05.03.2012- 09.03.2012 | පකිස්තානය | ශ්‍රී ලංකා රජය |
| 13 | 12/23 | එච්.එල්. අනිල් රංජිත් මහතා | අංශ ප්‍රධාන, විකිරණ ආරක්ෂණ අංශය | විකිරණශීලි ප්‍රභවයන් නීතිමය නොවන ආකාරයට ප්‍රවාහනය කිරීම පිළිබද දත්ත පද්ධතියේ අදාල සම්බන්ධීකාරකයන්ගේ රැස්වීම | 24.07.2012- 26.07.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතා යතනය |
| 14 | 12/28 | ඩී.ජී.එල්. වික්‍රමනායක මහතා | අංශ ප්‍රධාන, කාර්මික යෙදීම් අංශය | කලාපීය සහයෝගිතා ගිවිසුමේ ජාතික නියෝජිතයන්ගේ 34 වන රැස්වීම | 17.04.2012- 20.04.2012 | චීනය | ශ්‍රී ලංකා රජය |
| 15 | 12/31 | චන්දන සෙනෙවිරත්න මහතා | විද්‍යාත්මක නිළධාරී නිර්විනාශක අංශය | <u>නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණය පිළිබද සුපරීක්ෂණය</u> නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණය අළුතින් පාහන ලද පුවරුවක X කිරණ පරීක්ෂාව -මාලදිවයින ආදායම් උත්පාදන වැඩසටහනකි | 05.04.2012- 08.04.2012 | මාලදිවයින | ශ්‍රී ලංකා රජය |
| 16 | 12/34 | වී.ඒ. වඩුගේ මහතා | අංශ ප්‍රධාන, ජෛව විද්‍යාත්මක අංශය | IAEA/RCA වාර්ෂික ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම | 06.08.2012- 10.08.2012 | ඩාලට් වියට්නාමය | ජා.ප.ශ.නියෝජිතා යතනය |
| 17 | 12/37 | එස්.එස්.කේ.කොළඹ ගේ මහතා | විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය | විකිරණශීලි ප්‍රභව එලදායි හා දීර්ග කාලීන පාලනය පිළිබද IAEA කලාපීය පුහුණු පාඨමාලාව | 15.10.2012- 19.10.2012 | ජකර්තා ඉන්දුනීසියා ව | ජා.ප.ශ.නියෝජිතා යතනය |

<u>විදේශ රටවල පවත්වන ලද සම්මන්ත්‍රණ පුහුණු වැඩ සටහන් / වැඩමුළු /රැස්වීම් වලට අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය -ජනවාරි - දෙසැම්බර් 2012</u>

| අනුක්‍රමික අංකය | අංකය | නිළධාරීයාගේ නම | තනතුර | වැඩසටහනේ නම | කාල පරිච්ඡේදය | රට | ආධාර දුන් ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| 18 | 12/18 | කේ.කේ.පී.අයි.කේ. කඩදුන්න මහතා | ජොෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය( ප.ශ.අ) | INES ජාතික නිළධාරීන්ගේ තාක්ෂණික රැස්වීම | 16.07.2012-20.07.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජි තායතනය |
| 19 | 12/41 | ඊ.ජී.එන්.වී. එදිරිසිංහ මහතා | විද්‍යාත්මක නිළධාරී, කර්මාන්ත යෙදීම් අංශය (ප.ශ.අ) | ජා.ප.ශ.නියෝජිතායතනයේ කලාපීය සහයෝගීතා ගිවිසුමේ ප්‍රථම ව්‍යාපෘති සම්බන්ධීකරණ රැස්වීම RAS/7/023 | 16.07.2012-19.07.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජි තායතනය |
| 20 | 12/43 | එච්.එන්.එල්. හදගිරිපතිර මිය | විද්‍යාත්මක නිළධාරී, ජෛව විද්‍යාත්මක අංශය(ප.ශ.අ) | ජා.ප.ශ.නියෝජිතායතනයේ කලාපීය සහයෝගීතා ගිවිසුමේ ප්‍රථම ව්‍යාපෘති සම්බන්ධීකරණ රැස්වීම RAS/7/023 | 09.07.2012-13.07.2012 | මැලේසියාව | ජා.ප.ශ.නියෝජි තායතනය |
| 21 | 12/46 | ඩී.ජී.එල්. වික්‍රමනායක මහතා | අංශ ප්‍රධාන, කර්මාන්ත යෙදීම් අංශය (ප.ශ.අ) | IAEA/RCA න්‍යෂ්ටික විශ්ලේෂණ තාක්ෂණය මගින් ආහාර ක්ෂුද්‍ර මාත්‍රණය හා ආහාර වල ආරක්ෂිත පාලන පද්ධති පිළිබඳ තාක්ෂණික හැකියාවන් වර්ධනය සඳහා පවත්වන ලද ව්‍යාපෘති සැලසුම් කරණ රැස්විම RAS/5/062 | 07.08.2012-10.08.2012 | චීනය | ජා.ප.ශ.නියෝජි තායතනය |
| 22 | 12/48 | කේ. ආර්. සී.ද සිල්වා මහතා | විද්‍යාත්මක නිළධාරී, විකිරණ පිරිසැකසුම් ඒකකය (ප.ශ.අ) | ප්‍රතිපත්ති සාදන්නන් හා අන්තඵල ලාභීන් වෙනුවෙන් කෘෂිකාර්මික, කාර්මික හා පාරිසරික යෙදීම් පිළිබද විකිරණ පිරිසැකසුම් තාක්ෂණය සම්බන්ධයෙන් පවත්වන ලද | 27.08.2012-31.08.2012 | වියට්නාමය | ජා.ප.ශ.නියෝජි තායතනය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ජා.ප.ශ.නියෝජිතායතනයේ කලාපීය සහයෝගීතා ගිවිසුමේ හා කලාපීය විධායක කළමණාකරණ රැස්වීම RAS/8/108 | | | |

**විදේශ රටවල පවත්වන ලද සම්මන්ත්‍රණ පුහුණු වැඩ සටහන් / වැඩමුළු /රැස්වීම් වලට අධිකාරියේ නිළධාරීන්ගේ සහභාගීත්වය -ජනවාරි - දෙසැම්බර් 2012**

| අනුක්‍රමික අංකය | අංකය | නිළධාරීන්ගේ නම | තනතුර | වැඩසටහනේ නම | කාල පරිච්ඡේදය | රට | ආධාර දුන් ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| 23 | 12/50 | යු.කේ.කේ.එච්.ද සිල්වා මහතා | ජොෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ) | විකිරණශීලීතාව ප්‍රවාහනය පිළිබඳ හා අපද්‍රව්‍ය ආරක්ෂණය පිළිබඳ ජාතික ක්‍රමවේදයක් ස්ථාපනය සඳහා අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමට පවත්වන ලද සමුළුව | 24.07.2012-26.07.2012 | බැංකොක් තායිලන්තය | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 24 | 12/57 | වී.ඒ. වඩුගේ මහතා | අංශ ප්‍රධාන, ජෛව විද්‍යාත්මක අංශය (ප.ශ.අ) | "Xකිරණ වර්ණාවලීක්ෂමිතිය පිළිබද යුරෝපීය සමුළුව (EXRS-2012) පරමාණු ආයතනය, වියානා විශ්ව විද්‍යාලය ඔස්ට්‍රියාව | 18.06.2012-22.06.2012 | වියානා ඔස්ට්‍රියාව | වියානා විශ්ව විද්‍යාලය ඔස්ට්‍රියාව |
| 25 | 12/59 | වී.ඒ. වඩුගේ මහතා | අංශ ප්‍රධාන, ජෛව විද්‍යාත්මක අංශය | RCA ව්‍යාපෘති සැලසුම්කරණය හා සම්බන්ධීකරණ රැස්වීම RAS/7/024 | 21.08.2012-24.08.2012 | වියානා ඔස්ට්‍රියාව | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 26 | 12/60 | ඒ.ජයලත් මහතා | ජොෂ්ඨ විද්‍යාත්මක නිළධාරී, විකිරණ ආරක්ෂණ අංශය (ප.ශ.අ) | න්‍යෂ්ටික හා විකිරණශීලි හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ජාතික හැකියාව පිළිබද GSR -2 යෙදීම සඳහා ERR ක්‍රමය පිළිබද කලාපීය පුහුණු වැඩසටහන | 23.09.2012-27.09.2012 | අබුඩාබි එක්සත් අරාබි එමීරය | ජා.ප.ශ.නියෝජිතායතනය |
| 27 | 12/61 | ආර්.එම්.එම්.පී.රණවීර මහතා | තාක්ෂණික සහයක විකිරණ පිරිසැකසුම් ඒකකය(ප.ශ.අ.) | ජාත්‍යන්තර තරුණ න්‍යෂ්ටිකවේදීන්ගේ කොන්ග්‍රසය | 05.08.2012-11.08.2012 | ඇමෙරිකා එක්සත් ජනපදය | ශ්‍රී ලංකා රජය |
| 28 | 12/62 | ආචාර්ය ආර්.එල්.රංජිත් | සභාපති (ප.ශ.අ) | ජා.ප.ශ.නියෝජිතායතනයේ 56 වැනි වාර්ෂික මහ සමුළුව | 17.09.2012-21.09.2012 | වියානා ඔස්ට්‍රියාව | ශ්‍රී ලංකා රජය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | විජයවර්ධන මහතා | | | | | |
| 29 | 12/62 | එච්.ජී.පී.කරුණාර ත්න මහතා | අංශ ප්‍රධාන, (මිනිස් සම්පත් සංවර්ධනය හා ජාත්‍යන්තර අංශය) | ජා.ප.ශ.නියෝජිතායතනයේ 56 වැනි වාර්ෂික මහ සමුළුව සැප්. 2012 හා 17-21 RCA රැස්වීම සැප්.2012 | 14.09.2012-21.09.2012 | වියානා ඔස්ට්‍රියාව | ශ්‍රී ලංකා රජය |

විකිරණ ප්‍රභව හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන රාජ්‍ය හා පුද්ගලික ආයතන නිරන්තර අධීක්ෂණය කරමින් එම ස්ථාන වල විකිරණ ආරක්ෂණ කටයුතු සිදුකරන ලදි. විකිරණශීලී ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ උපකරණ (වෛද්‍ය එක්ස් කිරණ යන්ත්‍ර ඇතුළුව) භාවිත කරන්නන් ඒ සඳහා අධිකාරියෙන් බලපත්‍රයක් ලබාගත යුතු අතර 2012 වසරේ දී මෙවන් බලපත්‍ර 278 ක් නිකුත් කරන ලදී. මීට අමතරව විකිරණශීලී ද්‍රව්‍ය ආනයනය හා අපනයනය කිරීමට අධිකාරියේ අනුමැතිය ලබාගත යුතු අතර 2012 වසරේ දී මේ සඳහා දෙන ලද බලය පැවරීම් සංඛ්‍යාව 474 කි. විකිරණශීලී ද්‍රව්‍ය හා විකිරණශීලී සමස්ථානික භාවිතා කරන ස්ථාන අධීක්ෂණය පරමාණුක ශක්ති අධිකාරියේ කාර්යය භාරයක් වන අතර 2012 වසරේදී මෙවන් අධීක්ෂණ 140 ක් සිදු කරන ලදී. අධිකාරිය විසින් අධීක්ෂණයෙන් අනතුරුව කළ යුතු වෙනස්කම් ඉදිරිපත් කළ පසු එම වෙනස්කම් වලට අනුකූලව ප්‍රවිකිරණ කාමර වෙනස් කිරීමෙන් අනතුරුව, ඒවා නිරීක්ෂණය කර එවන් කාමර 63 කට අනුමැතිය දෙන ලදී.

අධිකාරියට හා බාහිර ආයතන වලට අයත් විකිරණ මනින උපකරණ 65 ක් ක්‍රමාංකනය කරන ලදී. විකිරණශීලී ද්‍රව්‍ය හා ප්‍රවිකිරණ යන්ත්‍ර භාවිතා කරමින් දෛනික රාජකාරී කටයුතු වල නියැලී සිටින විකිරණ සේවකයන් 900 දෙනෙකු සඳහා අධිකාරිය මගින් පවත්වාගෙන යන පුද්ගල විකිරණ මිතික සේවාව සපයන ලදි. මෘදුකාංග හා දෘඩාංග නඩත්තු කිරීම/ ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම, පරිගණක හා අන්තර්ජාල සම්බන්ධ කටයුතු සඳහා සේවාවන් 112ක් අධිකාරියට සපයන ලදි. න්‍යෂ්ටික උපකරණ අළුත්වැඩියා කිරීම හා ඒවායේ මෘදුකාංග පිළිබඳ සේවාවන් 48 ක් ද සපයන ලදි.
කාර්මික ක්ෂේත්‍රයට නිර්විනාශක පරීක්ෂණ අධීක්ෂණ සේවා ලබා දෙමින් එම යන්ත්‍ර වලින් ලබාගන්නා සේවාවල ඵලදායිතාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය සේවා 130 ක් ලබා දෙන ලදි. මෙමගින් යන්ත්‍ර සූත්‍ර වල ක්‍රියාකාරීත්වය තහවුරු කෙරෙන අතර කාර්මික ක්ෂේත්‍රයේ බිඳ වැටීම් වැළකේ. මීට අමතරව නිර්විනාශක පරීක්ෂණ තාක්ෂණය පිළිබඳ පුද්ගලයන් 210 ක් පුහුණු කරන ලදී. නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු දිගටම සිදුකරන ලදි.

විකිරණශීලතාව සඳහා සාම්පල 7000 ක් විශ්ලේෂණය කරන ලදි.
ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා මිනිස් බල පුහුණුව අත්‍යවශ්‍ය වේ. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ , ජපන් හා කොරියානු රාජ්‍යයන් වල ආධාරයෙන්, ශ්‍රී ලංකාවේ විශේෂඥයන්ගේ තාක්ෂණික හැකියාවන් (න්‍යෂ්ටික විද්‍යාව පිළිබඳ ) වැඩි දියුණු කිරීමට විශේෂඥ සේවාවන් (17) අධිශිෂ්‍යත්ව හා විද්‍යාත්මක චාරිකා (03) හා එතෙර කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා විද්‍යාඥයන් 110 දෙනෙකුට සහභාගි වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදි. මීට අමතරව අධිකාරියේ පරිපාලන හා අනෙකුත් විද්‍යාත්මක නොවන සේවක මණ්ඩලයේ සාමාජිකයන් සඳහා අධිකාරියේදී මෙන්ම බාහිර ආයතන වලදී පුහුණුවීම් ලබා දෙන ලදි.

මූල්‍ය තොරතුරු

බාහිර පරිභෝගිකයන්ට සපයන ලද සේවාවන් ගෙන් උපයන ලද දළ ආදායම්- 2012හා 2011

මිලියන වලින් වටිනාකම

| | ආදායම් ප්‍රභවය | 2012 | 2011 |
|---|---|---|---|
| 01 | බලපත්‍ර /විකිරණ ආරක්ෂණ සේවා | 11.5 | 5.6 |
| 02 | න්‍යෂ්ටික උපකරණ නඩත්තුව හා අළුත්වැඩියාව /පුද්ගල විකිරණමිතිය | 1.6 | 1.28 |
| 03 | නිර්විනාශක පරීක්ෂණ අධීක්ෂණ/පුහුණු පාඨමාලා | 11.0 | 6.12 |
| 04 | න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා | 32.6 | 31.7 |
| 05 | න්‍යෂ්ටික පිරිසැකසුම් සේවා | 0.24 | - |
| | **එකතුව** | **56.84** | **44.7** |

පසුගිය වසර හා සසඳන විට 2012 වසරේ දී මුළු ආදායම 25% කින් වැඩි වී ඇත.
ඉහත කී වැඩසටහන් සාර්ථකව සිදුකිරීමට සහායවීම පිළිබඳව මා මේ අවස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයටත් ජ්‍යෙෂ්ඨ කළමණාකරණ මණ්ඩලයටත් අධිකාරියේ සේවකයන්ටත් ස්තුතිය පලකරමි.

ආචාර්ය රංජිත් විජයවර්ධන (සභාපති)

## පරමාණුක ශක්ති අධිකාරිය

**ආදායම් හා වියදම් ගිණුම**

**2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**වටිනාකම රු.**

| | සටහන් | 2012 | 2011 |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආදායම | **3** | 71,791,442 | 54,413,369 |
| වෙනත් ආදායම් | **4** | 57,817,522 | 45,584,452 |
| **මුළු ආදායම** | | 129,608,964 | 99,997,821 |
| සේවකයන්ගේ ප්‍රතිලාභ වියදම් | **5** | (63,666,997) | (39,951,324) |
| පරිපාලන හා මෙහෙයුම් වියදම් | **6** | (31,517,685) | (24,698,813) |
| වෙනත් පුනරාවර්තන වියදම් | **7** | (12,862,864) | (8,070,156) |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | **8** | (31,711,770) | (23,979,744) |
| **මුළු වියදම** | | (139,759,317) | (96,700,038) |
| **ආදායම ඉක්මවූ වියදම** | | **(10,150,353)** | **3,297,783** |

**පරමාණුක ශක්ති අධිකාරිය**

## 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය

| | | | |
|---|---|---|---|
| | | | වටිනාකම<br>රු. |
| **සටහන්** | **2,012** | **2011** | |
| | **රු.** | **රු.** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් හා සමාන දෑ | **9** | 512,524 | | 4,210,110 | |
| ලැබිය යුතු | **10** | 11,735,965 | | 12,408,133 | |
| වට්ටෝරු ලේඛණ | **11** | 3,592,254 | | 4,527,649 | |
| පෙර ගෙවීම් | **12** | 3,381,265 | | 2,496,515 | |
| වෙනත් ජංගම වත්කම් | **13** | 25,710,672 | 44,932,680 | 1,197,039 | 24,839,446 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| නොනිමි වැඩ | **14** | 56,715,006 | | 1,559,884 | |
| ක්‍රියාත්මක වන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති | **15** | 6,045,787 | | 2,755,199 | |
| යටිතල පහසුකම් / යන්ත්‍ර උපකරණ | **16** | 150,171,229 | | 130,051,884 | |
| දේපල හා ගොඩනැගිලි | **17** | 177,195,275 | | 176,038,117 | |
| අනෙකුත් දිගු කාලීන වත්කම් | **18** | 9,417,746 | | 9,417,746 | |
| භාවිතයට ගත නොහැකි අයිතම | **19** | 31,850 | 399,576,892 | 31,850 | 319,854,680 |
| මුළු වත්කම් | | | **444,509,572** | | **344,694,127** |
| **ජංගම බැරකම්** | | | | | |
| ගෙවිය යුතු | **20** | (16,305,166) | | (5,092,945) | |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| පාරිතෝෂිත සදහා වෙන් කිරීම් | **21** | (21,541,848) | | (15,434,480) | |
| **මුළු බැරකම්** | | (37,847,014) | **(37,847,014)** | (20,527,425) | **(20,527,425)** |
| **මුළු ශුද්ධ වත්කම්** | | | **406,662,557** | | **324,166,702** |
| **ස්කන්ධ හා බැරකම්** | | | | | |
| **ප්‍රාග්ධන හා සංචිත** | | | | | |
| රජයේ ප්‍රතිපාදන- ප්‍රාග්ධන | **22** | 386,512,677 | | 296,442,665 | |
| සමුච්චිත අරමුදල | **23** | 91,692,087 | | 88,268,268 | |
| හිඟය | **25** | (71,542,207) | | (60,544,231) | |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | 406,662,557 | **406,662,557** | 324,166,702 | **324,166,702** |

මෙම මුල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ

## පරමාණුක ශක්ති අධිකාරිය
## 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

වටිනාකම රු.

| | 2012 | 2011 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |

| | | |
|---|---|---|
| පාරිභෝගිකයන්ගෙන් ලද මුදල් | 66,486,000 | 51,490,000 |
| සැපයුම් කරුවන්ට ගෙවන ලද මුදල් | (54,018,176) | (38,316,774) |
| සේවකයන්ට ගෙවන ලද මුදල් | (55,657,000) | (38,988,000) |
| අධිකාරියේ සාමාජිකයන්ට ගෙවන ලද මුදල් | (337,000) | (237,000) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **(43,526,176)** | **(26,051,774)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මූල්‍ය ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම | (103,237,644) | (62,220,226) |
| වාහන විකිණීම | | 1,847,804 |
| භාණ්ඩාගාරයට මාරු කරන ලද අරමුදල් | - | (1,847,803) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය | **(103,237,644)** | **(62,220,225)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මූල්‍ය ප්‍රවාහය** | | |
| පුනරාවර්තන ප්‍රදාන ලැබීම | 39,987,000 | 30,000,000 |
| ප්‍රාග්ධන ණය මුදල් හා පොලිය ලැබීම | 3,768,000 | 3,749,000 |
| ණය ගෙවීම | (2,627,000) | (2,873,000) |
| ප්‍රාග්ධන අරමුදල් ලැබීම | 101,925,000 | 61,073,000 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මූල්‍ය ප්‍රවාහය** | **143,053,000** | **91,949,000** |
| **මුදල් හා ඊට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම හා අඩුවීම** | **(3,710,820)** | **3,677,001** |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් වලට සමාන දෑ** | **4,209,792** | **530,058** |
| බැංකුවේ මුදල් | 4,207,000 | 530,056 |
| මුද්දර තොග | 2,792 | 2 |
| **වර්ෂය අවසානයේ තිබූ මුදල් හා මුදල් වලට සමාන දෑ** | **512,524** | **4,209,792** |
| බැංකුවේ මුදල් | 496,180 | 4,207,000 |
| මුද්දර තොග | 16,344 | 2,792 |

# පරමාණුක ශක්ති අධිකාරිය
# 2012.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
# ශුද්ධ වත්කම් වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

වටිනාකම රු.

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අරමුදල | සමුච්චිත අතිරික්ත ඌණතාවය | එකතුව |
|---|---|---|---|---|---|
| **2010 12.31 දිනට ශේෂය** | **235,639,155** | **850,000** | **90,694,719** | **(63,913,020)** | **263,270,854** |
| වර්ෂය සඳහා ලැබීම් | 75,584,618 | | 6,772,184 | | 82,356,802 |
| සිදු කරන ලද ගැලපුම් - | (14,781,109) | (850,000) | (9,198,635) | 71,006.06 | (24,758,738) |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය | | | | 3297783 | 3,297,783 |
| **2011.12.31 දිනට ශේෂය** | **296,442,664** | | **88,268,268** | **(60,544,231)** | **324,166,701** |
| ආරම්භක ශේෂයට ගැලපුම් - | 20,425,000 | | | (140,431) | 20,284,569 |
| **සංශෝධිත ආරම්භක ශේෂය** | **316,867,664** | | | **(60,684,662)** | **344,451,270** |
| වර්ෂය සඳහා ලැබීම් | 91,908,533 | | 12,872,050 | | 104,780,583 |
| ගැලපුම් | (22,263,520) | | (9,448,231) | (707,192.00) | (32,418,943) |
| වර්ෂය සඳහා අතිරික්තය/ඌණතාවය | | | | (10,150,353) | (10,150,353) |
| **2012.12.31 දිනට ශේෂය** | **386,512,677** | | **91,692,087** | **(71,542,207)** | **406,662,557** |

# පරමාණුක ශක්ති අධිකාරිය

## <u>ගිණුම් සඳහා සටහන්</u>

## 1. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සාමාන්‍ය

### 1.1.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව උපචිත පනදම මත මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කර ඇති අතර ඓතිහාසික පිරිවැය සැලකිල්ලට ගෙන වත්කම් ගැලපුම් කර තිබේ.

වර්ෂය තුල ගිණුම් පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව පැවැත්ම පිළිඳව සංකල්පද පදනම් කරගෙන ඇත.

### 1.1.2 සංසන්දනාත්මක තොරතුරු

අධිකාරියේ ගිණුම් ක්‍රියාකාරකම් පසුගිය වසරේ දත්තයන් සමග නිරතුරුව සැසදීමට හැකි පරිදි හා අවශ්‍ය අවස්ථාවලදී අදාළ වර්ෂයේ ඉදිරිපත් කිරීම් වලට අනුකූල වන ආකාරයට නැවත සකසමින්යොදා ඇත.

### 1.1.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම්

යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුගිය වසර හා සැසදේ.

### 1.1.4 විදේශ මුදල් හුවමාරුව

ප්‍රදාන ලෙස ලැබූ සියලු මුදල් නොවන අයිතම එම ප්‍රදාන ලැබූ අවස්ථාවේ පවතින ලද විනිමය අනුපාතිකයට අනුකූලව වාර්තා කර ඇත.

### 1.1.5 ශේෂ පත්‍රය දිනට පසුව (අනතුරුව) කරන ලද සංසිද්ධි

ශේෂ පත්‍රය පිළියෙල කළ දිනයට අනතුරුව සිදුකරන ලද සියලු ප්‍රමාණාත්මක සංසිද්ධි සැලකිල්ලට ගන්නා ලද අතර අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය වාර්තාවල ගැලපුම් ඉදිරිපත් කිරීම හෝ හෙළි කිරීම් සිදු කර ඇත.

### 1.1.6 බදු

අධිකාරිය එහි පාරිභෝගිකයන්ගෙන් අදාල කාලයට අනුරූපවන ආකාරයට එකතු කල අගය මත බද්ද අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

අධිකාරියේ එකතු කල අගය මත බදු ප්‍රතිපත්තිය 2008 න් පසු සංශෝධනය කරන ලදී. ඒ අනුව ඉඩදියහැකි යෙදවුම් බද්ද, අධිකාරිය විසින් උපයන ලද ආදායම හා භාණ්ඩාගාරයෙන් ලැබුන ප්‍රදාන යන් අතර අනුපාතය අනුව ගණනය කෙරිනි. මීට අමතරව ජාතිය ගොඩනැගීමේ බද්ද, ආර්ථික සේවා ගාස්තු හා ආදායම් බද්ද පවතින නීති වලට අනුකූලව දේශිය ආදායම් බදු දෙපාර්තුමේන්තුවට ගෙවන ලදී.

## 1.2 ස්ථාවර වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල් හා අධිකාරියේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලියේ දී හෝ ශේෂපත්‍ර දිනයේ සිට වර්ෂයක් තුලදී මුදල් වලට පරිවර්තනය කල හැකි දෑ වේ. ජංගම නොවන වත්කම් යනු ශේෂ පත්‍රය සකසන ලද දිනයට වර්ෂයකට වඩා තබා ගන්නා වත්කම් වේ.

### 1.2.1 දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණවල පිරිවැය වටිනාකම සමුච්චිත ක්ෂය අඩු කොට දක්වා ඇත. භෞතික වත්කම් වල පිරිවැය ගොඩ නැගීමේ වැය සහ ඒවා වර්තමාන තත්වයට ගෙන ඒමට වැය වූ පිරිවැය අගයන්ට ගෙන ඇත.

ජංගම නොවන වත්කම් මිලදී ගැනීමට අවශ්‍ය අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් හා අන්තර් ජාතික පරමාණුක ශක්ති ඒජන්සියෙන් සැපයේ .

### 1.2.2. ක්ෂය/ක්‍රමක්ෂය

ක්ෂය සරළ මාර්ග ක්‍රමයට අනුව දේපළ පිරියත හා උපකරණ වල වටිනාකම හෝ නැවත ආගණනය කරන ලද වටිනාකම පහත සඳහන් ආකාරයට කපා හරී. අධිකාරිය විසින් ස්ථාවර වත්කම් වල ක්ෂය සඳහා ගිණුම්කරන ක්‍රමවේදය 2009 සිට වෙනස් කරන ලදි. මීට කලින් ස්ථාවර වත්කම්වල ක්ෂය වර්ෂයට 10% ලෙස (ගොඩනැගිලි, මෝටර් රථ හැරුන විට) ගණනය කලේය.අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ඉලෙක්ට්‍රොනික් උපකරණ සඳහා 25% හා පරිගණක, මෘදුකාංග හා උපාංග සඳහා 33 1/3% වශයෙන් ගණනය කර ඇත.

පහත සඳහන් ආකාරයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය දක්වා ඇත

| **අයිතමය** | **සම්මත ආයු කාලය** | **ප්‍රතිශතය** |
|---|---|---|
| ගොඩනැගිලි | වසර 50 ට වැඩි | 02% |
| මායිම් තාප්ප | වසර 10 ට වැඩි | 10% |
| කාර්යාලීය උපකරණ ලී බඩු සවිකිරීම | වසර 10 ට වැඩි | 10% |
| ඉලෙක්ට්‍රොනික උපකරණ | වසර 04 ට වැඩි | 25% |
| පරිගණක මෘදුකාංග හා උපාංග | වසර 03 ට වැඩි | 33 1/3% |
| මෝටර් රථය | වසර 04 ට වැඩි | 25% |
| විද්‍යාත්මක උපකරණ | වසර 10 ට වැඩි | 10% |
| විකිරණ පහසුකම් | වසර 10 ට වැඩි | 10% |
| පුස්තකාල පොත් | වසර 10 ට වැඩි | 10% |
| ක්‍රීඩා භාණ්ඩ | වසර 10 ට වැඩි | 10% |

**කල්බදු දේපල**

දීර්ග කාලීන කල්බදු ක්‍රමය මත ලබා ගන්නා ලද කාර්යාල භූමිය මෙම කාල පරිඡේදය සඳහා ක්‍රමක්ෂය කොට ඇත.
අංක 66/460, බේස්ලයින් පාර, ඔරුගොඩ වත්ත, වැල්ලම්පිටිය යන ලිපිනයේ පිහිටි භූමිය සඳහා පරමාණුක ශක්ති අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය සමග වර්ෂ 99ක් කල්බදු ගිවිසුමකට බැදී ඇත. 1996 දී අධිකාරිය විසින් කල්බදු ගිවිසුමට අනුකූලව රු.9,750,000/= ගෙවන ලදී.මෙය මෙහෙයුම් කල් බද්දක් ලෙස ශේෂ පත්‍රයේ දක්වා ඇත.

### 1.2.3 තොග පොත් වටිනාකම සෙවීමේ පදනම

පහත සදහන් පදනම යටතේ තොග පොත්වල අඩංගු තොග සදහා පිරිවැය නිර්ණය කර ඇත.
පාරිභෝගික තොග - ප්‍රථමයෙන් ලද බඩු ප්‍රථමයෙන් නිකුත් කරන පදනමට (FIFO)

### 1.2.4 වෙළද හා වෙනත් ණය ගැතියෝ

වෙළද හා අනෙකුත් ණයගැතියන් පිරිවැයට දක්වා ඇති අතර බොල් හා අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කොට ඇත. අධිකාරිය වසර පහට වඩා වැඩි අඩමාන ණය සඳහා සාමාන්‍ය වෙන් කිරීමක් කරයි.

### 1.2.5 මුදල් හා මුදල් වලට සමාන දෑ

සෘජු ක්‍රමය මත මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙළ කර ඇත.පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කල හැකි බැංකුවේ ඇති මුදල් හා මුද්දර තොග මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස වර්ගීකරණය කර ඇත.

## 1.3 බැරකම් හා වෙන් කිරීම්

### 1.3.1 සේවකයන්ට විශ්‍රාමික පාරිතෝෂිත සහන සැලසීම

සේවකයන් සඳහා විශ්‍රාම පාරිතෝෂිත සහන සැලසීමේ දී ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව සේවකයන් සඳහා පාරිතෝෂිත සහන සලසන ලදි. මේ අනුව අධිකාරිය සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් 12% ක් හා 3%ක් බැර කරන ලදි.
1983 අංක 12 දරණ විශ්‍රාම පාරිතෝෂිත පණත අනුව පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් සිදුකරන ලදී. මෙම ගෙවීම අවුරුදු පහක අඛණ්ඩ සේවයක් සහිත සේවකයන් සඳහා පමණක් ලබා දේ විශ්‍රාම පාරිතෝෂිත සඳහා බාහිරයෙන් අරමුදල් නොලැබෙන අතර මේ සඳහා එක් වර්ෂයක සේවය සම්පූර්ණ කල සෑම සේවකයකුගෙන්ම මෙසේ මූල්‍ය වර්ෂයේ අවසන් මාසයේ වැටුපෙන් අඩක් සඳහා ශේෂ පත්‍රයේ වෙන් කිරීමක් සිදුකරන අතර සෑම සේවකයකුගේම දෙසැම්බර් 31 දින ආරම්භක වැටුපෙන් අඩක් ලෙස සම්පූර්ණ වෙන් කිරීම ගණන් ගැනේ.

### 1.3.2 වෙළද හා අනෙකුත් ගෙවිය යුතු මුදල්

වෙළද හා අනෙකුත් ගෙවීම් ඒවායේ පිරිවැය මත දක්වා ඇත.

### 1.3.3 ප්‍රාග්ධන වැය සඳහා බැදීම් හා අසම්භාව්‍ය බැරකම්

වටිනාකමින් වැඩි සියලුම ප්‍රාග්ධන බැදීම් හා අසම්භාව්‍ය බැරකම් සටහන් වල දක්වා ඇත.

### 1.3.4 වෙන් කිරීම්

අදාල ගිණුම් කාල පරිච්ඡේදය තුළ නෛතික හෝ ආදායම් උත්පාදනයට දායක වූ බැදීම් හදුනාගෙන ඒ සදහා අදාල ගිණුම් වල වෙන් කිරීම්කොට ඇත.

## 1.4 විලම්භනය කල ආදායම

### 1.4.1 ප්‍රදානයන් හා ත්‍යාග

ප්‍රාග්ධන ප්‍රතිපාදන හා අන්තර්ජාතික පරමාණුක බලශක්ති ඒජන්සියෙන් ලැබුණු ප්‍රදානයන් හා ත්‍යාග මගින් ලැබෙන දේපල වාර්ෂික ආදායම් වාර්තාව බැර කරනු ලැබේ. ඒ අනුව වාර්ෂික වැය ආයතනයේ පිරිවැයක් ලෙස නොසැලකේ. මෙසේ ආදායම් ගිණුමට බැර වන ප්‍රමාණය ප්‍රධානයන් හෝ ත්‍යාග ගිණුම් වලට ගලපනු ලැබේ.

ප්‍රදානයන් හෝ ලද වත්කම් වල වාර්ෂික ක්ෂය හෝ ක්‍රමක්ෂය වලට සමාන මුදලක් ආදායම් හා වියදම් ගිණුමට බැර කර ඇත.

ප්‍රදානයන්ගේ නිරූපනය වන දේපළ පිරියත හා උපකරණ හා මුදල් නොවන ප්‍රදාන සාධාරණ අගයන් යටතේ ශේෂ පත්‍රයේ හා ආදායම් හා වියදම් ගිණුමේ එවායේ ආර්ථිකමය වටිනාකම් ලැබෙන කාලයට අනුරූපව පෙන්වා ඇත.

#### රජයේ ප්‍රදානයන්

රජයෙන් ලැබුණු ප්‍රාග්ධන හා පුණරාවර්තන ප්‍රතිපාදන වෙනම හදුනාගෙන ගිණුම්ගත කොට ඇත.

ඒකාබද්ධ අරමුදලෙන් ලැබෙන පුණරාවර්තන ප්‍රදානය ප්‍රධාන ආදායම් ප්‍රභවය වී ඇති අතර එම මුදල ආදායම් හා වියදම් ගිණුමට බැර කොට ඇත ප්‍රාග්ධන වැය සදහා ලද ප්‍රදාන ක්ෂයවීම් සදහා නියමිත ගැලපුම් කොට සමුච්චිත අරමුදලට බැර කොට ඇත වෙනත් ප්‍රභවයන්ගෙන් ලද ප්‍රදාන ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

## 1.5 ආදායම් වාර්තාව

ආදායම් හා වියදම් ගිණුම් උපචිත පදනමට පිළියෙල කොට ඇත.

### 1.5.1 ආදායම් හා වියදම් හදුනාගැනිම

ප්‍රධාන ආදායම් ප්‍රභවය භාණ්ඩාගාරයෙන් ලැබෙන පුණරාවර්තන ප්‍රතිපාදන වේ

#### 1.5.1.1 ආදායම

වෙනත් ආදායම් යටතේ අධිකාරියේ රෙගුලාසිමය සේවාවලින් හා නිර්විනාශක පරීක්ෂණ අධීක්ෂණය හා පුහුණු වැඩසටහන්, න්‍යෂ්ටික උපකරණ අලුත්වැඩියා සහ නඩත්තුව යාවත්කාලීන කිරීම් සේවක ණය සඳහා ලද පොලිය ආපසු නොගෙවන ඇප තැන්පතු විවිධ ආදායම් හා අබලි ද්‍රව්‍ය විකිණිමෙන් ලද ලාභය සහ ප්‍රභවයන්හි බදු හැර ශුද්ධ අගය වේ.

**1.5.1.2වියදම්**

ආදායම් ඉපයීමට දායක වූ සියලුම වියදම් ආදායම් හා වියදම් ගිණුමේ වැය ලෙස හඳුනාගෙන ඇත

අධිකාරිය එදිනෙදා පවත්වාගෙන යාමට අදාළ මෙහෙයුම් වියදම් හා දේපළ වල වාර්ෂික ක්ෂය වටිනාකම් ආදායමට එරෙහි වියදම අතර වෙනස වූ අතිරික්තය හෝ ඌනතාවය ගණනය කිරීමේදී සලකා ඇත.

**1.5.2 පර්යේෂණ හා සංවර්ධනය**

පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා දරණ ලද පිරිවැය (ද්‍රව්‍ය හා ශ්‍රමය හා වෙනත් වියදම්) පුණරාවර්තන වියදම් ලෙස දක්වා ඇත.

**2 සංස්ථාපිත තොරතුරු**

1969 අංක 19 දරන පණත යටතේ පරමාණුක ශක්ති අධිකාරිය පිහිටුවා ඇති අතර එය වැල්ලම්පිටිය ඔරුගොඩවත්තේ අංක 60/460 යන ස්ථානයේ ස්ථාපිත කොට ඇත.

| **ගිණුම් සඳහා සටහන්** | **2,012** | **2011** |
|---|---|---|
| **2012.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා** | **Rs.** | **Rs.** |
| **3** අයභාර | | |
| රජයේ ප්‍රධාන පුනරාවර්තන | 39,987,000 | 30,000,000 |
| පාරිභෝගික ද්‍රව්‍ය අපහරණයෙන් ලත් ආදායම | 0 | 78,277 |
| අවලම්භනය කල ආදායම | 31,711,770 | 23,979,744 |

| | | | |
|---|---|---|---|
| | පරිත්‍යාග ලෙස ලැබුණු පාරිභෝගික ද්‍රව්‍ය | 75,456 | 355,348 |
| | අපහරණය කල වත්කම් වලින් ලද ලාභය | 17,216 | |
| | | **71,791,442** | **54,413,369** |
| **4** | **වෙනත් ආදායම්** | | |
| | ආහාර පරීක්ෂාව | 32,205,618 | 31,416,977 |
| | ආහාර පරීක්ෂාව (HPGE ක්‍රමය) | 126,800 | 131,192 |
| | එන්.ඩී.ටී. පරීක්ෂණ සේවා | 7,743,027 | 3,932,598 |
| | බලපත්‍ර ගාස්තු | 4,064,466 | 3,700,478 |
| | විකිරණ ආරක්ෂණ සේවා | 7,400,653 | 1,892,791 |
| | ණය සඳහා පොලී | 273,886 | 302,672 |
| | න්‍යෂ්ටික විශ්ලේෂණ සේවා | 209,934 | 121,932 |
| | සාමාන්‍ය විද්‍යාත්මක සේවා | 1,560,818 | 1,284,724 |
| | නිර්විනාශක පරීක්ෂණ පුහුණු පාඨමාලා | 3,252,800 | 2,193,595 |
| | සංශෝධන ගාස්තු | 37,578 | 31,065 |
| | විවිධ ආදායම් | 706,226 | 576,427 |
| | විකිරණ පිරිසැකසුම් සේවා | 235,716 | |
| | | **57,817,522** | **45,584,452** |
| **5** | **සේවක ප්‍රතිලාභ වියදම්** | | |
| | වේතන | 34,568,750 | 24,109,574 |
| | NCNDT වේතන | 452,816 | |
| | සේවක අර්ථ සාධක අරමුදල | 4,152,484 | 2,869,057 |
| | NCNDT සේවක අර්ථ සාධක අරමුදල | 54,338 | |
| | සේවක භාරකාර අරමුදල | 1,038,085 | 717,264 |
| | NCNDT සේවක භාරකාර අරමුදල | 13,584 | |
| | අමතර දීමනා | 4,958,858 | 1,801,544 |
| | අතුරු දීමනා | 34,308 | 36,170 |
| | අතිකාල හා නිවාඩු දීමනා | 1,322,476 | 1,073,609 |
| | වසරට අදාල පාරිතෝෂිත | 6,121,799 | 1,180,793 |
| | ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 1,819,162 | 1,435,039 |
| | දිරි දීමනා | 735,796 | 550,788 |
| | ජීවන වියදම් දීමනාව | 7,472,384 | 5,949,085 |
| | NCNDT සඳහා ජීවන වියදම් | 51,606 | |
| | පුහුණු වන්නන් සඳහා ගෙවන ලද දීමනා | 195,550 | 228,400 |
| | උපදේශක සඳහා දීමනා | 675,000 | |
| | | **63,666,997** | **39,951,324** |

**ගිණුම් සඳහා සටහන්**

| | | | |
|---|---|---|---|
| | | **2,012** | **2011** |
| **2012.12.31 දිනට** | | **Rs.** | **Rs.** |
| **6** | **පරිපාලනමය හා මෙහෙයුම් වියදම්** | | |
| | කාර්යාලීය ගමන් වියදම් | 276,305 | 232,004 |
| | කලාපීය සහයෝගීතා ගිවිසුමේ රැස්වීම් | 398,745 | 237,777 |
| | ජාත්‍යන්තර පරමාණුක ශක්ති ඒජන්සියේ මහා සමුළුව | 1,674,453 | 1,422,123 |
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ගමන් වියදම් | 45,250 | 16,500.00 |

| | | |
|---|---|---|
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,565,479 | 872,458 |
| කාර්යාලීය පාරිභෝගික ද්‍රව්‍ය හා ලිපි ද්‍රව්‍ය | 2,163,617 | 2,436,534 |
| රසායනික පාරිභෝගික ද්‍රව්‍ය | 4,211,010 | 1,593,402 |
| මුද්‍රා ගැනීමේ ගාස්තු | 56,443 | 68,982 |
| විද්‍යාගාර පාරිභෝගික ද්‍රව්‍ය ප්‍රදාන | 86,365 | 974,550 |
| නිල ඇඳුම් | 187,119 | 145,092 |
| කාර්යාලීය ගොඩනැගිලි නඩත්තුව | 2,482,027 | 2,677,857 |
| උපකරණ සේවා හා අළුත්වැඩියාව | 4,422,976 | 2,329,021 |
| මෝටර් රථ නඩත්තු කිරීම | 1,276,193 | 861,417 |
| විදුලිය | 4,218,496 | 3,265,215 |
| ජලය | 288,098 | 236,412 |
| දුරකථන | 642,079 | 753,799 |
| ටෙලෙක්ස්, ෆැක්ස් හා ඊ මේල් | 610,560 | 467,225 |
| තැපැල් ගාස්තු | 286,317 | 199,108 |
| ආරක්ෂක වියදම් | 3,055,982 | 2,908,308 |
| රක්ෂණය | 2,493,835 | 1,516,341 |
| ප්‍රවාහන | 665,886 | 968,910 |
| වරිපනම් බදු | 324,000 | 252,000 |
| නීතිඥ ගාස්තු | 86,350 | 263,678 |
| බිම් කුලිය | 102 | 102 |
| | **31,517,685** | **24,698,813** |

**7 වෙනත් පුනරාවර්තන වියදම්**

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවීම් | 354,550 | 197,000 |
| පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රන | 1,661,796 | 776,163 |
| සේවකයන් පුහුණු කිරීමේ වැඩයටහන් | 1,029,099 | 415,392 |
| ප්‍රදර්ශන | 1,438,513 | 913,860 |
| දේශිය හා විදේශිය ආයතන වල සාමාජික ගාස්තු | 56,061 | 23,223 |
| විද්‍යාඥයන්ගේ අනියම් වියදම් | 150,486 | 131,152 |
| සංග්‍රහ වියදම් | 92,086 | 74,189 |
| දැන්වීම් හා ප්‍රචාරක වියදම් | 832,847 | 802,815 |
| පුවත්පත් සඳහා දායක මුදල් | 43,805 | 61,410 |
| මුද්‍රණ හා ප්‍රකාශන | 92,856 | 264,112 |
| බැංකු ගාස්තු | 29,055 | 27,524 |
| සුභ සාධක සේවා | 383,831 | 226,050 |
| විගණන වියදම් | 200,000 | 150,000 |
| විවිධ වියදම් | 86,256 | 192,341 |
| නිර්විනාශක පුහුණු පාඨමාලා සඳහා ගෙවීම් | 908,884 | 545,112 |
| විකිරණ ආරක්ෂනය සඳහා ගෙවීම් | 802,778 | 275,597 |
| | **8,162,904** | **5,075,939** |

| | | |
|---|---|---|
| නිර්විනාශක අධීක්ෂණ සේවා සඳහා ගෙවීම් | 8,162,904 | 5,075,939 |

| | | |
|---|---|---|
| ජීව විද්‍යාත්මක පරීක්ෂා සඳහා ගෙවීම් | 995,352 | 442,768 |
| සාමාන්‍ය විද්‍යාත්මක අංශය සඳහා ගෙවීම් | 606,685 | 457,759 |
| විකිරණ ආරක්ෂණ අංශය සඳහා ගෙවීම් | 42,972 | 52,221 |
| පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති | 4,457 | |
| කෘෂිකාර්මික ව්‍යාපෘති | 576,529 | 168,758 |
| මුද්දර ගාස්තු | 376,868 | 367,361 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 8,625 | 9,575 |
| ආදායම් බද්ද | 867,591 | 690,362 |
| | | 52,975 |
| ආර්ථික සේවා බද්ද | | 87,422 |
| ආදායම් බද්ද | | 17,684 |
| සමාජීය වගකීම පිළිබඳ බද්ද | | 411 |
| අධිභාරය | | 11,649 |
| සංයුක්ත වාර්තාව | | 600,000 |
| අඩමාන ණය ගැතියෝ | 823,124 | |
| යල් පැනගිය තොගය (විද්‍යාගාර උපකරණ) | 397,758 | |
| භාවිතා කල නොහැකි වත්කම් ඉවත් කිරීමෙන් ඇති වූ පාඩුව | | 35,272 |
| | **12,862,864** | **8,070,156** |

**8 වත්කම් වල ක්ෂය හා ක්‍රම ක්ෂය**

| | | |
|---|---|---|
| ක්‍රම ක්ෂය / බදු කුලිය | 98,485 | 98,485 |
| මිලදී ගන්නා වත්කම් වල ක්ෂය | 22,165,054 | 14,682,624 |
| ජාත්‍යන්තර පරමාණුක ශක්ති ඒජන්සියේ ප්‍රදාන වල ක්ෂය | 9,448,231 | 9,198,635 |
| | **31,711,770** | **23,979,744** |

# දේපල පිරියත හා උපකරණ - සටහන් අංක 16

**වත්කම් - ස්පෘශ්‍ය සටහන**

| <u>**වත්කම් දිර්ඝ කාලීන බදු -සටහන-9.1**</u><br>පිරිවැය | **වත්කම් ආයු කාලය වර්ෂ** | **ශේෂය1/1/2011** | **ගැලපුම්** | **සංශෝධිත ආරම්භක ශේෂය** | **එකතු කිරීම /ඇතුලට මාරු කිරීම** | **ඉවත් කිරීම පිටතට මාරු කිරීම** | **31-12-2012 ශේෂය** |
|---|---|---|---|---|---|---|---|
| භූමිය | 99 | 8,239,897 | | | | (98,485) | 8,141,412 |
| | | **8,239,897** | | | **-** | **(98,485)** | **8,141,412** |
| <u>**අයිතිය සහිත වත්කම් - සටහන්- 9.2**</u> | | | | | | | |
| <u>**දේපල හා ගොඩනැගිලි**</u> | | | | | | | |
| නිර්විනාශක මධ්‍යස්ථාන ඉඩම | | 90,884,994 | | 90,884,994 | | | 90,884,994 |
| කාර්යාලීය ගොඩනැගිල්ල | 50 | 76,913,225 | | 76,913,225 | 3,144,697 | (1,889,052) | 78,168,869 |
| | | **167,798,219** | | **167,798,219** | **3,144,697** | **(1,889,052)** | **169,053,863** |
| <u>**යටිතල පහසුකම් දේපල හා පිරියත**</u> | | | | | | | |
| මායිම් තාප්පය | 10 | 1 | | | | | 1 |
| විද්‍යාත්මක උපකරණ | 10 | 79,436,872 | (35,176) | 79,401,696 | 19,809,940 | (9,839,465) | 89,372,171 |
| විද්‍යාත්මක උපකරණ පරිත්‍යාග | 10 | 56,034,197 | | 56,034,197 | 14,292,774 | (9,448,231) | 60,878,741 |
| කාර්යාල උපකරණ /ලී බඩු හා සවිකිරීම් | 10 | 8,231,002 | | 8,231,002 | 2,628,150 | (1,186,040) | 9,673,112 |
| වෙනත් උපකරණ | 10 | 452,226 | | 452,226 | | (2,509) | 449,717 |
| මෝටර් රථ | 4 | 13,300,589 | | 13,300,589 | 9,100,000 | (5,950,651) | 16,449,938 |
| විකිරණ පහසුකම් | 10 | 867,552 | | 867,552 | | | 867,552 |
| පුස්තකාල පොත් | 10 | 853,288 | | 853,288 | 699,142 | (128,448) | 1,423,982 |
| පරිගණක අයිතම | 3 | 3,087,433 | | 3,087,433 | 1,745,222 | (1,661,405) | 3,171,250 |
| ඉලෙක්ට්‍රොනික අයිතම | 4 | 2,408,521 | | 2,408,521 | 1,342,837 | (955,524) | 2,795,834 |
| ආරක්ෂක කුටිය හා වැට | 10 | 536,411 | | 536,411 | 274,960 | (82,128) | 729,243 |
| පිවිසුම් පාලම | 10 | 2,118,083 | | 2,118,083 | | (286,439) | 1,831,644 |
| නිර්විනාශක භූමියේ වැට | 5 | 457,990 | | 457,990 | | (49,080) | 408,910 |
| නිර්විනාශක භූමියේ තාප්පය | 10 | 2,500,185 | | 2,500,185 | | (258,302) | 2,241,883 |
| **මුළු වත්කම් වටිනාකම රු.** | | **170,284,350** | **(35,176)** | **170,249,173** | **49,893,025** | **(29,848,222)** | **190,293,979** |

දිනට ගැලපුම් දිනට

**ක්ෂය**

| ක්‍රම ක්ෂය /ක්ෂය | % | 40,544 | යලි සකසන ලද ආරම්භක ශේෂය | එකතු කිරීම් මාරු කිරීම් | අපහරණ මාරු කිරීම් /ගැලපීම් | 31-12-2011 |
|---|---|---|---|---|---|---|
| භූමිය | | | | 98,485 | (98,485) | |
| | | | | 98,485 | (98,485) | |
| **ඉඩම් සහ ගොඩනැගිලි** | | | | | | |
| නිර්විනාශක මධ්‍යස්ථාන ඉඩම කාර්යාල ගොඩනැගිල්ල | 2 | | | 1,893,393 | (1,893,393) | |
| | | | | 1,893,393 | (1,893,393) | |
| **යටිතල පහසුකම් දේපල හා පිරියත** | | | | | | |
| මායිම් තාප්පය | 10 | | | | | - |
| විද්‍යාත්මක උපකරණ | 10 | 32,598,706 | 32,598,706 | 9,684,607 | (9,760,916) | 32,522,397 |
| විද්‍යාත්මක උපකරණ පරිත්‍යාග | 10 | 4,345,195 | 4,345,195 | 9,448,231 | (9,448,231) | 4,345,195 |
| කාර්යාල උපකරණ /ලී බඩු හා සවිකිරීම් | 10 | 1,062,678 | 1,062,678 | 1,160,805 | (1,171,776) | 1,051,708 |
| වෙනත් උපකරණ | 10 | 441,014 | 441,014 | 2,509 | (2,509) | 441,014 |
| මෝටර් රථ | 25 | | - | 5,950,651 | (5,950,651) | - |
| විකිරණ පහසුකම් | 10 | 867,550 | 867,550 | | - | 867,550 |
| පුස්තකාල පොත් | 10 | 307,249 | 307,249 | 128,448 | (128,448) | 307,249 |
| ක්‍රීඩා උපකරණ | 10 | | - | 1,531,613 | (1,531,613) | |
| පරිගණක අයිතම | 33 | 505,870 | 505,870 | 933,079 | (955,516) | 505,870 |
| ඉලෙක්ට්‍රොනික අයිතම | 25 | 104,204 | 104,204 | 82,128 | (82,128) | 81,767 |
| ආරක්ෂක කුටිය | 10 | | - | 286,439 | (286,439) | |
| පිවිසුම් පාලම | 10 | | - | 49,080 | (49,080) | |
| නිර්විනාශක භූමියේ වැට | 20 | | - | 258,302 | (258,302) | |
| නිර්විනාශක භූමියේ තාප්පය | 10 | | - | | - | |
| **මුළු ක්ෂය** | | **40,232,466** | **40,232,466** | **29,515,892** | **(29,625,609)** | **40,122,750** |

| **ශුද්ධ පොත් අගයන් රු.** | සටහන් | **2,012** | | **2,011** |
|---|---|---|---|---|
| **භූමිය හා ගොඩනැගිල්ල** | | 169,053,863 | | 167,798,219 |
| **කල් බදු වත්කම්** | **9.2** | 8,141,412 | | 8,239,897 |
| **යටිතල පහසුකම් , යන්ත්‍ර හා උපකරණ** | **9.1** | 150,171,229 | | 130,051,884 |
| | | **327,366,504** | 18 | **306,090,000** |

ගිණුම් සඳහා
2012.12.31 දිනට සටහන්

| | | | 2,012 | 2011 |
|---|---|---|---|---|
| | | | Rs. | Rs. |
| | | **ජංගම වත්කම්** | | |
| 9 | | **බැංකුවේ මුදල්** | | |
| | | ගිණුම් අංක :071-1-001-1-3320739 | 496,180 | 4,102,318 |
| | | ගිණුම් අංක: 0441-001-9-0210873 | 0 | 105,000 |
| | | මුද්දර තොගය | 16,344 | 2,792 |
| | | වසර අවසාන ශේෂය | **512,524** | **4,210,110** |
| 10 | | **ලැබිය යුතු** | **11,735,965** | **12,408,133** |
| | | වෙළඳ ලැබිය යුතු | | |
| | 10.1 | **ණය ගැතියෝ** | | |
| | | වෙළඳ ණයගැතියෝ වසරට අදාල | 2,727,327 | 3,620,965 |
| | | පසුගිය වසරට අදාල වෙළඳ ණයගැතියෝ | 1,877,322 | 1,411,294 |
| | 10.2 | අඩමාණ ණය ගැතියෝ | (979,118) | (158,794) |
| | | 2012.12.31 දිනට වෙළඳ ණය ගැතියන්ගේ ශුද්ධ අගය | **3,625,531** | **4,873,465** |
| | | සේවක හා වෙළඳ නොවන ණය ගැතියෝ | | |
| | 10.3 | සේවක ණය ගැතියෝ | 369,765 | 116,650 |
| | 10.4 | වෙනත් ණය ගැතියෝ | 1,267,879 | 75,100 |
| | | විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය (MGIF ව්‍යාපෘතිය) | 98,657 | 7,664 |
| | | | **1,736,301** | **199,414** |
| | 10.5 | **අත්තිකාරම් හා ණය** | | |
| | | යතුරු පැදි ණය | 237,083 | 279,167 |
| | | විශේෂ ආපදා ණය | 15,000 | 26,875 |
| | | පාපැදි ණය | 33,563 | 44,557 |
| | | උත්සව අත්තිකාරම් | 64,200 | 58,200 |
| | | ආපදා ණය | 5,681,063 | 6,587,733 |
| | | සේවකයකුට අත්තිකාරම් | 514 | 514 |
| | | වසර අවසාන ශේෂය | **6,031,423** | **6,997,045** |
| | 10.6 | **ආපසු ලැබිය යුතු තැම්පත්** | 342,710 | 338,210 |
| 11 | | **වට්ටෝරු ලේඛන** | | |
| | | රසායනාගාර තොග | 273,908 | 485,370 |
| | | කාර්යාල හා විද්‍යාගාර පාරිභෝගික ද්‍රව්‍ය හා වාහන තොග | 1,350,995 | 1,375,530 |
| | | භාවිතයට ගත නොහැකි යයි හඳුනාගෙන ඇති විද්‍යාත්මක උපකරණ | 397,758 | 397,758 |
| | | භාවිතයට ගත නොහැකි යයි හඳුනාගෙන ඇති විද්‍යාගාර පාරිභෝගික ද්‍රව්‍ය තොග සඳහා වෙන් කිරීම් | (397,758) | |
| | | ජාත්‍යන්තර පරමාණුක ශක්ති ඒජන්සියෙන් ප්‍රදාන ලෙස ලැබීම් | 1,967,352 | 2,268,991 |
| | | වසර අවසාන ශේෂය | **3,592,254** | **4,527,649** |

ගිණුම් සඳහා සටහන්
2012.12.31 දිනට

| | | | 2,012 | 2011 |
|---|---|---|---|---|
| | | | Rs. | Rs. |
| **12** | | **පෙර ගෙවීම්** | | |
| | | කුලින් සර්විසස් (පුද්) සමාගම | 9,003 | ------ |
| | | ඇක්සෙස් ඉන්ටර්නැෂනල් | ------ | 12,622.80 |
| | | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 3,047,508 | 2,207,418 |
| | | මෙට්‍රොපොලිටන් කොමියුනිකේෂන් සමාගම | 10,797 | 9,849.00 |
| | | මෝටර් රථ කොමසාරිස් | 16,142 | 8,977 |
| | | හිදකි ඉන්ටර්නැෂනල් | 781 | 677 |
| | | සීමාසහිත මෙට්‍රොපොලිටන් පුද්ගලික කාර්යාලය | 17,591 | 46,667 |
| | | ශ්‍රී ලංකා ප්‍රතීතන ආයතනය | 59,044 | 49,790 |
| | | බ්‍රවුන්ස් සහ සමාගම | 4,167 | 1,667.00 |
| | | සභාපති | 20,000 | 20,000 |
| | | විධායක අධ්‍යක්ෂ | 18,000 | 18,000 |
| | | ජාතික රක්ෂණ භාර කාර අරමුදල | 61,953 | 69,849 |
| | | සෝවා ටෙක්නොලොජි | 51,000 | 51,000.00 |
| | | එච්.සහ එල් ඉලෙක්ට්‍රිකල්ස් | 14,280 | ------ |
| | | වාසනා ගෙස්ට් | 51,000 | ------ |
| | | වසර අවසාන ශේෂය | **3,381,265** | **2,496,515** |
| **13** | | **වෙනත් ජංගම වත්කම්** | **25,710,672** | **1,197,039** |
| | 13.1 | ලැබිය යුතු රඳවා ගැනීමේ බදු | 2,785 | 29,876 |
| | 13.2 | ආදායම් බදු අත්තිකාරම් | 17,158 | 17,684 |
| | 13.3 | අගය මත බදු | 26,751 | |
| | 13.4 | ජා.ප.ශ.ඒ. යෙන් ලැබිය යුතු | 582,712 | 582,712 |
| | 13.5 | ගොඩනැගිල්ල නඩත්තු කිරීම සඳහා අත්තිකාරම් ගෙවීම් | 154,823 | ------ |
| | 13.6 | අත්තිකාරම් මුදල් ගෙවීම් SLLRDC & NBRO | 24,560,811 | |
| | 13.7 | <u>මිලදී ගැනීමේ අත්තිකාරම්</u> | | |
| | | ශේෂය වර්ෂය ආරම්භයේ දී | 566,767 | 67,159 |
| | | සංශෝධනය කරන ලද ආරම්භක ශේෂය | (209,750) | |
| | | නැවත ආරම්භ කරන ලද ශේෂය | **357,017** | **67,159** |
| | | පියවීම | (354,044) | (67,159) |
| | | වර්ෂය සඳහා මුදල් අත්තිකාරම් ලබාගැනීම් | 362,660 | 566,767 |
| | | වසර අවසාන ශේෂය | **365,633** | **566,767** |
| **14** | | **නොනිමි වැඩ** | | |
| | | ජනෙල් වලින් ඇතුලට ජලය පැමිණීම වැලැක්වීම | 515,283 | 515,283 |
| | | NCNDT ගොඩනැගීම සඳහා ගෙවීම SLLRDC & NBRO | 56,199,722 | 655,226 |
| | | කාර්යාලය පරිගණකගත කිරීම සඳහා මෘදුකාංග | ---------- | 389,375 |
| | | වසර අවසාන ශේෂය | **56,715,006** | **1,559,884** |

ගිණුම් සඳහා සටහන්

2012.12.31 දිනට

| | | | 2,012 | 2011 |
|---|---|---|---|---|
| | | | Rs. | Rs. |
| 15 | | **දැනට කෙරෙමින් පවතින පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති** | | - |
| | | ජල සම්පත් කළමණාකරණය | 1,881,447 | 1,736,117 |
| | | න්‍යෂ්ටික බලය ජනනය සඳහා පූර්ව සක්‍යතා අධ්‍යනය | 832,776 | 524,776 |
| | | විකිරණශීලීතාව මැනීමේ වැඩසටහන | 241,628 | 143,824 |
| | | Y N S S L | 701,290 | 224,080 |
| | | C K D - ව්‍යාපෘතිය- (අත්තිකාරම් මුදල් ලැබීම ) | | 47,294 |
| | | න්‍යෂ්ටික ආපදාවක් සඳහා ප්‍රතිචාර දැක්වීමට ජාතික හැකියාවන් සංවර්ධනය | 1,584,701 | 45,926 |
| | | MEPA ව්‍යාපෘතිය | 770,763 | |
| | | ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රෝන කදම්භ සේවා පහසුකමක් ස්ථාපනය | 33,182 | 33,182 |
| | | වසර අවසාන ශේෂය | **6,045,787** | **2,755,199** |
| 16 | | **යටිතල පහසුකම් , යන්ත්‍රාගාර උපකරණ** | | |
| | 16.1 | දේපල පිරියත හා උපකරණ | 150,171,229 | 297,850,104 |
| 17 | 17.1 | ගොඩනැගිල්ල හා ඉඩම | 177,195,275 | 8,239,897 |
| | | වසර අවසාන ශේෂය | **327,366,504** | **306,090,001** |
| 18 | | **වෙනත් දීර්ගකාලීන වත්කම්** | | |
| | | ගැමා ප්‍රවිකිරණ ව්‍යාපෘතිය සඳහා විද්‍යාත්මක උපකරණ ලබාගැනීම | 9,417,746 | 9,417,746 |
| | | | **9,417,746** | **9,417,746** |
| 19 | | **පාවිච්චි නොකරන උපකරණ** | | |
| | | පාවිච්චි නොකරන උපකරණ | 31,850 | 31,850 |
| | | | **31,850** | **31,850** |
| 20 | | **වෙළඳ ණය හිමියෝ** | **16,305,166** | **5,092,945** |
| | 20.1 | ණය කරුවන් හා උපචිත- ආරම්භක ශේෂය | 4,499,415 | 2,176,933 |
| | | පෙර වසර සඳහා ගැලපුම් | (35,195) | |
| | | නැවත ආරම්භක ශේෂය | 4,464,220 | 2,176,933 |
| | | වර්ෂය සඳහා පියවීම් | (3,511,350) | (1,572,497) |
| | | වර්ෂය සඳහා වෙන්කිරීම් | 14,039,636 | 3,894,979 |
| | | වසර අවසාන ශේෂය | **14,992,506** | **4,499,415** |
| | 20.2 | බලපත්‍ර සඳහා අත්තිකාරම් මුදල් ලැබීම් | 313,500 | 116,383 |
| | 20.3 | විකිරණ ආරක්ෂණ අංශය සඳහා අත්තිකාරම් මුදල් ලැබීම | 4,428 | 13,608 |
| | 20.4 | ආහාර පරීක්ෂාව සඳහා අත්තිකාරම් මුදල් ලැබීම | 1,270 | 540 |
| | 20.5 | අතිකාල දීමනා | 46,979 | 39380 |
| | 20.6 | CKD ව්‍යාපෘතිය සඳහා අත්තිකාරම් මුදල් ලැබීම් | 577,545 | |
| | 20.7 | විවිධ ණයහිමියෝ | 19,838 | 19,838 |
| | 20.8 | ඉම්පීරියල් ටීස් (පුද්) සමාගම. | | 392 |

| | | | |
|---|---|---|---|
| 20.9 | VAT ගෙවිය යුතු | | 131,789 |
| 20.1 | පොලිප්ටෝ් සමාගමෙන් අත්තිකාරම් මුදල් ලැබීම | 245,250 | 180,000 |
| | තැම්පත් මුදල -Sumo Engineering (PVT) Ltd. | 12,250 | |
| 20.1 | ලබාගත හැකි තැම්පතු | 91,600 | 91,600 |
| 21 | **විශ්‍රාම යාමේ දී ලබා දිය යුතු මුදල්** | | |
| | වර්ෂ මුල ආරම්භක ශේෂය | 15,434,480 | 14,722,022 |
| | මුදල් ගෙවීම් | (129,881) | (453,812) |
| | එකතුකලා: වර්ෂය සඳහා වෙන් කිරීම් | 6,237,248 | 1,166,270 |
| | වසර අවසාන ශේෂය | **21,541,847** | **15,434,480** |
| | **<u>ප්‍රාග්ධන හා සංචිත</u>** | | |
| 22 | **ප්‍රාග්ධන ලැබීම්** | | |
| | ජංගම වත්කම් | **296,442,664** | 232,685,068 |
| | පසුගිය වසර ගැලපුම් සඳහා ප්‍රදාන | 20,425,000 | 2,954,087 |
| | **SLAS ගැලපුම් වලට පසු ආරම්භක ශේෂය** | **316,867,664** | **235,639,155** |
| | වර්ෂය සඳහා ප්‍රාග්ධන ලැබීම් | 90,600,000 | 75,584,618 |
| | ආධාර ලැබීම් නිශ්කාශනය කිරීම සඳහා ප්‍රදාන | 1,308,533 | |
| | අදාල වර්තමාන වර්ෂය සඳහා SLAS 24 යෙදීම් | (22,263,520) | (14,781,109) |
| | වසර අවසාන ශේෂය | **386,512,677** | **296,442,664** |
| 23 | **සමුච්චිත අරමුදල** | | |
| | වර්ෂය මුල ආරම්භක ශේෂය | **88,268,268** | 90,694,719 |
| | 2010 කලින් SLAS 24 අනුකූලව කරන ලද ගැලපුම් | | |
| | **SLAS ගැලපුම් වලට පසු ආරම්භක ශේෂය** | **88,268,268** | **90,694,719** |
| | 2010 අනුකූලව SLAS 24 යෙදීම් | (9,448,231) | (9,198,635) |
| | වර්ෂය සඳහා අධාර ලැබීම් | 12,872,050 | 6,772,184 |
| | වසර අවසාන ශේෂය | **91,692,087** | **88,268,268** |
| 25 | **හිභය** | | |
| | වර්ෂය මුල ආරම්භක ශේෂය | **(60,544,231)** | **(63,815,812)** |
| | පසුගිය වසර සඳහා ගැලපුම් | (140,431) | (97,208) |
| | **නැවත ආරම්භක ශේෂය** | **(60,684,662)** | **(63,913,020)** |
| | ගිණුම් සඳහා ගැලපුම් | (707,192) | 71,006 |
| | වසර සඳහා අතිරික්තය/හිගය | (10,150,353) | 3,297,783 |
| | වසර අවසාන ශේෂය | **(71,542,207)** | **(60,544,231)** |

## ශිෂ්‍යත්ව සඳහා පැහැදිලි කිරීම්

### තාක්ෂණ සහයෝගිතාව යටතේ ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයෙන් ලද පරිත්‍යාග

අධිකාරිය ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ශ්‍රී ලංකාවේ පිහිටි කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකරමින් එයින් ලබා දෙන තාක්ෂණික සහයෝගිතාව ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික තාක්ෂණය දියුණු කිරීමට පියවර ගනී.

ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය මගින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති සඳහා ලබා දුන් විවිධ සම්පත් හා පාරිභෝගික ද්‍රව්‍ය අධිකාරියේ පොත් වල සටහන් කර ඇත.

2012 වසරේ ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය මගින් ලැබූ තාක්ෂණික සහයෝගිතාව පහත දැක්වේ.

| අංකය | ව්‍යාපෘති අංකය | ව්‍යාපෘති විස්තරය | ලබා දුන් අරමුදල් යූරෝ වලින් (€) | ලබා දුන් අරමුදල් ශ්‍රී ලංකා රුපියල් (දළ වශයෙන්) | ලැබූ උපකරණ හා පාරිභෝගික ද්‍රව්‍ය ශ්‍රී ලංකා රුපියල් වලින් |
|---|---|---|---|---|---|
| 01 | | විකිරණ ශීලී ආපදාවන් සඳහා ජාතික හැකියාවන් වර්ධනය | 168,029 | 27,724,800 | 9,449,079 |
| 02 | 1/007 | ප්‍රතීතනය කරන ලද නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානයක් මගින් නිර්විනාශක පරීක්ෂණ සවිමත් කිරීම | 67,866 | 11,197,890 | 2,394,447 |
| 03 | 0/010 | ජාතික පර්යේෂණ මධ්‍යස්ථානයේ විකිරණ ආරක්ෂණය හා න්‍යෂ්ටික හැකියාවන් දියුණු කිරීම | 61,035 | 10,070,775 | pending |
| 04 | 5/043 | ආහාර සංරක්ෂණය, වෛද්‍ය උපකරණ ජීවානුහරණය හා පළතුරු නිරෝධායනයට ගැමා යන්ත්‍රාගාරයක් ස්ථාපනය | 48,097 | 7,936,005 | pending |
| 05 | ------- | අන්තර් කලාපීය ව්‍යාපෘති /පර්යේෂණ ව්‍යාපෘති | 10,000 | 1,650,000 | 1099131 |
| | | **Total** | **355,027** | **58,579,470** | **12,942,657** |

ඉහත සඳහන් කරුණු වලට අමතරව ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ආධාර ලබාගෙන අධිකාරිය පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් දියත් කරන ලද අතර අධිකාරියේ සේවකයන් හා අනෙකුත් ආයතන වල සේවකයන් පුහුණු කිරීම් ද සිදු කරන ලදී.

ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ආධාර ලබාගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ජාතික ව්‍යාපෘති වැය ලෙස පහත සඳහන් දායකත්වයන් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට ලබා දෙන ලදී.

1. නිත්‍ය වැය ආයකත්වය ලෙස රුපියල් මිලියන 8.4 ක් විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලබා දෙන ලදී

2. තක්සේරු කරන ලද ව්‍යාපෘති වැය හා ජාතික සහාභාගීත්ව වැය ලෙස ශ්‍රී ලංකා රුපියල් මිලියන 6 ක් මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලදී.

**ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ උපකරණ පරිත්‍යාග ඇතුලත්ව විගණන හා වට්ටෝරු ලේඛණ**

විවිධ තාක්ෂණ ව්‍යාපෘති සදහා අධිකාරිය හරහා රාජ්‍ය ආයතන වලට ලබා දෙන ලද උපකරණ අධිකාරියේ වත්කම් ලෙස එහි පොත් හා ගිණුම් වල සටහන් කොට ඇත. පසුගිය වසර කිහිපය තුල මෙම කරුණ මෙසේ සිදු වී ඇත.

2009 වසරේ දි අධ්‍යක්ෂ මණ්ඩලය මෙම කරුණ ගැන සලකා බලා මෙම උපකරණ අධිකාරියේ ලේඛන වලින් ඉවත් කොට අදාල ආයතන වලට ඒවා ලබා දීමට අනු කමිටුවක් පත් කරන ලදී. මෙම කමිටුවට උපදේශකයකු ද පත්කරන ලදි.

මෙම අනු කමිටුව එම ආයතන වලට අයත් උපකරන හදුනාගත් අතර ඒවා අදාල ආයතන වලට රාජකාරිමය ආකාරයට ලබා දීමට පියවර ගත් අතර ඒ වන විටත් එම උපකරණ අදාල ආයතන වල රදවා තිබුණි.

අධ්‍යක්ෂ මණ්ඩලය ස්ථිර වශයෙන් එම ආයතන වල එම උපකරණ පවතින බවට ස්ථිර කිරීමට සිහි කැදවීම් යවන ලදි. ආයතන 3ක් (රබර් පර්යේෂණ ආයතනය, පිළිකා රෝහල හා න්‍යෂ්ටික වෛද්‍ය ඒකකය- ජාතික රෝහල කොළඹ ) මෙම සිහි කැදවීම් වලට පිළිතුරු එවා ඇත. අදාල උපකරණ ඇති බව ස්ථිර කල පසු එම උපකරණ පිළිබද අවශ්‍ය ගැලපුම් සිදුකරන ලදි.

**දේපල පිරියත හා උපකරණ තක්සේරු කිරීම**

පළමු පියවර ලෙස LKAS 16 ට අනුකූල වන ලෙස දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය ආරම්භ කරන ලදි.ක්රියාත්මක තත්වයේ පවතින නමුත් WDV 0 වන විද්‍යාත්මක උපකරණ වල ලේඛනයක් තක්සේරු දෙපාර්තමේන්තුවට යවන ලදි. LKAS 16 ට අනුකූල වන ලෙස අනෙකුත් උපකරණ නැවත තක්සේරු කිරීමට ඒවායේ ලේඛනයක් යථාකාලයේ දී පිළියෙල කරන ලදි.

**<u>අදාල හෙළි කිරීම්</u>**

මූල්‍ය වාර්තා වල අදාල පාර්ශව වල හෝ පාර්ශව වල ගණුදෙනු දැකිය නොහැක.

**<u>අනෙකුත් දීර්ග කාලීන වත්කම්</u>**

ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයෙන් බහු කාර්ය ගැමා ව්‍යාපෘතිය යටතේ පරිත්‍යාගයන් ලෙස ලැබුණු ලැබුණු විද්‍යාත්මක උපකරණ (වටිනාකමරු. 9,417,746/-) ශේෂ පත්‍රයේ දීර්ග කාලීන වත්කම් ලෙස දක්වා ඇත.

**අධිකාරියේ දේපල අනෙකුත් ආයතන වලට ලබා දිම**

**අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අධිකාරියට අයත් ප්‍රයෝජනයට නොගන්නා වර්ග අඩි 400 ක් සීමාසහිත පොලිප්ටෝ ලංකා ආයතනයට වසරකට කුලියට දීමට තීරණය කලේය. මෙම ආයතනය විදූලි බල හා බල ශක්ති අමාත්‍යාංශය යටතේ ගැසට් කරන ලද ආයතනයකි.**

<u>2012 වසර අවසාන භාගයේ දී සම්පූර්ණ නොකල ගණුදෙණු</u>

පහත සඳහන් උපකරණ 2012 දෙසැම්බර් මාසයේ දී ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ලද අරමුදල් වලින් මිලදී ගැනීමට අයදුම් කරන ලදි. නමුත් එම අවශ්‍ය මුදල් නොලැබුණි. මේ නිසා පහත සඳහන් මුදල් 2013 ප්‍රාග්ධන අරමුදලින් පියවීමට සිදුවනු ඇත.

| Date | PO No | Item | Amount Rs. |
|---|---|---|---|
| 21.12.2012 | 2467 | Reinforced Detection Meter/Cover Meter | 1,094,240 |
| 21.12.2012 | 2469 | Pile Integrity Tester | 2,234,400 |
| 21.12.2012 | 2470 | Pile Echo Tester | 1,545,600 |
| 21.12.2012 | 2471 | Moisture Meter for Concrete Testing | 397,600 |
| 21.12.2012 | 2472 | Impact Echo Tester | 3,091,200 |
| 21.12.2012 | 2473 | Corrosion Analysis Detector | 2,044,000 |
| 21.12.2012 | 2476 | Flowed specimen kit for NDT | 2,478,560 |
| 21.12.2012 | 2468 | Pull off Tester | 741,400 |
| 21.12.2012 | 2474 | Ultrasonic Pulse velocity with oscilloscope | 1,291,752 |
| 21.12.2012 | 2475 | Schmidt Hammer | 662,166 |
| | | **Total** | **15,580,918** |

2012 වසරේ දී NCNDT ව්‍යාපෘතියේ බිල්පත් ගෙවීම සඳහා අවශ්‍ය වූ අරමුදල් භාණ්ඩාගාරයෙන් නොලැබුණි.

| Date | Bill | Contractor | Amount Rs. |
|---|---|---|---|
| 10.01.2013 | No.04 | Sri Lanka Land Reclamation & Development Corp. | 6,859,817.82 |
| 22.01.2013 | No.05 | Sri Lanka Land Reclamation & Development Corp. | 5,861,345.34 |
| | | Total | **12,721,163.16** |

09.11.2012 දිනැති 226/2012 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව ඉහත කී මුදල් අධිකාරියේ ගිණුමට බැර කරන ලෙස ඉල්ලන ලදි.

**GTRI** ව්‍යාපෘතිය

ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉහතකී ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් (US$) 26750 භාවිතා කල නොහැකි න්‍යෂ්ටික ප්‍රභව දෙකක් (ගන්නොරුවේ උද්‍යාන භෝග දෙපාර්තමේන්තුවේ හා අධිකාරියේ තැම්පත් කර ඇති) අපහරණයට ලබා දෙන ලදි. මෙම අරමුදල් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ගිණුම් අංක 4201 තැම්පත් කරන ලදි 2012 වර්ෂයේ දි මෙම මුදලින් ඇමරිකානු ඩොලර් 26250 ක් වියදම් වූ අතර ඉතිරිය මෙම ප්‍රභවය ඉන්දියාවට යැවීමෙන් අනතුරුව ලැබෙනු ඇත එම කාර්යයෙන් අනතුරුව යම් මුදලක් ඉතිරි වුවහොත් අධිකාරිය මගින් සිදුකල වියදම් සඳහා හිලව් කරගනු ඇත.

**2012** හිඟය සඳහා කරුණු පැහැදිලි කිරීම

අධිකාරියේ මූලික ආදායම භාණ්ඩාගාරයේ පුනරාවර්තන ගිණුමෙන් ලැබෙන ආදායමයි. 2012 වසරේ භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන ගිණුමෙන් ලද ආදායම රුපියල් මිලියන 44.1කි. විදුලි බල හා බල ශක්ති ලේකම්තුමාගේ ඉල්ලිම පරිදි රුපියල් මිලියන 3.5 ක් අමාත්‍යාංශය වෙත නිත්‍ය අයවැය සඳහා මාරු කරන

ලදි.

මේ නිසා ඉතිරි පුනරාවර්තන ගිණුම, රුපියල් මිලියන 40.6 කි. අමාත්‍යාංශය විසින් අධිකාරියේ පුනරාවර්තන ගිණුම භාවිතා කරමින් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයෙන් ලබා ගන්නා ලද අධාර පියවිමට ඉඩ හරින ලදි.

පහත සඳහන් අත්මුදල් නොවන ගණුදෙනු ද ආදායම් වාර්තාවේ අන්තර්ගත වී ඇත.

- පාරිතොෂිත දිමනා සඳහා වෙන් කිරීම් රු.6,121,799
- බොල් ණය කරුවන් සඳහා වෙන් කිරීම් රු. 823,124
- භාවිතයට ගත නොහැකි තොග සඳහා වෙන් කිරීම් රු. 397,758

ඉහතින් සඳහන් කල අයිතම, හිඟයට ප්‍රධාන හේතු විය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. ඊඑච්/බී/ඒඊඒ/එෆ්ඒ/12    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2014 අප්‍රේල් 11 දින

සභාපති
පරමාණුක ශක්ති අධිකාරිය

**පරමාණුක ශක්ති අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

පරමාණුක ශක්ති අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 19 දරණ පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 32(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර මාගේ විස්තරාත්මක වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට පරමාණුක ශක්ති අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර)

වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා යොදාගත් මැනීමේ පදනම් ඓතිහාසික පිරිවැය ගැලපීම බව මූල්‍ය ප්‍රකාශන වල සටහන් මගින් හෙළිදරව් කර තිබුණද, අධිකාරිය විසින් ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර. 7 දේපල, පිරියත හා උපකරණ හි දක්වා ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනයට තීරණය කළ යුතු සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවූ ධාරණ අගය තහවුරු කර ගැනීම සඳහා

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද, අදාළ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කිරීමෙන් තොරව ඓතිහාසික පිරිවැය රු. මිලියන 103.44 ක්වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් අධිකාරිය විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ස්ථාවර වත්කම් ලේඛනය ප්‍රකාරව අධිකාරියේ වත්කම් ශේෂ ලෙජර් ගිණුම්වල අවසාන ශේෂයන්ගෙන් වෙනස්වන බව නිරීක්ෂණය වූ අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුළු වෙනස රු. 1,113,835 ක් විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ලෙජර් ගිණුම් අනුව ශේෂය | ස්ථාවර වත්කම් ලේඛනය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විද්‍යාත්මක උපකරණ | 89,372,171 | 90,203,890 | 831,719 |
| වෙනත් උපකරණ | 449,717 | 446,780 | 2,937 |
| කාර්යාල උපකරණ/ ලී බඩු | 9,673,112 | 9,393,933 | 279,179 |
| එකතුව | | | 1,113,835 |

### 2.2.3 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පවතින රු. 4,604,649 ක් වූ හිඟ ශේෂයන් සම්බන්ධයෙන් (බොල්ණය ප්‍රතිපාදනයට පෙර) අධිකාරිය විසින් සියළුම ණයගැතියන්ගෙන් සනාථ කිරීම් කැඳවා තිබුණද, සනාථ කිරීම් විගණනයට ලැබී නොතිබුණි.

(ආ) 2012දෙසැම්බර් 31දිනට ණයගැති කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| වර්ගය | එකතුව | වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 සිට 03 දක්වා | වර්ෂ 03 සිට 05 දක්වා | වර්ෂ 05 ට වැඩි |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| සාමාන්‍ය විද්‍යාත්මක උපකරණ | 1,309,939 | 486,696 | 155,966 | 65,595 | 601,682 |
| විකිරණ ආරක්ෂාව | 2,188,968 | 1,299,345 | 446,934 | 90,922 | 351,767 |
| නිර්විනාශක පරීක්ෂණ (Non-Destructive Testing) | 257,093 | 203,718 | 36,075 | - | 17,300 |
| නිර්විනාශක පරීක්ෂණ (Non-Destructive Testing) පුහුණු පාඨමාලා | 586,699 | 553,430 | - | 27,400 | 5,869 |
| ආහාර පරීක්ෂණ | 261,950 | 184,140 | 75,310 | - | 2,500 |
| එකතුව | **4,604,649** | **2,727,329** | **714,285** | **183,917** | **979,118** |

ඉහත කාල විශ්ලේෂණය අනුව, රු. 1,877,320ක මුදලක් වර්ෂ 1ට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණු අතර රාජ්‍ය අංශයේ ආයතන වලින් ලැබිය යුතු රු. 715,966 ක මුදලක් ඇතුළත් රු. 979,118 ක්වූ ශේෂ වර්ෂ 05කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

### 2.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 31 වගන්තියට අනුකූල වන පරිදි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් පත්කරන ලද උපදේශක කමිටුව 1999 වර්ෂයේ සිට රැස් වී නොතිබුණි. අධිකාරිය විසින් 2006 වර්ෂයේදී නව කමිටුවක් නම්කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම කමිටුව පත්කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

ප්‍රමාණවත් හා අදාළ සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ යටතේ දැක්වෙන රු. 867,552 ක් වූ විකිරණ පහසුකම් හා ක්‍රීඩා උපකරණ, විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ වැඩකටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 10,150,353 ක ඌනතාවයක්වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 3,297,783 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.13,448,136 ක පිරිහීමක් දැක්වුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම වැඩි වීමට වඩා මුළු වියදම වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සංයුක්ත සැලැස්ම අනුව, රටේ න්‍යෂ්ටික තාක්ෂණය සංවර්ධනය කිරීමේ අරමුණින් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියොජිතායතනයේ (IAEA) තාක්ෂණික සහයෝගීතා වැඩසටහන් (Technical Corporation Programmes) සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නාභි ලක්ෂය ලෙස පරමාණුක ශක්ති අධිකාරිය කටයුතු කෙරේ. ඒ අනුව රටවල්වල වැඩසටහන් රාමු (Country Programme Framework) සඳහා සම්බන්ධ වන විවිධ ව්‍යාපෘති සඳහා හෝ තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් යටතේ රටවල්වල වැඩසටහන් රාමුවක් නොමැති විට ජාත්‍යන්තර පරමාණුක ශක්ති අධිකාරිය එහි සාමාජික රටවල්වලට අරමුදල් සපයයි. කෙසේ වුවද, ජාත්‍යන්තර පරමාණුක ශක්ති අධිකාරිය අදාළ ග්‍රාහක ආයතනවලට හා ප්‍රතිපාර්ශවයන් (Counterparts) සම්බන්ධීකරණය සමඟ දෙනු ලැබූ කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට පරමාණුක ශක්ති අධිකාරියෙන් අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 සිට 2013 වර්ෂය දක්වා තාක්ෂණික සහයෝගීතා වැඩසටහන යටතේ එකී කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති 8 ක් සඳහා රු. මිලියන 58,579,470 කට සමාන යුරෝ 741,724 ක මුදලක් ප්‍රධාන මූල්‍යායනය ලෙස හා රු. 80,129,257 කට සමාන යුරෝ 1,014,584 ක මුදලක් පාදක සටහන් (foot note) මූල්‍යයනය ලෙස ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් අනුමත කර තිබුණි. විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, ඉහත අනුමත කරන ලද ව්‍යාපෘති 8 න් ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කිරීමට පරමාණුක ශක්ති අධිකාරිය තීරණය කරන ලද අතර ඉතිරි ව්‍යාපෘති 4 වෙනත් රජයේ ආයතනයක් මඟින් පහත පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.

| ව්‍යාපෘති අංකය | අනුමත කරන ලද ප්‍රධාන මූල්‍යයනය | | | පාදක සටහන් (Foot Note) මූල්‍යයනය | 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මූල්‍යයනය උපයෝජනය (2012 වර්ෂය සඳහා අනුමත කරන ලදී) | | ග්‍රාහක ආයතනය හා ප්‍රතිපාර්ශවයන් |
|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | එකතුව (2012/ 2013) | 2012/2013 | මුදල | ප්‍රතිශතය | |
| | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | % | |
| SRL/0/010 | 61,035 | 42,000 | 103,035 | 50,000 | 39,061 | 64 | පරමාණුක ශක්තිඅධිකාරිය |
| SRL/1/007 | 67,866 | 18,000 | 85,866 | 150,000 | 46,770 | 69 | පරමාණුක ශක්ති අධිකාරිය |
| SRL/2/008 | 62,000 | 47,000 | 109,000 | 80,875 | 43,262 | 70 | විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය, මොරටුව විශ්ව විද්‍යාලය, ලංකා විදුලි බල මණ්ඩලය |
| SRL/2/009 | 70,775 | 89,621 | 160,396 | - | 50,000 | 71 | පරමාණුක ශක්ති අධිකාරිය, පරිසර අමාත්‍යාංශය |
| SRL/5/043 | 48,097 | - | 48,097 | - | 21,196 | 44 | පරමාණුක ශක්ති අධිකාරිය, |
| SRL/5/044 | 35,460 | 38,150 | 73,610 | 133,709 | 24,212 | .68 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය, මැලේරියා මර්දන ව්‍යාපාරය |
| SRL/6/032 | 63,000 | 27,000 | 90,000 | 350,000 | 68,885 | 109 | මොරටුව විශ්ව විද්‍යාලය, යාපනය ශික්ෂණ රෝහල |
| SRL/6/033 | 26,810 | 44,910 | 71,720 | 250,000 | 14,493 | 54 | යාපනය ශික්ෂණ රෝහල |
| එකතුව | **435,043** | **306,681** | **741,724** | **1,014,584** | **307,879** | **71** | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂය සඳහා අනුමත කරන ලද යූරෝ 435,043 ක් වූ මුළු ප්‍රධාන මූල්‍යයනයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට යූරෝ 307,879 ක මුදලක් හෙවත් සියයට 71 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) 2012 සිට 2013 වර්ෂ සඳහා පාදක සටහන් මූල්‍යයනය ලෙස රු. 1,014,584 ක මුදලක් අනුමත කර තිබුණද, ප්‍රධාන මූල්‍යයනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් පරමාණුක ශක්ති අධිකාරියට හා වෙනත් ග්‍රාහක ආයතනවලට සහ ප්‍රතිපාර්ශවයන්ට පාදක සටහන් මූල්‍යයන පහසුකම්වලින් කිසිදු මුදලක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(iii) 2012 සිට 2013 දක්වා දෙවසරක කාලය සඳහා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා වැඩසටහන් ප්‍රකාරව සම්බන්ධීකරණ ග්‍රාහක ආයතන හා ප්‍රතිපාර්ශවයන් මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පරමාණුක ශක්ති අධිකාරිය විසින් විධිමත් පියවරයන් ගෙන ඇති බවට ප්‍රමාණවත් හා අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. අධිකාරියේ සභාපතිට අනුව, "ජාත්‍යන්තර අංශය ඉතා සීමිත කාර්ය මණ්ඩලයක් සහිතව කටයුතු කළ අතර ඉතා මෑතක් වනතුරු මානව සම්පත් පිළිබඳ සියළුම කරුණු එම අංශය විසින් සිදුකරන ලදී. එහි කාර්ය මණ්ඩලය යොදා ගැනීම මඟින් එම අංශයට කළ හැකි කාර්යයන්ට වඩා වැඩි ප්‍රමාණයක් ඉටු කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ඇගයීම හා සමාලෝචනය කිරීම සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 8 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපෘති ඇගයීම් කමිටුවක් පරමාණුක ශක්ති අධිකාරිය විසින් පත් කරන ලදී."

(iv) පවත්නා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය හේතුවෙන් නව ව්‍යාපෘති ලබා ගැනීමේ අවස්ථාවන් සඳහා බාධාවන් වී තිබුණි.

(ආ) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ විසින් පිළියෙල කරන ලද 2009 සිට 2011 වර්ෂය සඳහා තත්ත්ව වාර්තාවට අනුව, 2011 වර්ෂය අවසාන වන විට පහත සඳහන් ව්‍යාපෘති සම්පූර්ණ කළ යුතු විය. කෙසේවුවද කාර්යයන් ක්‍රියාත්මකකිරීමේ ප්‍රමාදය හේතුවෙන් පරමාණුක ශක්ති අධිකාරියට අපේක්ෂිත පරිදි එම අරමුදල් උපයෝජනය කළ නොහැකිව තිබුණි. ඉහත කාලපරිච්ඡේදය සඳහා අනුමත කරන ලද අරමුදල්වලින් 2013 ජුනි 30 දිනට අරමුදල් උපයෝජනයන් පහත පරිදි වේ.

| ව්‍යාපෘති අංකය | අනුමත කරන ලද ප්‍රධාන මූල්‍යයනය | | | | 2013 ජුනි 30 දිනට ප්‍රධාන මූල්‍යයනය උපයෝජනය කිරීම | | ග්‍රාහක ආයතන හා ප්‍රතිපාර්ශවයන් |
|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | එකතුව | මුදල | ප්‍රතිශතය | |
| | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | % | |
| SRL/9/009 | 92,600 | 173,275 | 45,000 | 310,875 | 370,708 | 119 | පරමාණුක ශක්ති අධිකාරිය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| SRL/8/020 | 82,900 | 87,155 | 66,300 | 236,355 | 7,770 | 3 | පරමාණුක ශක්ති අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය |
| SRL/6/031 | 145,400 | 103,500 | 35,975 | 284,875 | 213,720 | 75 | කැළණිය විශ්ව විද්‍යාලය |
| SRL/5/042 | 129,576 | 85,116 | 94,675 | 309,367 | 239,192 | 77 | කැළණිය විශ්ව විද්‍යාලය, මහනුවර පශු වෛද්‍ය පර්යේෂණායතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| SRL/8/019 | 207,715 | 245,115 | 120,000 | 572,830 | 240,930 | 42 | පරමාණුක ශක්ති අධිකාරිය |
| එකතුව | 658,191 | 694,161 | 361,950 | 1,714,302 | 1,072,320 | 63 | |

8

අධිකාරියේ සභාපතිට අනුව, "අධිකාරියේ පාලනයෙන් බැහැර වූ හේතූන් මත SRL/8/020 ව්‍යාපෘතිය අසාර්ථක විය. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ එකහත්වය සහිතව KOICA සහාය ලබාගැනීමට හැකිවේ යයි උපකල්පනය කර ව්‍යාපෘතිය ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට ඉදිරිපත් කරන ලදී. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය සඳහා අඩු ප්‍රමුඛත්වයක් නියම කර තිබූ අතර මධ්‍යම පරිසර අධිකාරියට හා මෙම අධිකාරියට KOICA තාක්ෂණ සහාය ලබාගැනීමට නොහැකි විය. මෙම කරුණු හේතුවෙන් ව්‍යාපෘතිය අසමත් වූ නමුත්, රජයේ පිරිවැය කොටස සහිත සංරචකයකින් ගැමා කැමරා (Gamma Camera) ප්‍රසම්පාදනය කිරීමට SRL/6/032 ව්‍යාපෘතියට සහය සැපයීම සඳහා ශ්‍රී ලංකාවට දැනටමත් අනුමත කර ඇති අරමුදල් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය උපයෝජනය කර ඇත."

(ඇ) පහත සඳහන් ව්‍යාපෘති 2008 වර්ෂය අවසානය වනවිට සම්පූර්ණ කළ යුතු වුවද දීර්ඝ ප්‍රමාදයක් සහිතව 2012 වර්ෂයේදී එම ව්‍යාපෘති සම්පූර්ණ කරඇති බව නිරීක්ෂණය විය.

| ව්‍යාපෘති අංකය | කාලපරිච්ඡේදය | මූල්‍ය අනුමැතිය | තථ්‍ය වියදම | 2013 ජූනි 30 දිනට අරමුදල් උපයෝජනයේ ප්‍රතිශතය | සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|---|---|
| | | යුරෝ | යුරෝ | | |
| SRL/6/030 | 2007 සිට 2008 | 190,680 | 160,984 | 84 | 2012 මැයි 22 |
| SRL/2/007 | 2007 සිට 2008 | 187,040 | 170,622 | 91 | 2012 දෙසැ 04 |

"අධිකාරියේ සභාපතිට අනුව, අධි ශිෂ්‍යත්ව ක්‍රියාවෙහි යෙදවීම හා විශේෂඥ දූත කණ්ඩායම සහ සුදුසු සාමාජික ආයතන සොයා ගැනීම දුෂ්කර වූ හෙයින් මෙම ව්‍යාපෘති ප්‍රමාද වී තිබුණි."

(ඈ) ජාතික සංවර්ධන ප්‍රශ්නවලට යොමු කිරීම සහ සමාජ ආර්ථික ඉලක්ක ඉටුකර ගැනීමට දායක වීම සඳහා න්‍යෂ්ටික ශිල්ප ක්‍රම උපයෝජනය කිරීමට ජාතික මට්ටමින් අවශ්‍ය විශේෂඥතාව හා න්‍යෂ්ටික පහසුකම් ග්‍රාහක සාමාජික රාජ්‍යයන්ට නොතිබීමේ පදනම මත ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් තාක්ෂණික සහයෝගීතාවය ලබාදෙනු ලැබේ. එබැවින් විශේෂඥතාවන්, හැකියාවන් හෝ යටිතලවල ඇති ඉතා හොඳින් හඳුනාගන්නා ලද ජාතික පරතරය පිරවීම සඳහා ව්‍යාපෘති සැලසුම් කළ යුතුය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ප්‍රදාන නියෝජිතායතන මඟින් සපයන ලද අරමුදල් ඵලදායී හා කාර්යක්ෂම ආකාරයෙන් (ක්‍රියාත්මක කිරීමේ රේටය සියයට 95 ක්) උපයෝජනය කිරීම ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය අපේක්ෂා කර තිබුණද, සමහර ව්‍යාපෘතිවල ක්‍රියාත්මක කිරීමේ රේටය ඉතා අඩු රේටයක් වූ බව නිරීක්ෂණය විය. එම ව්‍යාපෘතිවල ව්‍යාපෘති සැලසුම් හා කාර්ය සැලසුම් රටේ අවශ්‍යතාවයන් මත විධිමත්ව කේන්ද්‍ර ගත කර නොතිබුණු බවත් පැහැදිලි විය. එවැනි ව්‍යාපෘති කිහිපයක අසමත්වීම් අවස්ථා පහත දැක්වේ.

| ව්‍යාපෘති අංකය | අනුමත මූල්‍යයනය | | | | | | 2013 ජූනි 30 දිනට මුළු මූල්‍යයනය උපයෝජනය | | ග්‍රාහක ආයතන හා ප්‍රතිපාර්ශවයන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | එකතුව | මුදල | ප්‍රතිශතය | |
| | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | යූරෝ | | |
| SRL/5/040 | 74,100 | 143,495 | - | 69,395 | - | 286,990 | 57,450 | 20 | පොල් පර්යේෂණ ආයතනය |
| SRL/8/020 | - | - | 82,900 | 87,155 | 66,300 | 236,355 | 7,770 | 3 | පරමාණුක ශක්ති අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය |

## 4.2. මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විධිමත් දිරි දීමනා යෝජනා ක්‍රමයක් පිළියෙල කිරීමෙන් තොරව හා 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලවන පරිදි මහා භාණ්ඩාගාරයෙන් ඊට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා එහි සේවකයන්ට රු. 735,796 ක මුදලක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළ අතිකාල ගෙවීම් ලෙස රු. 1,172,351 ක මුදලක් ගෙවා තිබුණු අතර, අධිකාරියේ සේවකයින් එම කාල පරිච්ඡේදය සඳහාම දින 266 ½ ක නිලච් නිවාඩුද ලබා ගෙන තිබුණි. 2013 මාර්තු 19 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම ක්‍රමය නැවැත්වීමට හා මේ සම්බන්ධයෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා දීමට තීරණය කරන ලදී.

## 4.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය විසින් රු. 9,417,746 ක් වටිනා වත්කම් (උපකරණ) "බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ පහසුකම" (Multi-Purpose Gamma Irradiation Facility) සඳහා අධිකාරිය මගින් 2010 මැයි 31 දින පරිත්‍යාග කර තිබුණි. කෙසේ වුවද, "බහුකාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය" (MGIF) එහි මෙහෙයුම් කටයුතු 2013 දෙසැම්බර් 31 වනවිටත් ආරම්භ කර නොතිබූ බැවින් එම වත්කම් නිෂ්කාර්යව තිබූ අතර, මෙම මුදල අධිකාරියේ වෙනත් දිගු කාලීන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2008 මැයි 26 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, රු. 397,758 ක් වටිනා ඇමෝනියා සල්ෆේට් යල් පැනගිතොගයක් පාසල්වලට හෝ කාර්මික තාක්ෂණ ආයතනයට (ITI) නිකුත් කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, එම තොගය 2013 අගෝස්තු 15, විගණන පරීක්ෂණ දිනය දක්වා නිෂ්කාර්යව පැවතුණි.

## 4.4 යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රසම්පාදනය කිරීම

යන්ත්‍රෝපකරණ හා උපකරණ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලට අනුව, පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) ඉම්පැක්ට් එකෝ ටෙස්ටර් (Impact Echo Tester) ප්‍රසම්පාදනය කිරීම

(i) ඉහළම ලංසුකරු තෝරාගෙන රු. 3,091,200 ක් වූ මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර, වලංගු හේතුවක් නොමැතිව අඩුම ලංසුකරු තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, තෝරා ගත් ලංසුකරු සමඟ සැසඳීමේදී පිරිවිතරයන්හි අවශ්‍යතාවයක් ලෙස සඳහන් කර තිබූ "නෝට්බුක් පරිගණකය හා බීසීඑන් කේබල් දෙක" යන වගන්තිය නොමැතිවීම පමණක් අඩුම ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම සඳහා බැහැර වීමට හේතු වී තිබුණි. එකී සමාගම විසින් ඉදිරිපත් කර තිබූ විස්තර සටහන අනුව, "වාර්තාවලට හා දත්ත විශ්ලේෂණය සඳහා දත්ත පහසුවෙන් පරිගණකයට අත්පතනය (Uploaded) වේ. "RS-232 Port" සහ "Windows" සමාන PC මෘදුකාංග මගින් දත්ත සන්නිවේදනය වේ. ඒ අනුව පද්ධතියේ ක්‍රියාකාරිත්වය සඳහා එම විෂයයන් ඉතා වැදගත් නොවන බව අනාවරණය විය.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 7.8.3 ප්‍රකාරව, ඉදිරිපත් කරන ලද භාණ්ඩ හා සේවා පිළිබඳ ක්‍රියාකාරිත්වය, තත්ත්වය හෝ බෙදා හැරීම පිළිබඳ බලපෑමක් නැති බැහැරවීම් සහ ගණනය කළ හැකි හා දී තිබූ වටිනාකම සැසඳීම සඳහා මිලට එකතු කළ හැකි හෝ මිලෙන් අඩු කළ හැකි බැහැරවීම් සුළු බැහැරවීම් ලෙස හඳුනාගත හැක.

ඒ අනුව නිරීක්ෂණය වූයේ,

- ලංසු ලියකියවිලිවල "නෝට්බුක් පරිගණකය හා බීසීඑන් කේබල් දෙක" ඉතා වැදගත් ලෙස හඳුනාගෙන තිබුණද, එම විෂයයන් සුළු බැහැරවීම් ලෙස හඳුනාගත යුතුව තිබීම.
- අඩුම ලංසුකරු ප්‍රතික්ෂේප කිරීමේ හේතුවෙන් අධිකාරිය දරන ලද පාඩුව රු. 771,690 ක් වීම.

- අධිකාරිය විසින් දරන ලද පාඩුව සැසඳීමේදී ඉහළ ධාරිතාවයෙන් යුත් "නෝට්බුක් පරිගණකයක් හා බීසීඑත් දෙකක්" ඉතා අඩු මිලකට වෙළඳ පොලෙන් මිලදී ගැනීමට හැකිව තිබීමයි.

(iii) මෙම උපකරණය අත්කර ගැනීම් අවස්ථාවේදී පරීක්ෂණයකට භාජනය කර නොතිබූ අතර, අත්කර ගැනීමෙන් මාස 06 කට පසුව තාක්ෂණික ශක්‍යතාවය හා මෙහෙයුම් හැකියාව පරීක්ෂා කර තිබුණි. කෙසේ වුවද එය පරීක්ෂා කිරීම සඳහා දක්ෂ නිලධාරියෙකු නොසිටි බැවින්, ඉන්දියාවෙන් විශේෂඥයෙකුට ආරාධනාකර පරීක්ෂණ කිහිපයක් සතුටුදායක ලෙස නිම කර ගෙන තිබුණි. එබැවින්, උපකරණ පිළිබඳ මෙහෙයුම් සම්බන්ධයෙන් පුහුණු අවශ්‍යතාවය සලකා බලා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(iv) මෙම උපකරණය 2013 සැප්තැම්බර් 30 දක්වා කිසිදු වාණිජ කාර්යයකට යොදා ගෙන නොතිබුණි.

(ආ) කොන්ක්‍රීට් පරීක්ෂාව සඳහා "මොයිශ්චර් මීටරයක් (Moisture Meter) " ප්‍රසම්පාදනය කිරීම

2012 වර්ෂය තුළදී "මොයිශ්චර් මීටරයක්" මිලදී ගැනීම වෙනුවෙන් කැඳවන ලද ලංසු සඳහා සැපයුම්කරුවන් තිදෙනෙකු පමණක් ප්‍රතිචාර දක්වා තිබුණි. ඉහළම ලංසුකරු තෝරාගෙන රු. 355,000 මිලකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර, අඩුම ලංසුව පිළිගත නොහැකි හේතූන් දක්වමින් ප්‍රතික්ෂේප කර තිබුණි.

අඩුම ලංසුව ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, අධිකාරිය විසින් දරන ලද පාඩුව රු. 123,875 ක් වූ අතර, එය අඩුම ලංසුවට වඩා සියයට 35 කින් වැඩි වී තිබුණි.

මෙම උපකරණය 2013 සැප්තැම්බර් 30 දක්වා කිසිදු වාණිජ කාර්යයකට යොදා ගෙන නොතිබුණි.

(ඇ) "පයිල් ඉන්ටැග්‍රිටි ටෙස්ටින් " උපකරණය (Pile Integrity Testing Equipment) සහ "පයිල් ඉකෝ ටෙස්ටර්"(Pile Eco Tester) ප්‍රසම්පාදනය කිරීම

"සෝනික් පයිල් ටෙස්ටින්" ක්‍රමය පදනම් කරගෙන පයිල් පරීක්ෂණ සඳහා ඉහත උපකරණ අධිකාරිය විසින් මිලදී ගෙන තිබුණි. උපකරණ දෙකම එකම අරමුණ සඳහා යොදා ගත හැකි වුවද, "පයිල් ඉකෝ ටෙස්ටර්" උපකරණයට වඩා "පයිල් ඉන්ටැග්‍රිටි ටෙස්ටින්" උපකරණය තාක්ෂණිකව උසස් උපකරණයකි. ඒ අනුව, "පයිල් ඉන්ටැග්‍රිටි ටෙස්ටින්" උපකරණය පමණක් ලබා ගැනීමෙන් අධිකාරියට පයිල් පරීක්ෂණ අරමුණ ඉටු කර ගත හැකිව තිබුණු බව අනාවරණය විය. එම නිසා අධිකාරිය විසින් "පයිල් ඉකෝ ටෙස්ටර්" උපකරණය මිලදී ගැනීම සඳහා දරන ලද රු. 1,545,600 ක වියදම නිෂ්ඵල වියදමක් ලෙස නිරීක්ෂණය විය. එසේම මෙම උපකරණය 2013 සැප්තැම්බර් 30 දක්වා කිසිදු වාණිජමය කාර්යයකට යොදා ගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

තාත්වික සේවක සංඛ්‍යා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මාණ්ඩලික ශ්‍රේණිවල 10 ක්, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල 10 ක් හා කණිෂ්ඨ ශ්‍රේණිවල 4 ක් වශයෙන් විවිධ සේවක වර්ගවල පුරප්පාඩු 24 ක් පැවතුණි. අධිකාරියේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | 2012 | |
|---|---|---|---|
| | | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
| මාණ්ඩලික ශ්‍රේණි | 62 | 52 | 10 |
| ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | 50 | 40 | 10 |
| කණිෂ්ඨ ශ්‍රේණි | 25 | 21 | 04 |
| එකතුව | 137 | 113 | 24 |

## 4.6 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනත සංශෝධනය කිරීම

2006 ජනවාරි 01 දිනැති අංක ඒයූටී/එම්යූඑල්ටී/අයිඒඊඒ/22 දරන ජාත්‍යන්තර පරමාණුක ශක්ති අධිකාරියේ ලිපිය මගින්, දැනට පවත්නා පනත එය ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදී ප්‍රමාණවත් වූ නමුත්, ප්‍රවර්ථන ජාත්‍යන්තර ආරක්ෂණ ප්‍රමිතීන් සහ සෞඛ්‍ය/ කෘෂිකර්ම හා වෙනත් ක්ෂේත්‍රවල විකිරණ තාක්ෂණයන් යොදා ගැනීම වැඩිවීම සැලකිල්ලට ගැනීමෙන් ඉහත පනත සංශෝධනය කිරීමට අවශ්‍ය බව, අධිකාරියට දන්වා තිබුණි. තවද, වර්තමාන පනත මගින් අධිකාරියේ නියාමනය සහ ප්‍රවර්ධනාත්මක කාර්යයන්හි සීමා වෙන් කිරීමක් කර නොමැති බැවින් යම් අයිතියක් පිළිබඳ ගැටුමක් ඇති වීම (Conflict of interest) වළක්වා ගැනීම සඳහා එම පනත සංශෝධනය කිරීම අවශ්‍ය වේ. වර්තමාන පනතේ දුර්වලතා සමාලෝචනය කිරීම සඳහා හා නව කෙටුම්පත් පනතක් පිළියෙල කිරීම සඳහා 2006 වර්ෂයේදී කමිටුවක් පත් කර තිබූ නමුත්, මෙම වාර්තාවේ දිනය දක්වා එම කාර්යය ඉටු කරගෙන නොතිබුණි.

## 4.7 අධිකාරිය ගොඩනැගිල්ලේ කොටසක් කුලියට දීම

අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ දෙවන මහලේ වර්ග අඩි 545 කින් යුත් කාමර තුනක් මාසිකව එක් වර්ග අඩියක් රු. 100 ක් වූ රේටයකට පුද්ගලික සමාගමකට අධිකාරිය විසින් කුලියට දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන තක්සේරුකරුගේ සේවය ලබා ගැනිමෙන් තොරව කුලිය තීරණය කර තිබුණි.

(ආ) ශ්‍රවණාගාරය, රථගාල භාවිතා කිරීම පිළිබඳ ගාස්තු තීරණය කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික විගණන වැඩසටහනෙන් බොහෝ ක්ෂේත්‍රයන් ආවරණය කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් පමණක් සමන්විත වූ බවත්, අතිරේක වැඩ ප්‍රමාණයක්ද මෙම නිලධාරියාට පවරා තිබූ බවත් තවදුරටත් නිරීක්ෂණය විය.

### 5.2 විගණන කමිටුව

විගණන කමිටුව විසින් ගන්නා ලද තීරණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිචාරයක් නොදක්වන අවස්ථා කිහිපයක්ද නිරීක්ෂණය විය.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

අධිකාරිය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට හා අයවැය ලේඛනයට අනුකූල නොවීය.

### 5.4 අයවැය පාලනය

අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ සැලකිය යුතු පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) දේපල, පිරියත හා උපකරණ
(ආ) ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු ශේෂ
(ඇ) නීති, රීති ආදියට අනුකූල වීම
(ඈ) ප්‍රසම්පාදනයන්
(ඉ) සම්පත් උපයෝජනය
(ඊ) මානව සම්පත් කළමනාකරණය
(උ) වත්කම් කළමනාකරණය
(ඌ) කාර්ය මණ්ඩලයට දිරිදීමනා ගෙවීම
(එ) අයවැය පාලනය

**එච්.ඒ.එස්.සමරවීර**
**විගණකාධිපති**

**1971 අංක 38 දරණ මූල්‍ය පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාරව පරමාණුක ශක්ති අධිකාරියේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවට අධිකාරියේ පිළිතුරු**

**2.2 අධිකාරියේ මූල්‍ය වාර්තා සම්බන්ධව විගණකාධිපතිවරයාගේ විමසීම් සඳහා පිළිතුරු**

**2.2.1 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ගණකාධිකරණ ප්‍රමිති (SLPSAS)**

හඳුනාගන්නා ලද නැවත තක්සේරු කළ යුතු විද්‍යාත්මක උපකරණ වල ලැයිස්තුවක් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදි. තක්සේරු දෙපාරතමේන්තුවේ නිළධාරීන් මෙම උපකරණ පරීක්ෂාවට අධිකාරියට පැමිණි අතර මෙම උපකරණ පහසුවෙන් හඳුනාගැනීමට අංක යොදන ලෙස දන්වන ලද අතර ඒ සඳහා පියවර ගන්නා ලදි.

**2.2.2 ගණකාධිකරණ දෝෂ**

(අ) ලෙජර් ගිණුම් හා ස්ථාවර වත්කම් ලේඛනය අතර වෙනස අතීත ශේෂ නිසා ඇති වූවකි. අදාල තොරතුරු නොමැති වීම නිසා මෙම ගිණුම් අතර වෙනස නිවැරදි කිරීමට නොහැකි වී ඇත. නමුත් පසු ගිය වසර කිහිපය තුල අදාල වෙනස අඩු කිරීමට හැකිවී ඇති අතර එසේ කර ඇත්තේ හඳුනා ගන්නා ලද තොරතුරු මත අදාල ගැලපීම් සිදුකිරීම මගිනි. අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව සුදුසු ගැලපීම් සිදුකොට මෙම වෙනස් කම් නිවැරදි කරනු ඇත.

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(a)** සියළුම ණයගැතියන්ට ඔවුන්ගේ ණය ශේෂයන් තහවුරු කර විගණකාධිපති වරයා වෙත දන්වන ලෙස ලිපියවා ඇත. ණය ගැතියන් වෙතින් ලැබුණ ප්‍රතිචාර ඉතා දුර්වල විය. කෙසේ වෙතත් සමහර ණය ගැතියන් විසින් ගෙවිය යුතු මුදල් ගෙවා ඇත.

**(b)**.2011.12.31 දිනට බැංකු ණය ගැතියන්ගේ තත්වය.

| බැංකු ණය ගැතියන් පිළිබඳ විශ්ලේෂණය | අයිතම | 2010.12.31 ට ශේෂය | 2010.12.31 ට ගෙවන ලද මුදල | ආපසු ලබාගත් ණය % | නොගෙවා පවතින ශේෂය |
|---|---|---|---|---|---|
| | වසරකට වඩා අඩු | 1,473,369 | 1,279,983.3 | 87% | 193,386 |
| | වසර 01-03 | 243,296 | 61,911 | 25% | 181,385 |
| | වසර 03-05 | 882,364 | 46,683 | 3.5% | 835,681 |
| | වසර 05ට වැඩි | 165,724 | 6,931 | 4.1% | 158,793 |

සේවය ලබා දීමට ප්‍රථම සේවා ගාස්තුව ලබා ගැනීමට පියවර ගෙන ඇත කෙසේ වෙතත් පුද්ගල විකිරණමිතික සේවාවේ දී විකිරණ සේවකයන් විකිරණ වලින් ආරක්ෂා කිරීම රෙගුලාසිමය අවශ්‍යතාවකි. මෙවැනි අවස්ථාක දී අධිකාරිය පසුව මුදල් ලබා ගන්නා පදනම මත සේවා සැපයීමට බැදී සිටී. නිර්විනාශක පරීක්ෂණ වලින් ලබා ගන්නා ආදායම එම කාර්ය අවසානයේ දී නිර්ණය කෙරේ. රු.100,000/= වඩා අඩු නිර්විනාශක සේවාවන් අත්තිකාරම් මුදල් නොමැතිව සිදු කිරීමටත් අනෙකුත් සේවාවන් මුළු මුදලින් 50%ක අත්තිකාරමක් ලබා ගැනීමෙන් අනතුරුව සිදු කිරීමටත් පියවර ගෙන ඇත.

**2.2.4 නීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට විරුද්ධව කටයුතු කිරීම.**

2014 මැයි මාසයේ දී ඉහත කී කරුණු ගැන සලකා බැලීමට උපදේශක කමිටුවක් පත් කිරීමට පියවර ගන්නා ලදි.

**2.2.5 විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

විකිරණ පහසුකම හා සම්බන්ධව ප්‍රාග්ධන තොරතුරු සාවද්‍ය ආකාරයට වාර්තා ගත වී ඇති බැවින් 2013 දී මෙම ශේෂ කපා හැරීමට පියවර ගන්නා ලදි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිපල**

පිළිගන්නා ලදි. මෙම මූල්‍ය පසුබෑමට හේතුව 2012 වසරේදී පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි වීමෙන් වියදම් වැඩි වීමයි.

- පර්යේෂණාගාර පාරිභෝගික ද්‍රව්‍ය
- විද්‍යාත්මක උපකරණ වල සේවා හා අළුත්වැඩියාව

**4. ක්‍රියාකාරී සමාලෝචනය**

4. **ක්‍රියාත්මක සමාලෝචනය,**

4.1ක්‍රියාත්මක වීම, ((a), (i),(ii), (iii)

ක්‍රියාත්මක වීමේ දී ඇතිවූ දුර්වලතා හා ජාතික ව්‍යාපෘති සම්බන්ධීකාරක දායකත්වය අඩු වූ නිසා ජාත්‍යන්තර පරමාණුක ශක්ති ආයතනයෙන් ලබා දෙන ලද ආධාර නියමිත කාලසීමාව තුල භාවිතා කිරීමට නොහැකි විය.

ව්‍යාපෘතිය සැලසුම්කිරීමේ දී මෙවන් අඩු ලුහුඩු ඇති වීම අඩුකිරීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණයට කණ්ඩායමක් පත් කිරීමට යෝජනා විය .

ජාතික තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මෙවන් කණ්ඩායමක් ලබාදෙන උපදේශ හා එහිදී පෙන්වා දෙන දුර්වලතා මඟ හරවා ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත. තවද මෙමගින් පාද සටහන් A ( Foot note A)□□□ සඳහා අවශ්‍ය වන ආධාර රජයෙන් කලින් ලබා ගැනීමෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කල හැක.

(iv)

නව තාක්ෂණික සහයෝගීතා චක්‍රය යටතේ ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය නව ව්‍යාපෘති 5ක් සඳහා තාක්ෂණික සහාය ලබා දෙනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ ව්‍යාපෘති සකස් කිරීමට නව කමිටුවක් පත් කොට එමගින් ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය (ජ.ප.ශ.නි) ආධාර ලබා ගැනීමට සුදුසු ජාතික තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති හඳුනා ගැනීමට තීරණය කරන ලදී.

(b) (c)

සම්පූර්ණ නොකරන ලද සංඝටක සහිත ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට පියවර ගන්නා ලද අතර දැනටමත් සටහනෙන් දක්වා ඇති ව්‍යාපෘති වල ප්‍රගති සමාලෝචන වාර්තා ජ.ප.ශ.නියෝජිතායතනයට යවා එම ව්‍යාපෘති අවසන් කිරීමට පියවර ගෙන ඇත.

(d)

පරමාණු ශක්ති අධිකාරිය ජාතික සංවර්ධන ප්‍රශ්න සදහා අවශ්‍ය පියවර ගෙන ඇත. ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරය ජාතික නිර්විනාශක පරීක්ෂණාගාරය යෝජිත න්‍යෂ්ටික කෘෂිකර්ම මධ්‍යස්ථානය, යෝජිත ජාතික සාගර පාරිසරික දූෂණ පාලනය සදහා කේන්ද්‍රස්ථානය යනු ස්ථාපිත හා අනාගතයේ දී ස්ථාපනයට බලාපොරොත්තු වන මධ්‍යස්ථානයි

ව්‍යාපෘතියක් 100% ක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි බව කරුණාවෙන් සලකන්න. කෙසේ වෙතත් අධිකාරිය ව්‍යාපෘතියක් සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහය දරයි.

**4.2 සැහීමකට පත්විය නොහැකි ගණුදෙණු.**

**(a)** අධිකාරිය දිරි ගැන්වීමේ දීමනා ගෙවා ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතවය.

**(b)** විගණන කමිටුවේ තීරණය අනුව අතිකාල හා හිලව් නිවාඩු පිළිබදව මීට පෙර අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය නවතා දැමීමට පියවර ගෙන ඇත.

**4.3 භාවිතා නොකරන හා සීමිත භාවිත සහිත වත්තම්**

**(a)** ජ.ප.ශ.නියෝජිතායතනයෙන් මැයි 2010 දී පරිත්‍යාග කරන ලද රු. 9417746 වටිනාකමක් සහිත වත්කම්

ජ.ප.ශ.නියෝජිතායතනයෙන් පරිත්‍යාග කරන ලද මෙම වත්කම 2010.05.10 දින අධිකාරියට ලැබුණි. මෙම වත්කම් අධිකාරිය මගින් හොදින් නඩත්තු කරන ලදි. මේවා දැනට ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ තැම්පත් කර ඇති අතර දැන් උපරිම ආකාරයට භාවිතා වේ. මේවා එහි ක්‍රියාකාරකම් සදහා යොදා ගැනේ. 2014 ජනවාරි මාසයේ සිට අප්‍රියෙල් දක්වා මෙමගින් රු 14 mm ආදායමක් උපයන ලදි.

**(b)** මෙම ද්‍රව්‍ය **N -15** (නයිට්‍රජන් -15) පොහොර ලෙස යොදා ගන්නා ලදී මෙම පොහොර වල කාර්යක්ෂමතාව පරීක්ෂා කරන ලදී. තවද මෙම පොහොර සාම්පලයක් වියනාහි පිහිටි ජා.ප.ශ.නියෝජිතායතනයට යැවීමට පියවර ගන්නා ලදි.

**4.4 යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම**

4.4(a) කොන්ක්‍රීට් පරීක්ෂණ සදහා “ඉම්පැක්ට් එකෝ ටෙස්ටර්යක්” ලබාගැනීම-

මෙම උපකරණය හා එම තාක්ෂණය අධිකාරියට නව එකක් වන අතර අධිකාරියේ මේ පිළිබඳ දැනුමක් ඇති අය කිසිවකු නොමැත. කෙසේ වෙතත් නිර්විනාශක පරීක්ෂණ ජාතික මධ්‍යස්ථානය ස්ථාපනය කළ විට මෙම උපකරණය යොදා ගෙන සේවා ලබා දීමේ අභියෝගයට අධිකාරිය මුහුණ දෙනු ඇත.
අධිකාරියේ මෙම උපකරණය හා ඒ හා සම්බන්ධ තාක්ෂණය පිළිබද දැනුමක් ඇති කිසිවෙකු නොමැති නිසා මෙම උපකරණය භාවිතාකරන අධිකාරියේ පුද්ගලයන් උපකරණය මිලදී ගැනීමේ දී එයට අයත් අනෙකුත් උපාංග (එයටම විශේෂ පරිගණකයක් හා ඊට අයත් මෘදු කාංග) හා තාංක්ෂණික දැනුම ලබා ගැනීමට තීරණය කලේ අධිකාරියේ සාමාන්‍ය විද්‍යාත්මක අංශයේ උපදේශ ගැන සලකා බැලීමෙන් අනතුරුවය.
මෙයට හේතු වූයේ විශේෂයෙන් මෙම උපකරණ වෙනවෙනම ගත හොත් අදාල උපකරණයේ ක්‍රියාකාරීත්වයට බාධා ඇතිවේ යැයැ විශ්වාසයක් තිබු බැවිනි.
මේනිසා උපකරණ පද්ධතියමමිලදී ගත් අතර සපයන්නා පසුව අදාල පුහුණුවද ලබා දෙන ලදී. වර්තමානයේ දී කොන්ක්‍රිට් පරීක්ෂණ කරන කණ්ඩායම මෙම උපකරණය භාවිතය පිළිබඳව මනාව දැනුවත් වී ඇති අතර දැනට අදාල සේවා ලබා දීමට ආරම්භ කර ඇත (අමුණා ඇති 1-A ලේඛණය ලබා දෙන සේවා පිළිබදවයි)

(i)
(ii)
(iii)
(iv)

උපකරණයේ සහතික කරන ලද තාක්ෂණික විශේෂාංග වලට අනුකූලව “නෝට් බුක් පරිගණකයක්” හා BCN කේබල් දෙකක් අත්‍යවශ්‍ය අයිතමයක් ලෙස (“C”) දක්වා ඇත.

මෙයට හේතුව තාක්ෂණික ඇගයුම් කමිටුව (TEC) හා උපකරණ භාවිතා කරන්නා මෙවන් උපකරණ මිලදී ගැනීමේ දී උපකරණයට ගැලපෙන්නා වූත් කොටස් විශේෂයෙන්ම මුද්‍රණ යන්ත්‍රයක් හා පරිගණක වෙනත් ස්ථානයකින් මිලදී ගත් විට උපකරණය භාවිතා කිරීමේ දී ප්‍රශ්න මතුවන බව අත්දැකීමෙන් දන්නා බැවිනි.

මේ නිසා මෙවන් අවස්ථාවලදී යම් සැපයුම් කරුවෙක් අදාල උපකරණයට ගැලපෙන උපාංග රහිතව ඔහුගේ ඉල්ලුම් පත්රය ඉදිරිපත් කර තිබුනොත් එය නොසැලකේ.

මේ නිසා නෝට් බුක් පරිගණකය රහිතව ලබා දෙන ලද මිල ගණන් ප්‍රතික්ෂේප කරන ලදි.

4.4. (b) කොන්ක්‍රීට් පරීක්ෂණ සදහා තෙතමන මාපකයක් මිලදී ගැනීම

පිළිගන්නා ලදී.මෙවන් වැරදි අනාගතයේ දී නැවත නැවත ඇතිවීම වැලැක්වීමට පියවර ගනු ඇත..

4.4 (C) pile Integrity Testing Equipment and pile Echo Tester මිලදී ගැනීම

උපකරණ දෙකම සමාන ක්‍රියා කාරකම් සදහා යොදා ගත හැකි වුවත් pile Integrity Testing Equipment ක්ෂේත්‍රයේදී යොදා ගැනීම පහසුය. pile Echo Tester විද්‍යාගාරයේ දී පාසැල් කාමරයේ ක්‍රියාකාරකම් හා ඉගැන්වීමේ කටයුතු සදහා යෝග්‍ය වේ.
යෝජිත ජාතික නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානය මගින් (NCNDT) ක්ෂේත්‍රයේ දී හා පරීක්ෂණාගාරයේ යන ස්ථාන දෙකේම සේවා ලබා දීමට බලාපොරොත්තු වන බැවින් මෙම උපකරණ දෙකම ඉල්ලුම් කරන ලදි.

එසේම එක උපකරණයක් ක්‍රියා විරහිත වූවිට අනෙක් උපකරණය අදාල සේවාව සදහා යොදා ගත හැක.

**4.5 මිනිස් සම්පත් කළමණාකරනය**

ජාතික නිර්විනාශක පරීක්ෂණ මධ්‍යස්ථානය (NCNDT) හා MGIF අතුළුව අධිකාරියේ අවශ්‍යතාවයන්ට අනුකූලව 2011 වර්ෂයේ දී නව තනතුරු නිර්මානය කරන ලදි.2012.12.31 දින විට පහත සදහන් පුරප්පාඩු පැවතිනි

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | විධායක ශ්‍රේණි | - 10 | - | විධායක අධ්‍යක්ෂ | - 01 |
| | | | | විද්‍යාත්මක නිළධාරීන් | - 09 |
| 2. | ලිපිකරු හා සමාන්තර සේවා | - 10 | - | කළමණාකරණ සහායක (MA -Non- Tech) | - 03 |
| | | | | තාක්ෂණ සහායක (MA-Tech.) | - 07 |
| 3. | සුළු සේවක ශ්‍රේණි | - 04 | - | රියදුරු | -01 |
| | | | | විද්‍යාගාර සහායක | -03 |

**1. අධ්‍යක්ෂ 01**

2012.07.01 වන විට අධ්‍යක්ෂ තනතුර හිස්ව තිබූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් (Board of Director) අංශප්‍රධාන - කාර්මික යෙදවුම් අංශය වැඩ බලන අධ්‍යක්ෂ ලෙස 2012.09.07 දින පත්කරන ලදි.මෙම තනතුර සදහා පුද්ගලයකු පත් කරන තුරු ඔහු මෙම තනතුරේ වැඩ බැලුවේය. මෙයට හේතුව පහත සඳහන්වේ.

බඳවා ගැනීමේ පටිපාටිය අනුව අභ්‍යන්තර නිළධාරියකු මෙම තනතුරට පත් කිරීම සඳහා අයදුම්පත්‍ර කැඳවීමට බාධාවක් තිබුණි. උදා. නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ තනතුරට පත්කළ හැකිව තිබුනේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ කෙනෙකු පමණි. ඒ නිසා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව 2012.12.17 දිනැති ලිපියට අනුකූලව මෙම බඳවා ගැනීමේ පටිපාටිය වෙනස් කරන ලදි.ඒ අනුව එම තනතුර "ඉරිදා ඔබ්සර්වර්" හා "වාර මණ්ජරි" යන පුවත් පත් වල පළ කරනලදී. 2013.02.21 දින කලින් වැඩ බලන අධ්‍යක්ෂ ලෙස සේවය කළ ඩී.ජී. එල්. වික්‍රමනායක මහතා අධ්‍යක්ෂ තනතුරට පත්කරන ලදී.

**2. විද්‍යාත්මක නිළධාරී 09**

අධිකාරියේ විද්‍යාත්මක නිළධාරි 9ක් සඳහා ඇබැර්තු තිබුණි. මෙම තනතුරු කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2011.03.08-2011.05.13 යන ලිපි මගින් අනුමත විය. මේ වන විට නව බඳවා ගැනීමේ පටිපාටිය පිළිබඳව අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතිණ.මේ නිසා බඳවා ගැනීම සිදු නොකරන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය ලබා දුන් පසු අදාල බඳවා ගැනීම් සිදු කරන ලදී. 2012.මාර්තු මාසයේ දී තනතුරු 23ක් පුරවන ලදී. ඉන්පසු 2012වසරේ දී විද්‍යාත්මක නිළධාරීන් 3දෙනෙක් අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගියහ. 2012 අගෝස්තු මාසයේ මෙම ඇබැර්තු පළකරන ලදී. 2012.10.06 දින විභාගය පවත්වන ලදි. ( සුදුසුකම් සහිත අපේක්ෂකයන් 47 දෙනෙක් සඳහා ) 2012.11.05 දින සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර අපේක්ෂකයන් 8 දෙනෙක් තෝරා ගන්නා ලදී මේ බඳවා ගැනීම් සඳහා දෙසැම්බර් 2012 පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා ගන්නා ලද අතර 2013.01.01 දින විද්‍යාත්මක නිළධාරීන් 8 දෙනෙක් බඳවා ගන්නා ලදි.

**3. කලමණාකාර සහායක 03**

2012.08.03 දින බහු කාර්ය ගැමා ප්‍රවිකිරණ යන්ත්‍රාගාරයේ සේවය පිණිස තනතුරු 2ක් පුරවන ලදි. පරිපාලන අංශයේ එක සේවකයෙක් විශ්‍රාම ගත් නිසා කලමණාකාර සහායක තනතුරක පුරප්පාඩුවක් ඇතිවිය.2013.06.03 දින මෙම පුරප්පාඩුව පුරවන ලදි.

**4. තාක්ෂණ සහායක 07**

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයේ පුරප්පාඩු 03 ක් හා අධිකාරියේ විවිධ අංශ වල පුරප්පාඩු 04 ක් ඇතිවිය. තාක්ෂණ සහායකයන් බඳවා ගැනීමට පුවත්පත්වල දැන්වීම් පලකළත් අයදුම්පත් නොලැබුණි. මෙයට හේතුව NDT, NDES, HNDE, NVQ 6 හා තත්වය හා 5වන තත්වයට ඉහල අයදුම්කරුවන් සඳහා අධිකාරියෙන් ලබා දෙන ප්‍රතිලාභ ආකර්ෂණීය නොවීමයි. මෙබැවින් අධිකාරියට තෝරාගත හැකි වූයේ 5කට අඩු සංඛ්‍යාවකි.එමෙන්ම අධිකාරියට බැදුනු පසු ද අඩු වේතන නිසා ඔවුන් අස්වී යනු දැකිය හැක. 2012 අගෝස්තු මාසයේ දී ද පුවත්පත් දැන්වීම් පළකරන ලදී. අවශ්‍ය සුදුසු කම් සහිත අයදුම් කරුවන් 20 දෙනෙක් ඉල්ලුම් කර තිබුණි. 2012 09 .16 වන දින අපේක්ෂකයන් 05 දෙනෙකු විභාගයට පෙනී සිටියහ ඔක්තෝම්බර් 2012 දී ඇබැර්තු 4ක් පුරවන ලදී. 2013.02.08 වන දින නැවත පුවත්පත් දැන්වීමක් පළ කරන ලදී මෙහිදි තවත් ඇබැර්තු 07ක් පිරවීමට බලාපොරොත්ත් වූ අතර 2012 .06.03 දින බාහිර අයදුම්කරුවන් ගෙන් අයදුම්පත් කැඳවා සියළු ඇබැර්තු පුරවන ලදි.

**5. රියදුරු - 01**

2012.08.03 දින MGIF සඳහා මෙම තනතුර අනුමත විය. MGIF සඳහා කිසිම වාහනයක් මේ වන විට අනුමත වී නොතිබිණි. මෙම කාලපරිච්ඡේදයේ දී මහා භාණ්ඩාගාරයෙන් වාහනයක් ඉල්ලන ලදී මේ අනුව වාහනයක් කුලි පදනම මත ලබා ගැනීමට අනුමැතිය ලැබිණි. මේ සඳහා කිහිපවිටක් මිල ගණන් කැඳවන ලදී. රියදුරකු බඳවා ගැනීම පමා වූ අතර දැන් පුරප්පාඩුව පුරවා ඇත.

**6. පර්යේෂණාගාර සහායක -03**

මෙම තනතුරු 2012.08.03 දින අනුමත වූ අතර මෙම පුරප්පාඩු පිරවීමට පියවර ගනු ඇත. ශ්‍රී ලංකා ගැමා කේන්ද්‍රයේ (MGIF ) වාණිජ ක්‍රියාකාරීත්වය පමා වූ බැවින් යන්ත්‍රයට ප්‍රවිකිරණය සඳහා බඩු ඇතුලත් කිරීමට හා නැවත ඉවත් කිරීමට මිනිස් සම්පත් තාවකාලිකව ලබා දෙන සමාගමකින් කුලියට ලබා ගන්නා ලදි.

**4.6 1969 අංක 19 දරන පරමාණුක ශක්ති පනත යාවත්කාලීන කිරීම**

**මෙම කාර්ය පමා වීමට හේතු**

**ඉතිහාසය**

1) 2006 මෙම කර්තව්‍යය ආරම්භ වූ අතර මෙයට හේතු වූයේ 2005 අගෝස්තු 1-5 දක්වා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ (IAEA) විකිරණ ප්‍රභව වල යටිතල පහසුකම් ඇගයීමේ විශේෂඥ චාරිකාවයි. මෙම විශේෂඥ චාරිකාවේ දී අධිකාරිය නියාමන හා පරමාණුක ශක්ති මණ්ඩලය යන ස්වාධීන ඒකක දෙකකට බෙදන ලෙස නිර්දේශ විය. මෙම පළමුවෙන්ම පිළියෙල කරන ලද දළ පිටපත එකල ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර හෙබ වූ නිළධාරියා විසින් රටවල් කිහිපයක පරණ පණත් වලට අනුකූලව තාක්ෂණික පුද්ගලයන් ගේ සහාය නොමැතිව ඉදිරිපත් කරන ලදි. මසකට පසු මෙය ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට ඉදිරිපත් කරන ලද අතර එම ආයතනය පනත නැවත සකසන ලෙස දන්වන ලදී.

2.) 2011 දී එම කර්තව්‍ය නැවත පටන් ගන්නා ලද අතර මෙම කාර්ය නීති පිටපත් කිරීමේ දෙපාර්තමේන්තුවේ සේවය කොට විශ්‍රාම ගිය සෙනවිරත්න නම් ජ්‍යෙෂ්ඨ නිතිඥවරිය විසින් සිදුකෙරිණි. ඇය මෙහිදි යොදාගත්තේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ විසින් නිර්මානය කළ පනතයි.මේ සඳහා 1969 අංක 19 දරණ පරමාණුක ශක්ති අධිකාරි පණතේ අන්තර්ගතයත් ප්‍රයෝජනයට ගන්නා ලදි. මෙය ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ ජ්‍යෙෂ්ඨ නීති නිළධාරියා වන වර්ජ් මහතා, ඇටෝනි ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිළධාරීන් අධිකාරියේ ප්‍රධාන නිළධාරීන් හා මෙම පනත නිර්මානය කළ නිළධාරිණිය ඇතුළු නිළධාරින් වාද්දුවේ හෝටලයේ එක් දින වැඩමුළුවක දී සාකච්ඡාවකට භාජනය කරන ලදී. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ විශේෂඥයා විසින් මෙම පණතේ විශාල වශයෙන් වෙනස්කම් කිරීමට නිර්දේශ කරන ලදි. ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ “Hand Book on Nuclear Law” නම් ග්‍රන්ථයේ සමහර කොටස් අන්තර්ගත කරන ලෙසත් “Implementing Nuclear Law” හා “International Basic Safety Stanards115” යන පොත් වල අන්තර් ගත සමහර කොටස් ඇතුලත් කිරීමටත් මෙම විශේෂඥයා නිර්දේෂ කලේය. මෙම අදාල වෙනස්කම් සහිතව නැවත දල පිටපතක් පිළියෙල කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවක් පත් කරන ලදී. එහි එකල සිටි විධායක අධ්‍යක්ෂ ජේ.එම්.ඒ.සී.ජයසිංහ මහතා, ඩී.ජී.එල්. වික්‍රමනායක මහතා, එච්.එල්. අනිල් රංජිත් මහතා සහ ටී. එච්.එස්.ශාන්ත මහතා එම කමිටුවේ සාමාජිකයන් විය.ඉහත කී ක්‍රියාකාරකම් සිදු වූයේ අධිකාරිය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය හා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කාලයේ දීය.

මෙසේ පිළියෙල කරන ලද දළ පිටපත නීති කෙටුම්පත් කිරීමේ දෙපාර්තමේන්තුවේ අදාල නිතිඥයන් හා ඇටෝනි ජෙනරාල් දෙපාර්තමේන්තුවේ නිතිඥයකු විසින් සකසා අවසාන පිටපත 2013 වසරේ දී පළමු කාර්තුවේ දී තාක්ෂණ හා පර්යේෂණ පරමාණු ශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරියට ඉදිරිපත් කරන ලදි. එමගින් නීති කෙටුම්පත් කිරීමේ දෙපාර්තමේන්තුවට මෙය අවසන් අනුමැංතිය සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වුවත් ලේකම් තුමියගේ අදහස වූයේ මෙම කෙටුම්පත විශාල වශයෙන් සංශෝධනය කළ යුතු බවයි. ඒ අනුව අධිකාරියේ සභාපති හා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සමඟ රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය බව දන්වන ලදී ඒ අනුව අමාත්‍යාංශ ලේකම්තුමිය සමග පවත්වන ලද රැස්වීමේ දී අදාල දළ කෙටුම්පත සම්පූර්ණයෙන් ම සංශෝධනය කළ යුතු බවත් දක්ෂ නිති කෙටුම්පත් කරන්නෙකු ඒ සඳහා යොදා ගතයුතු බවත් තීරණය විය.මේ කාල පරිච්ඡේදයේ දී අධිකාරිය පැවතියේ තාක්ෂණ හා පර්යේෂණපරමාණු ශක්ති අමාත්‍යාංශය යටතේය.

වර්තමාන තත්වය

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ උපදෙස් හා සභාපති, අධ්‍යක්ෂ ජෙනරාල් අධ්‍යක්ෂ(විකිරණ ආරක්ෂණ හා නියාමන) ගේ එකගතාව මත අධිකාරියේ නව පනත කෙටුම්පත් කිරීමට ශ්‍රියංගනී ප්‍රනාන්දු මහත්මිය (අධිකරණ අමාත්‍යාංශයේ නිති උපදේශක - නීති කෙටුම්පත් කිරීමේ

දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගිය) වෙත භාර දෙන ලදි. මෙම පනත පිළිබඳ තාක්ෂණික සාකච්ඡා අදාල නිතිඥවරිය, අධ්‍යක්ෂ(විකිරණ ආරක්ෂණ) නියෝජ්‍ය අධ්‍යක්ෂ (විකිරණ ආරක්ෂණ) දින 15 කට වඩා පවත්වන ලදි. ප්‍රනාන්දු මහත්මිය ලබා දෙන ලද පිටපත අමාත්‍යාංශ ලේකම්තුමියගේ ප්‍රමුඛත්වයෙන් පැවති කමිටුවක් මගින් කිහිපවිටක් සාකච්ඡාකර අවසාන කෙටුම්පත පිළියෙල කරන ලදි. අවසාන කෙටුම්පත 2013.07.28 දින ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ නීති අංශයට යවන ලදී. 2013 අගෝස්තු අවසානයේ ශ්‍රී ලංකා කණ්ඩායම මෙම පනත සාකච්ඡා කිරීමට එතර යනු ඇත.

අමාත්‍යාංශ ලේකම්, පසන් ගුණසේන මහතා(අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) එච්.එල්. අනිල් රංජිත් මහතා (විකිරණ ආරක්ෂණ හා නියාමන) හා ශ්‍රියංගනී ප්‍රනාන්දු මහත්මිය (පනත කෙටුම්පත් කළ නිතීඥ) ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයේ නීති අංශයේ නීති නිළධාරී හමුවීමට 2013 අගෝස්තු 27-30 දක්වා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනයට එහි තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් යටතේ සංචාරයක නිරත විය. එයට හේතුව වූයේ එම පනතේ සමහර කොටස්වල ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය අත්සන් කල ගිවිසුම් අන්තර්ගත වන නිසාය.

මෙහිදී ජාත්‍යන්තර පරමාණුක ශක්ති නියෝජිතායතනය සමහර යෝජනා ඉදිරිපත් කළ අතර එම යෝජනා අතුලත් කර අවසාන කෙටුම්පත පිළියෙල කරන ලදී.

2013.11.04 දින අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට බාර දෙන ලදී.2014.03.12 වන දින නිති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් පනත අනුමත විය 2014 මාර්තු මස අවසාන භාගයේ දී අමාත්‍යාංශය විසින් කෙටුම්පත ඇටෝර්නි ජෙනරාල් දෙපාර්තමේන්තුවට භාර දෙන ලදි.

මේ අතර කෙටුම්පත සිංහල හා දෙමළ පරිවර්තන සඳහා භාර දෙන ලදී. පාර්ලිමේන්තුවේ අනුමැතිය සහිතව නව ආයතන දෙක ලගදීම බිහිකිරීමට බලාපොරොත්තුවේ.

### 4.7 අධිකාරියේ ගොඩනැගිල්ලෙන් කොටසක් කුලියට දීම

a) සහතික ලත් තක්සේරු කරන්නෙකු වෙතින් තක්සේරු වාර්තාවක් ලබාගැනීමට පියවර ගන්නා ලදී.

b) ශ්‍රවණාගාරය,රියගාල ආදිය භාවිතා කිරිමත් ඇතුලත්ව තක්සේරු වාර්තාව ලබා ගනු ඇත.විදුලිය, ජලය හා අතිකාල ඇතුලත්ව ප්‍රතිශතයකට අනුකූලව සීමාසහිත පොලිප්ටො ආයතනයෙන් ගෙවීම් ඉල්ලන ලදී .

### 5. වගකීම් හා යහපාලනය

**5.1** අභ්‍යන්තර විගණන අංශය සීමාසහිත කාර්ය මණ්ඩලයක් සහිතව රාජකාරි කළයුතුව ඇත. දෛනික කටයුතු වලට අමතරව සභාපතිවරයා විශේෂ රාජකාරි ද පවරයි. මේ සමාලොචිත වසර සඳහා වාර්ෂික විගණන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පමා වීම් සිදුවිය.

කෙසේ වෙතත් අධිකාරියේ ක්‍රියාකාරීත්වය වැඩිවීමත් සමග කළමණාකාර සහායක තනතුරක් සඳහා, (අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය සහිතව) කළමණාකරන සේවා මණ්ඩලයෙන් ඉල්ලීමක් කර ඇත. ඊට අමතරව අභ්‍යන්තර විගණන නිළධාරියකුගේ තනතුරක් සඳහා ද ඉල්ලුම්කර ඇත( පරමාණුක ශක්ති මණ්ඩලය සඳහා)

### 5.2 විගණන කමිටුව

විගණන කමිටු වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර ඒ සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනතුරුව ක්‍රියාත්මක කෙරේ.

### 5.3මිලදී ගැනීමේ සැලැස්ම

පරමාණුක ශක්ති අධිකාරිය මිලදී ගැනීමේ සැලැස්මත් හා ක්‍රියාකාරී සැලැස්ම අදාල චක්‍රලේඛ හා අනෙකුත් රාජ්‍ය මගපෙන්වීම් වලට අනුකූලව අදාල කාලපරිච්ඡේදයන්ට අනුව පිළියෙල කෙරේ. මෙම සැලැස්ම දෙක එකිනෙකට ස්වාධීන වන ලෙස පිළියෙල කෙරේ. කෙසේ වෙතත් මිලදී ගැනීමේ සැලැස්ම හා ප්‍රාග්ධන අයවැය ක්‍රියාකාරී සැලැස්ම සමග එකට ක්‍රියාත්මක වන ලෙස පිළියෙල කර ඇත.

භාණ්ඩ මිලදී ගැනිමේ දී ඇතිවන සමහර දුෂ්කරතා නිසා ප්‍රාග්ධන අයවැය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට අපහසු වී ඇත. ක්‍රියාකාරී සැලැස්ම වරින්වර සමාලෝචනය කිරීමටත් මිලදී ගැනීමේ සැලැස්ම , (අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය සහිතව) හා ප්‍රාග්ධන අයවැය ඒ අනුව සංශෝධනය කිරීමටත් පියවර ගනු ඇත.

ඉහත කී දුර්වලතා මගහැරීමට මිලදී ගැනීමේ සැලැස්මක් ක්‍රියාකාරී සැලැස්මත් ප්‍රාග්ධන අයවැයට අනුකූලව ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත.

### 5.4 අයවැය පාලනය

2012 වසරේදී තත්‍ය අයවැය පාලනය ක්‍රියාත්මක කිරීමට උපරිම උත්සාහය ගන්නා ලදි. වෙනස්කම් පෙනුන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අවශ්‍ය සංශෝධන සිදුකරන ලදි.

## 6 පද්ධති හා පාලන

වාර්තාවේ දක්වා ඇති දුර්වල පද්ධති හා පාලන වැලැක්වීමට පහත සදහන් ක්‍රියාවලිය අනුගමනය කරන ලදී

**(a)දේපල යන්ත්‍ර හා උපකරණ**

- අදාල ආයතන වලට භාර දී ඇති විද්‍යාත්මක උපකරණ රාජකාරීමය ආකාරයට භාර දී අධිකාරියේ ලේඛන වලින් ඉවත් කිරීමට කටයුතු යොදන ලදි.
- ලෙජර් ශේෂය හා අදාල වත්කම් ලේඛණය අතර වෙනස සෙවීම පටන් ගන්නා ලදි. මෙම කටයුත්ත දිගමටම සිදුකරනු ඇත.

**(b)** ණයගැතියෝ හා වෙනත් ලැබීම් **:**

පුද්ගල ණය ගිණුම් යාවත්කාලීන කරන ලදී.වෙළද සංවර්ධන ඒකකය ශක්තිමත් කිරීම මගින් ණය ගැතියෝ අඩු කිරීමට කටයුතු යොදනු ඇත.

**(c).** නීති රෙගුලාසි ආදියට අනුකූල වීම**:**

අධිකාරිය අදාල නීති රෙගුලාසි වලට විරුද්ධ නොවෙමින් සියළු නීති හා අනුමත කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර න්නා ලදී..

**(d)** මිලදී ගැනීම්

මෙම ක්‍රියාකාරීත්වයේ සාවද්‍යතා අධිකාරිය දැනටමත් නිරීක්ෂණය කර ඇත. එම නිසා මිලදී ගැනීමේ ක්‍රියාකාරකම් හා ජාතික මිල දී ගැනීමේ මගපෙන්වීම් අනුකූල වනසේ මිලදී ගැනීම් සිදුකිරීමටත් අදාල කාර්ය මණ්ඩලයට එම කර්තව්‍ය පිළිබඳව දැනුවත් කිරීමටත් ක්‍රියා කරනු ඇත.

**(e) සම්පත් භාවිතය**

දේපල යන්ත්‍ර හා උපකරණ අදාල සැලැස්මට අනුකූලව මිලදී ගැනීමටත් ඒවා අධිකාරියේ ක්‍රියාකාරකම් සඳහා පූර්ණ වශයෙන් යොදාගැනීමටත් එමගින් අධිකාරියේ දත්ත සපුරා ගැනීමටත් කටයුතු යොදනු

ඇත.

**(f) මිනිස් සම්පත් කළමණාකරණය**

බඳවා ගැනීමේ පටිපාටියට අනුකූල වන සේ අනුමත සේවකයන් බඳවා ගැනීමට කටයුතු යොදනු ඇත.

**(g) සම්පත් කළමණාකරණය**

සම්පත් නියමාකාරයෙන් නඩත්තු කිරීමටත් ඒවා නියමාකාරයට ආරක්ෂා කිරීමටත් පියවර ගනු ඇත.

**(h)දිරි දීමනා ගෙවීම**

මෙය අධිකාරියේ සේවකයන්ට ගෙවන ලද දිරි දීමනාවකි. මේ සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් පුනරාවර්තන ගිණුමේ ඇත. අධිකාරිය සෑම වර්ෂයකම ඉලක්ක ආදායමක් පණවන අතර සේවකයන් ගෙන් එම ඉලක්කය වර්ෂය තුල උපයන ලෙස ඉල්ලුම් කෙරේ. 2012 වසර සඳහා මේ ඉලක්කය රු. මිලියන 50 වන අතර ලබාගන්නා ලද ආදායම රු. මිලියන 57කි. මෙම ඉලක්කය සපුරන ලද බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ගෙවීම ලබා දීමට තීරණය කර ඇත. මෙම ගෙවීමට භාණ්ඩාගාරයේ මුදල් භාවිතා කිරීමක් සිදු නොවීය.

**(I)** අයවැය:

සෑම වසරකම තත්‍ය අයවැයක් පිළියෙල කිරීමට උපරිම උත්සහයක් ගනු ලැබේ. පහත සඳහන් හේතු නිසා වෙනස්කම් ඇති වේ.

- සැපයුම් කරුවන්, භාණ්ඩ/සේවා නියම කාලයේ දී ලබා දීමට අපොහොසත් වීම
- තක්සේරු වටිනාකම් වලට වඩා සැපයුම් කරුවන් ඉදිරිපත් කරන ලද මිල ගනන් වැඩි වීම.

……………………..

**සභාපති**

**පරමාණුක ශක්ති අධිකාරිය**